HARTI

26 NOV 2012

පාලන සහ ගිණුම් වාර්තාව
2011

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
අංක 114, විජේරාම මාවත,
කොළඹ 07.
2012 සැප්තැම්බර් 15

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

වාර්ෂික පාලන වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්

1972 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පාලක මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් ලේඛන මේ සමඟ ඉදිරිපත් කරමි.

1. වාර්ෂික පාලන වාර්තාව
2. ආදායම් සහ වියදම් විගණන වාර්තාව
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිරීක්ෂණ
5. විගණකාධිපති ගේ නිරීක්ෂණ සඳහා පිළිතුරු වාර්තාව

සභාපති
පාලක මණ්ඩල

පටුන

සංස්ථාපනය	iii
පාලක මණ්ඩලය	v
පාලක මණ්ඩල රැස්වීම්	vii
විගණන කළමනාකරණ කමිටුව	vii
විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	vii
සංක්ෂිප්තය	viii
වාර්ෂික ප්‍රගතිය 2011	01
කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය	08
කෘෂි සම්පත් කළමනාකරණ අංශය	16
පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය	25
අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය	36
මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය	51
අනෙකුත් ක්‍රියාකාරකම්	65
දත්ත සහ තොරතුරු කළමනාකරණ ඒකකය	71
පුස්තකාලය	74
ප්‍රකාශන ඒකකය	76
2011 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය/ස්වභාවය	78
කාර්ය මණ්ඩල සංවර්ධනය	81
ගිණුම්	85
විගණකාධිපතිගේ වාර්තාව	97
වාර්තාව 14(2C) පිළිතුරු වාර්තාව	108

සංස්ථාපනය

1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වසරේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවනු ලැබ ඇත. මූලික අවස්ථාවේ දී ආයතනය වෙත එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ ඥාණය සහ මූල්‍ය සහයෝගය ලැබුණි. නිල බලයෙන් පත්වන කෘෂිකර්ම අමාත්‍යංශයේ ස්ථිර ලේකම් පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් මෙම ආයතනය පාලනය කරයි. රටේ කෘෂි ක්ෂේත්‍රයේ සංවර්ධනයට මුල් වන ආයතනයන්ගේ නියෝජිතයන්ගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධානියා සහ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දරයි.

ආයතනයේ අරමුණු රාශියකි. රටේ සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන් ජාතික සහ ජාත්‍යන්තර ආයතන මඟින් කරනු ලබන ගොවි ජන ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩි දියුණු කිරීම, සහයෝගය දීම, දිරි ගැන්වීම සහ සහභාගීත්වය ලබා දීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අපේක්ෂාවයි. තවදුරටත්, ගොවි ජන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශයන් සැපයීම අරමුණු කරගෙන ආයතනය මඟින් පර්යේෂණ හා විමර්ශන කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. පර්යේෂණයන්ට අමතරව, ආයතනය මඟින් ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. සමස්ථයක් වශයෙන් ආයතනය ගොවිජන ගැටලු සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීමේ හා බෙදා හැරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ.
ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආයතනයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක පහත සඳහන් වෙයි.

දැක්ම

ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන සහ ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.

ඉලක්ක

1. දැනුම ජනනය සහ නියමිත වෙලාවට බෙදා හැරීම මඟින් ප්‍රතිපත්ති ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම.
2. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධන පාර්ශවකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
3. ක්‍රියාබද්ධ පර්යේෂණ තුළින් ග්‍රාමීය සංවර්ධන ආදර්ශයන් සැකසීම.
4. සැපයුම් ක්‍රියාවලිය තුළ සිටින පාර්ශවකරුවන් සඳහා වෙළෙඳපොළ බුද්ධි තොරතුරු සැපයීම.
5. ආයතනයේ සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම.

පාලක මණ්ඩලය

කේ. ඊ. කරුණාතිලක මහතා	- ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ පාලක මණ්ඩල සභාපති
නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතා	- අධ්‍යක්ෂ, හෙ.ගො.ප.පු. ආයතනය
පී. එල්. නන්දසිරි මහතා	- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
පී. එම්. ශාන්ති ප්‍රනාන්දු මහත්මිය	- අධ්‍යක්ෂ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
ඩී. සී. ඒ. ගුණවර්ධන මහතා	- අධ්‍යක්ෂ, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
පුෂ්පා රොද්‍රිගු මහත්මිය	- අධ්‍යක්ෂ ජනරාල්, ග්‍රාමීය ආර්ථික අංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (2010 දෙසැම්බර් 16 සිට 2011 අප්‍රේල් 21 දක්වා)
ජී. ඩී. ඩබ්. ජයවර්ධන මහතා	- අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා	- අතිරේක ලේකම්, (පරිපාලන හා මූල්‍ය) අධ්‍යාපන අමාත්‍යාංශය
ඩී.ඩී. ආරියරත්න මහතා	- වැඩ බලන අධ්‍යක්ෂ, (සැලසුම්) වාරි සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය (2011 අගෝස්තු සිට)
කේ. ඒ. යූ. එස්. ඉඹුලාන මහතා	- අතිරේක ලේකම්, වාරි සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය (2011 මැයි දක්වා)
ප්‍රියන්ත මායාදුන්න මහතා	- අතිරේක ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය
ආචාර්ය කේ. සමරසිංහ මහතා	- පීඨාධිපති, කෘෂි පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
කේ. එන්. මාන්කෝට්ටේ මහතා	- අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ආර්. පී. ආර්. රාජපක්ෂ මහතා	-	ඉඩම් කොමසාරිස් ජනරාල් (2011 අගෝස්තු සිට)
එස්. ඩී. ඒ. බී. බොරලැස්ස මහතා	-	ඉඩම් කොමසාරිස් ජනරාල් (2011 ජූලි දක්වා)
රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා	-	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ආචාර්ය ජී. ජී. ඒ. ගොඩලියද්ද මහතා	-	වාරි මාර්ග අධ්‍යක්ෂ ජනරාල්
පී. ඒ. ආනන්ද මහතා	-	වැඩබලන සමූපකාර සංවර්ධන කොමසාරිස් ජනරාල් (2011 අගෝස්තු සිට)
ඒ. අයි. පතිරණ මහත්මිය	-	වැඩබලන ලේකම්, පාලක මණ්ඩලය

පාලක මණ්ඩල රැස්වීම්

රැස්වීම් පැවැත් වූ දින	සහභාගි වූ සාමාජික සංඛ්‍යාව
1. 2011 මාර්තු 07	10
2. 2011 මැයි 26	09
3. 2011 අගෝස්තු 17	10
4. 2011 ඔක්තෝබර් 31	12
5. 2011 දෙසැම්බර් 22	10

විගණන කළමනාකරණ කමිටුව

ඩී. සී. ඒ. ගුණවර්ධන මහතා, සභාපති	-	අධ්‍යක්ෂ, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
පී. එල්. නන්දසිරි මහතා, සාමාජික	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
පී. එම්. ශාන්ති ප්‍රනාන්දු මහත්මිය,	-	අධ්‍යක්ෂ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්

රැස්වීම් පැවැත්වූ දින	සහභාගි වූ සාමාජිකයින් සංඛ්‍යාව
1. 2011 මාර්තු 25	03
2. 2011 මැයි 24	03
3. 2011 සැප්තැම්බර් 16	03
4. 2011 දෙසැම්බර් 05	03

සංක්ෂිප්තය

නිවැරදි තීරණ ගැනීමටත් වැඩදායී ප්‍රතිපත්තීන් හා වැඩසටහන් සැකසීමටත් පර්යේෂණ තුළින් පදනම සකසන බැවින් ආර්ථික සංවර්ධනයේ දී පර්යේෂණ කේන්ද්‍රීය ස්ථානයක් ගනු ලැබේ. ජාතික සංවර්ධනය සඳහා ගනු ලබන තීරණ කාලානුරූපී වූ සහ විශ්වාසවන්ත වූ තොරතුරු හා දත්තයන් ගේ සහයෙන් සිදු කළ යුතු ය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 1972 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සංවර්ධන ගැටළු විෂයයෙහි ප්‍රමුඛ සහායකයෙකු වශයෙන් පුළුල් වශයෙන් පිළිගත් ආයතනයකි. එය රජය සමඟින් මෙන් ම, සංවර්ධනයේ හවුල්කරුවන්, අධ්‍යාපන ආයතන, සිවිල් සංවිධාන, මාධ්‍ය හා පුද්ගලික අංශ සමඟින් ද සහයෝගීතාවයෙන් කටයුතු කරමින් සාඩම්බරයෙන් යුතු ව සිය සේවා සපයන ආයතනයකි. මෙම වසරෙහි ආයතනයේ පාලන හා ගිණුම් වාර්තාව මාගේ සේවා කාලය තුළ ඉදිරිපත් කරනු ලබන දෙවන ප්‍රගති වාර්තාවයි. මෙයට පෙර දැඩි අවධානයට ලක් නොවූ පුහුණු අංශය කෙරෙහි මෙම දෙවන සේවා වසර තුළ දී වැඩි අවධානයක් මා විසින් යොමු කරන ලදී. කෘෂිකර්ම ක්ෂේත්‍රයයෙහි මානව සම්පත් වල ධාරිතාවය වැඩි කිරීම එහි සංවර්ධනය උදෙසා වන පූර්ව අවශ්‍යතාවයකි. ඒ අනුව, 2011 වර්ෂය තුළ දී ගොවීන් 8000ක්, නිලධාරීන් 2000ක් ඇතුළු ව 17985ක් වූ පුද්ගලයන් සංඛ්‍යාවකට වැඩසටහන් 256ක් මඟින් පුහුණුව ලබා දෙනු ලැබීම ආයතන ඉතිහාසයෙහි පිහිට වූ වාර්තාවක් ලෙස දැක්විය හැකි ය.

2011 වර්ෂය තුළ සටහන් කරන ලද දෙවන වාර්තාව වන්නේ, ආයතනය මඟින් වැඩි දියුණු කරන ලද කෘෂි ගම්මාන සංවර්ධන ආකෘතිය ක්‍රියාවට නැංවීමයි. මෙම ආකෘතිය තුළින් යටිතල පහසුකම් වලින් ආරම්භ වී වෙළෙඳපොළෙන් අවසන් වන චක්‍රය ඉදිරිපත් කරනු ලබයි. යටිතල පහසුකම් වැඩි දියුණු වීම කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සපයන අතර වෙළෙඳපොළ පැවතීම කෘෂිකාර්මික කටයුතු සඳහා පෙළඹවීමට ඉවහල් වේ. 1. යටිතල පහසුකම් 2. යෙදවුම් 3. උපකාරක සේවා 4. නිෂ්පාදනය 5. සැකසීම සහ 6. වෙළෙඳපොළ යන කරුණු 06 මෙම ආකෘතියෙහි ප්‍රධාන අංග වේ. මේ සෑම අංගයකටම අනු අංග ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ භූමිය හා ශ්‍රමය යන සාධක දෙක හිඟ නොවන සාධක දෙකක් බැවින්, ඉතා හොඳින් සලකා බැලීමෙන් අනතුරුව එම අංග මෙහි ඇතුළත් නො කරන ලදී. වඩා වැදගත් වන්නේ, ඒවා කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස භාවිතයට යොදවා ගැනීමයි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ, ඉහත සඳහන් ප්‍රධාන සහ අනු අංගයන් ගෙන් පැන නඟින බාධක, දුෂ්කරතා මැඩපවත්වා ඒවායේ මටසිළුටු ක්‍රියාකාරීත්වයක් ඇති කිරීම යි. ගොවි ජනතාවට අතිරේක ආදායම් මාර්ග උත්පාදනය කරමින් කෘෂිකාර්මික සංවර්ධනය උත්තේජනය

කිරීමට සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, කර්මාන්ත හා සේවා යන බාහිර අංශයන් හතර දායකත්වය සපයනු ලබයි. කර්මාන්ත හා සේවා අංශයන් ගොවිපොළෙන් පිටත රැකියා අවස්ථා නිර්මාණය කිරීමට මං සලසනු ලබන අතර ව්‍යාපෘතීන්ගේ සාර්ථකත්වයට සහ සංවර්ධනයට ඉහත සඳහන් සියළුම අභ්‍යන්තර හා බාහිර වූ ප්‍රධාන සහ අනු අංශයන් සියල්ල කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පෙන්වා දිය හැකි ය. ඒ හා සමාන්තරව, ග්‍රාමීය ජනතාව ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු ය.

මෙම කෘෂි ගම්මාන සංවර්ධන ආකෘතිය ප්‍රායෝගිකව පරික්ෂා කිරීම සඳහා දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමී ව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෝණකුඹුක්වැව ඌන සංවර්ධිත ග්‍රාමය තෝරා ගැනුණි. කෘෂි ගම්මාන සංවර්ධන ආකෘතිය භාවිතයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ පර්යේෂණ මගින් අනාවරණය කර ගත් විවිධ නිර්දේශයන් ක්‍රියාවට පරිවර්තනය කිරීමට මෙහි දී උත්සාහ ගන්නා ලදී. ආරම්භයක් වශයෙන් ගැටළු හඳුනා ගැනීම සඳහා සහභාගීත්ව ගැමි පිවිසුම භාවිතා කරන ලද අතර එයට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. ග්‍රාමීය කුඩා වැව් පහක් ප්‍රතිසංස්කරණය කිරීම, ගොවිපොළ සඳහා මාර්ගයක් ඉදි කිරීම, වැසි ජල ටැංකි දහයක් ඉදි කිරීම, ස්වයං රැකියා බිහි කිරීමේ ව්‍යාපෘති ඇති කිරීම, ගෙවතු වගා ඒකක 138 ක් සංවර්ධනය කිරීම, පාසල් ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීම හා වන අලින්ගෙන් වන තර්ජනයට විසඳුමක් වශයෙන් තල් වැටක් ඉදි කිරීමට අවශ්‍ය පැල ලබා ගැනීම සඳහා තල් පැල තවාන් සකස් කිරීම 2011 වසරේ දී මෙහි සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් අතර විය.

2011 වසරේ දී තබන ලද තෙවන වාර්තාව නම්, ආයතනයෙහි අනිවාර්ය කාර්යයක් වූ වද මේ දක්වා ක්‍රියාවට නංවනු නො ලැබූ උපාධි සහ ඩිප්ලෝමා ප්‍රදානයට අවශ්‍ය පියවර ගැනීමයි. මේ යටතේ සංවිධාන කරමින් පවතින වැඩසටහන් දෙකක් නම්, රුහුණු සරසවියට අනුබද්ධිත කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සහ කැළණිය සරසවිය හා අනුබද්ධිත කෘෂිකාර්මික සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව වේ. 2011 වර්ෂය අවසාන වන විට මෙම පාඨමාලාවන් දෙකෙහිම පාඨමාලා අන්තර්ගතය කෙටුම්පත් කර අවසාන කරන ලදී.

2011 වර්ෂයේ දී ආයතනය මගින් සිදු කරන ලද පර්යේෂණ වල ප්‍රගතිය සලකා බැලීමේ දී ක්‍රියාකාරී පර්යේෂණ වැඩසටහන් දෙකක් ඇතුළුව පර්යේෂණ අධ්‍යයන 18ක් සිදු කරන ලද බව දැක්විය හැකි ය. ඉන් අධ්‍යයන 12ක් නිම කිරීමට මෙම වසර තුළ දී ආයතනය සමත් විය.

ක්‍රියාකාරී පර්යේෂණ වැඩසටහන් දෙක 2011 වසරේ දී ආරම්භ කරන ලද්දේ වුව ද තව දුරටත් සිදු කරගෙන යමින් පවතී. නිම නො කළ සියලුම පර්යේෂණයන්ගේ ප්‍රගතිය 80% ඉක්මවා ඇති බව පෙන්වා දිය හැකි ය. මෙම අධ්‍යයනයන් මෙසේ ප්‍රමාද වීමට හේතුව වන්නේ, වෙනත් විවිධ ආයතන මඟින් ඉල්ලා සිටිනු ලබන විශේෂ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ කාර්ය මණ්ඩල යෙදවීමට සිදු වීමයි. ජීව ඉන්ධන ඒකකයක් පිහිටුවීම හා කෝණකුඹුක්වැව ආදර්ශ ගම්මානය යන ක්‍රියාකාරී පර්යේෂණ දෙක 2012 වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක වීමට නියමිත ය. 2011 වර්ෂයේ දී විශේෂ අධ්‍යයන නවයක් ද සම්පූර්ණ කිරීමට ආයතනය සමත් විය. පොහොර සහ කෘෂි රසායනිකයන්ගේ අධි භාවිතය, එළවළු සහ පලතුරු ඇසිරීම සඳහා ප්ලාස්ටික් කූඩා භාවිතය සහ අර්තාපල් වෙළෙඳපොළෙහි වර්තමාන තත්ත්වය වැනි කාලීන මාතෘකාවන් පිළිබඳ සිදු කරන ලද අධ්‍යයන මේ අතර වේ. මෙම අධ්‍යයන නවයෙන් අටක්ම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දුන් අතර එක් වාර්තාවක් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට සපයන ලදී.

ජාත්‍යාන්තර සබඳතා අංශය සැලකීමේ දී ලෝක ආහාර වැඩසටහනේ පාර්ශවකරුවෙකු වශයෙන්, 2011 වර්ෂයේ දී ආයතනය දෙවන ආහාර සුරක්ෂිතතාව ඇගයීමේ සමීක්ෂණය සිදු කිරීමට සහය දෙන ලදී. මෙය ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර හා උතුරු මැද පළාත් ත්‍රිත්වය ආවරණය වන පරිදි සිදු කරන ලදී. 2011 වසරේ දී මෙම ආයතනය මඟින් ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ජාතික ආයතනය (NIRD) සඳහා අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී. මෙහි දී, පානීය ජල සම්පාදනය, දිය බෙත්ම කළමනාකරණය, ග්‍රාමීය මාර්ග සහ සමාජ සංවර්ධන ආකෘති වැනි ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් හි සාර්ථක භාවිතාවන් ආවරණය වන පරිදි ගවේෂණාත්මක සොයා බැලීමකට අවස්ථාව සලසන ලදී. එමෙන් ම, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා හා ශාන්තිකර කලාපීය මධ්‍යස්ථානයේ (CIRDAP) අනුබද්ධිත ආයතනයක් වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය ශ්‍රී ලංකාව ආශ්‍රිත පර්යේෂණ පත්‍රිකා 10ක් සපයමින් එම ආයතනය විසින් සකසන ලද ග්‍රාමීය සංවර්ධන වාර්තාව සඳහා ද දායකත්වය සපයන ලදී.

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර

අධ්‍යක්ෂ

වාර්ෂික ප්‍රගතිය 2011

2011 ජනවාරි 01 වැනි දින සිට 2011 දෙසැම්බර් 31 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ ආයතනයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය මෙහි දී සාකච්ඡාවට භාජනය කරනු ලැබේ. භෞතික ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ දී පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන වෙන වෙනම විග්‍රහ කොට ඇත. ඊට අමතරව, අදාළ කාල පරිච්ඡේදය තුළ දේශීය සහ ජාත්‍යන්තර සබඳතා වර්ධනය වූ ආකාරය විස්තර කෙරේ.

පර්යේෂණ ප්‍රගතිය

ප්‍රථම වරට පර්යේෂණ තුළින් ලබා ගත් දැනුම පදනම් කරගෙන කෘෂිකාර්මික සංවර්ධන ආකෘතියක් සකස් කොට දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෝණකුඹුක්වැව ග්‍රාම සේවා වසම තෝරාගෙන නියමු ව්‍යාපෘතියක් ලෙස 2011 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලදී. එම ආකෘතියට අනුව නිෂ්පාදන යෙදවුම්, නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිය යන අංශ හතරම කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සකස් කිරීමේ දී ඇතුළත් විය යුතු ය. එමෙන් ම, කෘෂිකාර්මික සංවර්ධනයට අමතරව ධීවර, පශු සම්පත්, ග්‍රාමීය කර්මාන්ත හා සේවා සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය (සටහන 01). නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පර්යේෂණ තුළින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ද හැකියාවක් ලැබුණි. ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ඇගයීමට ලක් විය.

සටහන-01

කෘෂි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය



2011 වර්ෂයේ නොවැම්බර් මාසයේ ආයතනයේ ආපන ශාලාවේ ඉවත දමන අපද්‍රව්‍ය පදනම් කරගෙන ජීව වායුව (Bio gas) නිපදවීමේ ව්‍යාපෘතියක් නියමු මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලදී. අපද්‍රව්‍ය ඉවත් කිරීම වර්තමානයේ ප්‍රධාන සාමාජයීය ගැටළුවක් බැවින් සහ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම රජයේ ප්‍රධාන ප්‍රතිපත්තියක් බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්රියාත්මක කිරීම තුළින් ආපන ශාලාව සඳහා මසකට ගෑස් සඳහා වැය වන රු.84,000ක මුදල ඉතිරි කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සාර්ථක වී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට කටයුතු යොදා ඇත.

ගොවිජන ක්ෂේත්‍රයේ පර්යේෂණ කරන ආයතනයක් වශයෙන් පර්යේෂකයින්, සමාජ විද්‍යාඥයින් වශයෙන් ක්ෂේත්‍රයේ රැඳී තොරතුරු රැස් කිරීම වැදගත් ය. ඒ අනුව, පර්යේෂණයන් හි ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා පර්යේෂණ කාර්ය මණ්ඩලය ක්ෂේත්‍රයට ගොස් නිරීක්ෂණ හා සාකච්ඡා මාර්ගයෙන් ගුණාත්මක තොරතුරු රැස් කිරීමට පොළඹවන ලදී. පර්යේෂණ නිලධාරීන්

ක්ෂේත්‍රයේ රැඳී සිටි කාලය ගණනය කිරීමේ නිර්ණායකයක් ද හඳුන්වා දෙන ලදී. මේ අනුව, ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා පර්යේෂකයින් ක්ෂේත්‍රය තුළ රැඳී සිටි කාලයෙහි සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා වී ඇත (සටහන-02). 2010 වර්ෂයේ ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා වැය කළ දින ගණන 2121 ක් වන අතර 2011 වර්ෂය වන විට එම ප්‍රමාණය 3784 දක්වා වැඩි වී ඇත.

2008 වසරේ ආයතනයේ පර්යේෂණ සංඛ්‍යාව 09 කට සීමා වූ අතර 2011 වසර වන විට එම ප්‍රමාණය 24 දක්වා වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත (සටහන-03).

සටහන-02



සටහන-03



අලෙවි තොරතුරු එක්රැස් කොට බෙදා හැරීමේ වැඩසටහනෙහි ඉදිරි පියවරක් වශයෙන් ජංගම දුරකථන හරහා එළවළු තොග මිල ගණන් ප්‍රචාරණය කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය හරහා 2011 වසරේ දී පරීක්ෂණ මට්ටමින් ආරම්භ කරන ලදී. මෙමඟින් දිවයිනේ ප්‍රධාන එළවළු තොග වෙළෙඳපොළවල් 08ක එළවළු වර්ග 23ක් සඳහා තොග මිල ගණන් දිනපතා මොබිටෙල් ජාලය තුළ 6666 අංකය හරහා ලබා ගත හැකි ය. මෙම වැඩසටහන තුළින් එළවළු ගොවීන් ගේ කේවල් කිරීමේ ශක්තිය වැඩි වී ඉහළ මිලක් ලබා ගැනීමට ත්, වෙළෙඳපොළ මිල උච්ඡාවචනයන් අඩු වී අලෙවි කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් හැකියාව ලැබේ. 2011 වර්ෂයේ ප්‍රංශයේ පැවැති G20 කණ්ඩායමේ සමුළුවට ජාත්‍යාන්තර සංවිධාන 09ක එකතුවෙන් ආහාර මිල උච්ඡාවචනයන් අවම කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා 10න් එකක් වූයේ ද කෘෂිකාර්මික අලෙවි තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම යි. එම යෝජනාව සමුළුව අනුමත කොට දැනට ක්‍රියාත්මක කරමින් පවතී. 2011 වර්ෂයේ පරීක්ෂණ මට්ටමින් ක්‍රියාත්මක වූ ජංගම දුරකථන හරහා මිල තොරතුරු ලබා දීමේ වැඩසටහන 2012 වර්ෂයේ පෙබරවාරි මාසයේ දැයට කිරුළ වැඩසටහනේ දී කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් නිල වශයෙන් විවෘත කිරීමට නියමිත ය.

එක් එක් පර්යේෂණය සඳහා පාදක වූ අරමුණු, පර්යේෂණ ක්‍රමවේදය, පර්යේෂණ සොයා ගැනීම් සහ නිර්දේශ පිළිබඳ විස්තර පර්යේෂණ අංශයන්ගේ ප්‍රගතිය යටතේ විස්තර කෙරේ.

පුහුණු

ආයතනයේ අඩු අවධානයක් යොමු වී තිබූ පුහුණු අංශය 2010 වර්ෂයේ සිට ශක්තිමත් කරන ලදී. ඒ අනුව, 2010 වර්ෂයේ පුහුණු වැඩසටහන් 10කට සහ පුහුණු ලාභීන් 300කට සීමා වූ ආයතනයේ පුහුණු කටයුතු 2011 වර්ෂය වන විට පුහුණු වැඩසටහන් 256ක් පවත්වා පුහුණු ලාභීන් 17 985ක් බිහිකර ඇත (සටහන්-04 සහ 05).

සටහන-04



සටහන-05



කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගොවි ජනතාව තුළ සංවිධාන නිපුණතා (Organizational skills) නිෂ්පාදන නිපුණතා (Production skills) මූල්‍ය කළමනාකරණ නිපුණතා (Financial management skills) සහ ව්‍යාපාර කුසලතා(Business skills) වර්ධනය කළ යුතු ය. වර්තමානයේ මෙම අංශ 04 අතුරින් ප්‍රමුඛතාවක් දී ඇත්තේ නිෂ්පාදන කුසලතා වර්ධනය කිරීමට ය. එසේ වුව ද, අනෙකුත් අංශ 03, ඒ හා සමානව වැදගත් වේ. එබැවින්, එහි අංශ ද නිෂ්පාදන කුසලතා වර්ධනයත් සමඟ ක්‍රියාත්මක කළ යුතු ය. එසේ නො කළහොත් අපේක්ෂිත අරමුණ කරා ළඟා විය නො හැක. මේ ගැන අවධානය යොමු කොට සංවිධාන, මූල්‍ය කළමනාකරණ සහ ව්‍යාපාර කුසලතා වර්ධනය කිරීම කෙරෙහි ආයතනයේ පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සංවිධානය කරන ලදී.

ප්‍රකාශන

2011 වර්ෂය වන විට එම ප්‍රමාණය 27 දක්වා වැඩි කිරීමට හැකියාව ලැබී ඇත (සටහන-06). එමෙන් ම සිංහල මාධ්‍යයෙන් පර්යේෂණ ප්‍රකාශන නිකුත් කිරීමේ ප්‍රමාණය ඉහළ දැමීමට කටයුතු කරන ලදී. තවද ප්‍රථම වරට දමිළ භාෂාවෙන් පර්යේෂණ නිකුත් කිරීම ද 2011 වසරේ දී ආරම්භ විය. ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයන්ට පමණක් සීමා වී තිබූ සතිපතා නිකුත් කරන ආහාර ද්‍රව්‍ය විවරණිකාව දමිළ මාධ්‍යයෙන් නිකුත් කිරීමට ද කටයුතු කරන ලදී. ආයතනයේ කාර්යභාරයන් පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණ ඇතිව සහ මාධ්‍යවේදීන් කෘෂිකාර්මික සංවර්ධනයට දායක කර ගැනීමේ අරමුණ ඇතිව සම්මන්ත්‍රණයක් 2011 ජූනි මාසයේ දී පවත්වන ලදී.

දේශීය සහ ජාත්‍යන්තර සබඳතා

ආයතනය පිහිටුවීමේ 1972 අංක 5 දරන පාර්ලිමේන්තු පනතෙහි දේශීය සහ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කොට ඇත. එමෙන් ම ඩිප්ලෝමා සහ උපාධි පිරිනැමීමට නෛතික බලය පවරා ඇතත් ආයතනය පිහිටුවා දශක හතරක කාලය තුළ මේ ගැන අවධානය යොමු කොට නැත. 2011 වසරේ රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සහය ඇතිව කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් ද කැලණිය විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන දෙපාර්තමේන්තුවේ සහයෙන් කෘෂි සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීමට ද සැළසුම් කොට තිබේ.

සටහන-06



එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන (WFP) සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී උතුරු හා නැගෙනහිර පළාත් වල ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සමීක්ෂණ 02ක් 2011 වසර තුළ පවත්වන ලදී. එමෙන් ම, මෙම කාල පරිච්ඡේදය තුළ එම ආයතනවල සහාය ඇතිව වැඩමුළු 02ක්ද ආයතනය තුළ පවත්වන ලදී. එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන සහ ආයතනය අතර සම්බන්ධතා වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජීප් රථයක් ද ආයතනයට ප්‍රදානය කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය

2010 වසරේ සිට ආයතනයේ ප්‍රගතිය සීඝ්‍ර ලෙස වර්ධනය කර ගැනීමට හැකි විය. සටහන 01ට අනුව 2010 වර්ෂයේ ආයතනයේ ඉපැයීම් රු.මිලි.9.27ක් වූ අතර 2011 වර්ෂයේ රු.මිලි.16.4කින්

එනම් 76.9% කින් ඉහළ ගොස් ඇත. සේවක ආකල්ප වර්ධනය, නේවාසික/සම්මන්ත්‍රණ පහසුකම් වැඩි කිරීම සහ ප්‍රචාරණය මෙම වැඩිවීමට හේතු සාධක වී ඇත.

එසේ වුව ද, සම්මන්ත්‍රණ සහ නේවාසික පහසුකම් වල භාවිතය තවමත් පහළ මට්ටමක පවතී. එය,

සම්මන්ත්‍රණ පහසුකම්	- 15% - 30% ක් සහ
නේවාසික පහසුකම්	- 45% - 55% වේ.

එම තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පහත ක්‍රමවේදයන් ඉදිරි 2012 වසර තුළ දී සිදු කිරීමට සැලසුම් කොට ඇත.

1. ප්‍රචාරණය වැඩිදියුණු කිරීම (විස්තර අඩංගු වෛවර්ණ අත්පොතක් නිර්මාණය කිරීම සහ මුද්‍රණය කිරීම සහ සියලුම පාරිභෝගිකයන්ට නව වසරේ සුභ පැතුම්පත් සහ ලිපි යොමු කිරීම, නව පාරිභෝගිකයන් හමුවීම.)
2. සපයනු ලබන සේවා අංගයන් වැඩිදියුණු කිරීම.
   - 2.1 කාමර පහසුකම් වැඩි දියුණු කිරීම.
   - 2.2 සේවා පහසුකම් වැඩි දියුණු කිරීම.
   - 2.3 සම්මන්ත්‍රණ සඳහා ආහාර පාන පිළිගන්වන සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම.

සටහන-07



කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

අවසන් කළ අධ්‍යයන

1. ගොවිජන බැංකු වැඩසටහන පිළිබඳ කාර්යය සාධන ඇගයීම්

පර්යේෂණ කණ්ඩායම:	ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතා	- සම්බන්ධීකාරක
	චතුර සෙව්වන්දි විජේතුංග මහත්මිය	- සම පර්යේෂිකා
	දිලූපා බමුණුආරච්චි මහත්මිය	- සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

ග්‍රාමීය සුළු ගොවීන්ගේ ඉතිරි කිරීම් නැම්යාව වර්ධනය කිරීම හා ආයෝජන ණය අවශ්‍යතා සැපිරීම අරමුණු කර ගනිමින් 1990 දශකයේ අග භාගයේ දී නියමු බැංකු ව්‍යාපෘතිය ස්ථාපිත කරනු ලැබිණි. ග්‍රාමීය ගොවි ණය අවශ්‍යතා සපුරාලීම සඳහා ගොවිජන බැංකුවෙහි ක්‍රියාකාරීත්වය කෙතරම් දුරට සමත් වී ඇත් ද යන්න විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. විශේෂිත අරමුණ වූයේ (i) ග්‍රාමීය ගොවි ජනතාව අතර කොටස් මිල දී ගැනීම හා ඉතුරුම් තැන්පතු සඳහා උනන්දු කරන ආයතනයක් ලෙසත්, ණය සැපයුම් ආයතනයක් ලෙසත් ගොවි බැංකුවෙහි ක්‍රියාකාරී ප්‍රගතිය විමසීම, (ii) එමගින් සේවා ලබා ගැනීම සඳහා ගොවීන් දක්වා ඇති දායකත්වයේ ප්‍රමාණය සොයා බැලීම, (iii) වගා ණය සීමාව, ද්‍රව්‍ය ණය ලබාදීම හා කණ්ඩායම් ණය ක්‍රමය පිළිබඳව ගොවීන්ගේ අදහස් හා යෝජනා විමසීම යි.

සොයා ගැනීම්:

1. බොහෝ ගොවීන් (80%ක් පමණ) ගොවි බැංකුවට බැඳී නොමැති අතර එයට හේතු වී ඇත්තේ එමගින් ලබාදෙන කෘෂි ණය ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම (30%), එහි සේවා හා ප්‍රතිලාභ පිළිබඳ අඩු දැනුම (28%) සහ ණය ලබාගැනීමට ඇති බිය (15%) ආදී කරුණු ය.

2. ඉතුරුම් මුදල් පහසුවෙන්, ඉක්මනින් හා මුදලින් ආපසු ලබා ගැනීමට නො හැකි වීම ගොවීන් මෙන් ම ගොවි සංවිධාන ද ඉතිරි කිරීම් සඳහා ඉදිරිපත් නොවීමට හේතු වී ඇත.

3. කුඹුරු අක්කරයක් වෙනුවෙන් දිය හැකි ණය ප්‍රමාණය වූ රු.5,000ත් ගොවියෙකු වෙනුවෙන් දිය හැකි වගා ණය ප්‍රමාණය වූ රු. 25,000ත් කාලීනව ප්‍රමාණවත් නොවන බව ගොවීන්ගේ මෙන් ම පර්යේෂකයින්ගේ ද අදහස විය.

4. ණය, ද්‍රව්‍ය වලින් ලබා දීම කෙරෙහි හුදෙකලා ගම්වල ගොවීන් තුළ ප්‍රසාදයක් පැවතිය ද, එසේ ලබාදෙන කෘෂි රසායන ආදියේ මිල පිටස්තර වෙළෙඳපොළ මිලට වඩා ඉහළ නිසා සැලකිය යුතු ගොවීන් පිරිසක් (47%) ඒ සඳහා අකමැති වූහ.

5. කුඩා කණ්ඩායම් හි ඇතැම් සාමාජිකයින් ණය නො ගෙවීම අන් සාමාජිකයින්ට ගැටළුවක් නිසා කණ්ඩායම් ක්‍රමය කෙරෙහි සැලකිය යුතු සාමාජිකයින් පිරිසක් (37%) අප්‍රසාදය දැක්වූ හ.

අධ්‍යයනයේ නිර්දේශ:

1. ගොවිජන බැංකුව හා එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කර එහි සාමාජිකත්වය වැඩි කිරීම

2. තැන්පතු ඉක්මනින් හා පහසුවෙන් ලබා ගැනීමටත් කොටසක් මුදලින් ලැබීමටත් අවස්ථාව සැලසීම

3. වගා ණය සීමාව බෝග හා ප්‍රදේශවලට ගැළපෙන පරිදි වැඩි කිරීම හා බිම් සැකසීම සඳහා ප්‍රමාණවත් මුදලක් (මුදලින්) ලබාදීම

4. ගොවි බැංකු සඳහා කෘෂි රසායන එකවර මිල දී ගැනීමෙන් ඉහළ කොමිස් ප්‍රමාණයක් ගොවීන්ට ලබාදීම

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනිය හරහා විකාශය වන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය: කුරුණෑගල දිස්ත්‍රික්කය

පර්යේෂණ කණ්ඩායම:	එම්.ඩී. සුසිලා ලූර්දු මහත්මිය	- සම්බන්ධිකාරිකා
	ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	- සම පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ජාතික රූපවාහිනී නාලිකාව හරහා විකාශනය වන කෘෂිකාර්මික වැඩසටහන් සඳහා වාර්ෂිකව විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කෙරේ. ඒ නිසා, මෙම අධ්‍යයනයෙන් එම වැඩසටහන් කෙතරම් ඵලදායී ද යන්න සොයා බැලිණි. එම වැඩසටහන් පිළිබඳ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ප්‍රතිචරය හා ඇගයීම හා ඒවා කෙතරම් ප්‍රමාණයක් ඵලදායී ද යන්න විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. විශේෂිත අරමුණු වූයේ (i) ගොවීන්ගෙන් කෙතරම් ප්‍රමාණයක් මෙම වැඩසටහන් නරඹන්නේ ද යන්න අධ්‍යයනය කිරීම, (ii) කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවීන්ගේ කැමැත්ත විමසා බැලීම, (iii) ඒවායින් ගොවීන් ලබාගත් දැනුම කෙතරම් දුරට උපයෝගී කර ගන්නේ ද යන්න අධ්‍යයනය කිරීම, (iv) ඒවා නැරඹීමේ දී, ගොවීන්ට පවතින බාධාවන් සොයා බැලීම සහ (v) වැඩසටහන් තවදුරටත් ඵලදායක කරගැනීම සඳහා ගොවීන්ගේ අදහස් විමසීම වේ.

සොයා ගැනීම්:

1. අධ්‍යයනයට මුහුණ දුන් සමස්ථ ගොවීන්ගෙන් (330) ජාතික රූපවාහිනී නාලිකාව 97% ක් නරඹන අතර එයින් (321) 75%ක් ම කෘෂිකාර්මික වැඩසටහන් නරඹති.

2. වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 86%ක් ඒ පිළිබඳ දැනුවත් වී ඇත්තේ අහම්බෙන් වන අතර අන් අය කෘ.ප.නි.ස හා අසල්වැසි ගොවීන්ගෙන් දැනුවත් වී ඇත.

3. නරඹන්නන්ගෙන් 33% "නිතරම" ද, 26%ක් "කලාතුරකින්" ද, 41%ක් "ඉඳහිට" ද වැඩසටහන් නරඹන බව අනාවරණය විය.

4. වැඩසටහන් හි භාෂා ශෛලිය , කාලීන භාවය, ඉදිරිපත් කිරීමේ ශෛලිය හා ඉදිරිපත් කරන්නාගේ ශෛලිය සුදුසු බවට ගොවීන්ගෙන් 80%ක් ප්‍රතිචාර දැක්වූ හ.

5. වැඩසටහන් "වඩාත් ප්‍රයෝජනවත්" යැයි 35%ක් ද "ප්‍රයෝජනවත්" යැයි 65%ක් ද සඳහන් කළ හ. ප්‍රයෝජනවත් යැයි කී පිරිසෙන් 88%ක් සඳහන් කළේ බෝග වගා කිරීමේ දී විවිධ වූ වගා ක්‍රමයන් අත්හදා බැලීමටත්, ක්‍රියාත්මක කිරීමටත් මෙම දැනුම ලැබීම හරහා හැකි වූ බව යි.

6. වඩාත් කාර්ය බහුල වේලාවන් හි විකාශය කිරීම, නැරඹීමට බාධාවක් බව 96%ක් පැවසූ හ.

7. වැඩසටහන් ඵලදායකවීමට නම් විකාශ කාලය රාත්‍රී 9.00 - 10.00 අතර විය යුතු බව ගොවීන්ගෙන් 98%ක් ද, විකාශ කාල පරාසය විනාඩි 15ට වඩා දීර්ඝ කළ යුතු බව 95%ක් ද සඳහන් කළ හ.

අධ්‍යයනයේ නිර්දේශ:

1. ගොවීන් කැමැත්ත දැක් වූ වේලාවෙහි (රාත්‍රී 9.00 -10.00) කෘෂිකාර්මික වැඩසටහන් විකාශය කිරීම

2. ඔවුන් ඉල්ලා සිටි පරිදි වැඩසටහන් විකාශ කාල පරාසය දීර්ඝ කිරීම

3. ඒවා විකාශ කාලයෙහි වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය අඩු කොට, කෘෂි දැනුම සන්නිවේදනයට ඇති බාධා අඩු කිරීම

4. ජාතික නාලිකාවේ කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම

5. ගොවීන් ආකර්ෂණය කරගත හැකි පරිදි අදාළ වැඩසටහන් හි අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීම

3. ශ්‍රී ලංකාවේ වර්ෂා පෝෂිත හා සුළු වාරි මාර්ග ආශ්‍රිත ගොවි සංවිධානවල කාර්ය සාධනය ඇගයීමේ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම: ආර්.එල්. එන්. ජයතිස්ස මහතා - සම්බන්ධීකාරක

කේ.පී.අයි. ප්‍රියදර්ශනී මහත්මිය - සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන 13,980ක් පමණ පිහිටුවා ඇති අතර එයින් වැඩි ප්‍රමාණයක් ඇත්තේ වර්ෂා පෝෂිත ප්‍රදේශවල ය. මෙයින් වැඩි ප්‍රමාණයක් කාර්යයන් කිහිපයක් පමණක් ඉටු කිරීමට සීමා වී ඇති අතර අපේක්ෂිත පුළුල් පරමාර්ථ ඉටු කිරීමක් දක්නට නැත. ගොවි සංවිධාන විවිධ ක්‍රියාකාරී මට්ටම් වල පැවැතීමට හේතු විමසා බලා ඒවායින් අපේක්ෂිත වඩාත් පුළුල් වූ අරමුණු සපුරා ගැනීම සඳහා ඒවා වඩා ක්‍රියාකාරී බවට පත් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමේ අපේක්ෂාවෙන් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ ගොවි සංවිධානවල කාර්ය සාධනය විමසා බැලීමට ය. විශේෂිත අරමුණු වූයේ (i) ක්‍රියාකාරී මට්ටම හා අරමුණු ඉටු කිරීම අනුව ගොවි සංවිධාන වර්ග කිරීම, (ii) ඒවා විවිධ කාර්ය සාධන මට්ටම් හි පැවතීමට හේතු විමසා බැලීම වේ.

සොයා ගැනීම්:

1. ගොවි සංවිධානවල කාර්ය සාධන මට්ටම විමසා බැලීම සඳහා භාවිතා කළ නිර්නායක වන සාමාන්‍ය රැස්වීම් පැවැත්වීම, පොත්පත් පවත්වාගෙන යාම, ඉතුරුම් වර්ධනය සඳහා

පෙළඹවීම හා ණය නිකුත් කිරීම වැනි සාධක අනුව, සංවිධානවලින් 36%ක් වඩාත් ක්‍රියාකාරී ද, 42%ක් අඩු ක්‍රියාකාරී ද, 22%ක් දුර්වල ක්‍රියාකාරී ද බැව් පැහැදිළි විය.

2. කැප වූ හා අවංක නායකත්වයක් ඇති බව, කාර්යයන් හි සහභාගීත්වය ලබා ගැනීමක් හා විනිවිද භාවයක් ඇති බව, සාමාජිකයන්ගේ කෘෂිකාර්මික මෙන් ම සුබ සාධන අවශ්‍යතා සැපිරීම සඳහා කැපවීම වැනි ලක්ෂණ වඩාත් ක්‍රියාකාරී සංවිධාන බිහිවීම සඳහා බලපා තිබේ.

3. පාරම්පරික ආකල්පයන්ගෙන් යුත් නායකත්වය, වඩාත් සේවා සැපයීම සඳහා ඔවුන්ගේ ඇති මන්දෝත්සාහීභාවය වැනි කරුණු ක්‍රියාකාරීත්වයෙන් අඩු සංවිධාන බිහිවීමට බලපා ඇත.

4. සුදුසුකම් නොමැති අය නායකත්වය දැරීම හා සාමාජිකයින්ට සංවිධානයේ කාර්යයන් පිළිබඳව අඩු අවබෝධයක් ඇති බව වැනි කරුණු දුර්වල සංවිධාන බිහි වීම සඳහා බලපා ඇත.

අධ්‍යයනයේ නිර්දේශ:

1. බලපෑම් වලින් තොරව ගොවි සංවිධානවල නායකත්වයට පත්වීමේ නිදහස් වාතාවරණයක් ඇති කිරීම.

2. ගොවි සංවිධානවල සාමාජිකයින්ට අදාළ පනත් මෙන් ම සංවිධානවලට ඇති නීතිමය බලතල පිළිබඳ අවබෝධය ලබාදීම හා නිලධාරීන්ට පොත්පත් නිසි ලෙස නඩත්තු කිරීමේ අවබෝධය ලබාදීම.

3. රජයේ කෘෂි අංශයේ සංවර්ධන ක්‍රියාවන්හි දී ගොවි සංවිධාන මාර්ගයෙන් ඒවා සිදු කිරීම.

4. ගොවි සංවිධාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන ඉල්ලීම් වලට යහපත් ප්‍රතිචාර දැක්විය යුතු අතර දෙපාර්තමේන්තුව පුළුල් සේවාවක් සලසන ගොවි සංවිධාන ඇගයීමට ලක් කළ යුතු ය.

දැනට ක්‍රියාත්මක අධ්‍යයන

1. විමධ්‍යගතකරණ භාවිතාව තුළ රජයේ ඉඩම් පාලනය: හම්බන්තොට දිස්ත්‍රික්කය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම: එම්.කේ.එන්. දමයන්ති මෙනවිය - සම්බන්ධීකාරක
ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර මහත්මිය - සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

මෙම අධ්‍යයනය හම්බන්තොට අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ඉල්ලුම් කරන ලදී. වර්තමානයේ රජයේ ඉඩම් පරිපාලනය සහ ඒ සම්බන්ධිත සේවා සැපයීමට ආයතන රාශියක් මෙන්ම අණ පනත් සහ චක්‍රලේඛ විශාල ප්‍රමාණයක් දායක වේ. තව ද, වර්තමානයේ රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම අවුල් සහගත සහ අකාර්යක්ෂම බවක් පෙන්නුම් කරනු ලබයි. මෙම අධ්‍යයනයෙන් ඉහත කී අවුල් සහගත බවට දායක වන හේතු සාධක මෙන් ම ඒ තුළින් සේවා ලාභීන්ට සිදු කරනු ලබන සමාජ-ආර්ථික බලපෑම හඳුනා ගැනීම අරමුණු විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් සභා, මහවැලි සහ අන්තර් පළාත් වාරිමාර්ග යෝජනා ක්‍රම ඇතුළත් වන සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7ක් (හම්බන්තොට, තංගල්ල, අම්බලන්තොට, වලස්මුල්ල, තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර සහ සූරියවැව) ආවරණය කරමින් ප්‍රශ්නාවලි, මූලික තොරතුරු සපයන්නන් සමඟ සිදු කෙරුණු සම්මුඛ සාකච්ඡා සහ විෂයයට අදාළව අනෙකුත් පුද්ගලයින් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මාර්ගයෙන් ක්ෂේත්‍රයේ අදාළ තොරතුරු සපයා ගන්නා ලදී. සේවාලාභීන් 450ක් සහ නිලධාරීන් 225ක් ඇතුළත් සම්පූර්ණ අධ්‍යයන ගහණය 675කි. රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම අවුල් සහගත වීමට බලපා ඇති සාධක සහ ඉන් සේවාලාභීන්ට ඇති කරන බලපෑම විමසමින් ඉඩම් සම්බන්ධිත සේවා සැපයීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ විය. විශේෂිත අරමුණු වූයේ (i) අවුල් සහගත ඉඩම් පරිපාලනය සහ සේවා සැපයීමට හේතු සාධක හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම, (ii) ඉඩම් සම්බන්ධිත සේවා ලබා ගැනීමේ දී සේවාලාභීන්

මුහුණු දෙන ගැටළු හඳුනා ගැනීම, (iii) සේවා සැපයීමේ ක්‍රමවේදය විසින් සේවා ලාභීන් වෙත ඇති කරනු ලබන සමාජ-ආර්ථික බලපෑම් ඇගයීම, (iv) කාර්යක්ෂම සහ ඵලදායී සේවා සැපයීමේ සහ ඉඩම් පරිපාලනය සඳහා ක්‍රමවේදයන් හඳුනා ගැනීම සහ ඉදිරිපත් කිරීම වේ.

සොයා ගැනීම්:

1. බොහෝ ඉඩම් ලාභීන් පසු අයිතිය නම් කිරීමට කටයුතු නො කිරීම නිසා ඔහු/ ඇයගේ ඇවෑමෙන් පවුලේ සාමාජිකයින් අතර ආරවුල් ඇතිවීමට හේතු සාධක වේ. එම නිසා නිලධාරීන් මෙන් ම සේවා ලාභීන් ද ඉඩම් සංවර්ධන ආඥා පනතේ උප ලේඛනය වර්තාමාන ගොවිජන සමාජයෙහි තත්ත්වයන්ට අනුකූලවන පරිදි වෙනස් විය යුතු බවට යෝජනා කරනු ලැබිණි.

2. ඉඩම් සම්බන්ධිත සේවා සැපයීමට අදාළ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොවීම නිසා දුෂ්කරතා මෙන් ම සේවා සැපයීම ප්‍රමාද වීම සිදු වේ.

3. සේවාලාභීන්ගෙන් අති බහුතරයක් මෙන් ම නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් ද (විශේෂයෙන් ම ග්‍රාම නිලධාරීන්) රජයේ ඉඩම් නීතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමකින් තොර බව අනාවරණය විය. ඉඩම් සම්බන්ධිත සේවා සැපයීමේ කාර්යය වඩාත් සංකීර්ණ වීමට එය ද දායක වේ.

කෘෂි සම්පත් කළමනාකරණ අංශය

කෘෂි සම්පත් කළමනාකරණ අංශය

අවසන් කළ අධ්‍යයන

1. කුඹුරු ඉඩම් කාලීන වශයෙන් විවිධාංගීකරණය කිරීම: බලපෑම් සහ ගැටලු

පර්යේෂණ සම්බන්ධීකරණය: පී. ආර්. වීරක්කොඩි මහත්මිය - පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

මෙම අධ්‍යයනයේ අරමුණු පහත පරිදි වේ.

1. කුඹුරු ඉඩම් කාලීන වශයෙන් විවිධාංගීකරණය කරන ආකාරය සහ එසේ විවිධාංගීකරණය කිරීම තීරණය කරනු ලබන සාධක හඳුනා ගැනීම.
2. විවිධාංගීකරණය කරන ලද විවිධ බෝග පද්ධතිවල නිෂ්පාදන වියදම හා ලාභදායීතාවය ගණනය කිරීම.
3. කුඹුරු ඉඩම්වල වී හැර අනෙකුත් බෝග වගා කිරීම කෙරෙහි ගොවීන් යොමුවීමේ දී ඔවුන් මුහුණ පාන ගැටළු හඳුනාගැනීම.
4. බෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා උචිත ප්‍රතිපත්ති හා උපායමාර්ග යෝජනා කිරීම.

හසලක අන්තර්-පළාත් ප්‍රදේශය හා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෙම අධ්‍යයනය දියත් කළ අතර එම අධ්‍යයනයේ දී බඩ ඉරිඟු, බීට්, අමු මිරිස්, මුං සහ රටකජු යන බෝග පද්ධති පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

සොයා ගැනීම්:

ජලය හිඟ තත්ත්වයන් යටතේ වී වගා කිරීමෙන් දැරීමට සිදුවන අවදානම කළමනාකරණය කළ යුතු මූලික තත්ත්වයන් යටතේ, ගොවීහු කුඹුරු ඉඩම් විවිධාංගීකරණයේ ගොවි පවුල්වල ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඉහළ ආදායම් ලබා දෙන අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා කැමැත්තක් දක්වා ඇත. මෙම ක්‍රියාවලියේ දී රාජ්‍ය හා පුද්ගලික ආයතන අතර පවතින විධිමත් එකඟතාවන් වැදගත් කාර්යභාරයක් ඉටු කොට ඇත. විවිධාංගීකරණයට ලක් වූ කුඹුරු ඉඩම් වැඩි වශයෙන් ආහාර බෝගවලින් සමන්විත වන අතර එක් එක් අධ්‍යයන ප්‍රදේශවලට ආවේණික වූ බෝග පද්ධති දක්නට ඇත. "සිම්සන්" විවිධත්ව දර්ශකයට අනුව, වෙනස් වූ විවිධත්ව දර්ශක අගයන් මඟින් පුළුල් වූ සමාජ-ආර්ථික තත්ත්ව, යටිතල පහසුකම්, ආයතනික හා තාක්ෂණික සාධක ගොවීන් විවිධාංගීකරණ ක්‍රියාවලිය සඳහා භාවිතා කොට ඇති ආකාරය පැහැදිළි කරයි. කුඩා ඉඩම් භාවිතය, අස්ථාවර අස්වනු මට්ටම් හා යෙදවුම් භාවිතයේ විශාල විචලතා මෙම විවිධාංගීකරණ ක්‍රියාවලියට ලාක්ෂණික වේ.

වී නොවන බෝග වගා කිරීම තුළින් වී වගා කිරීමට වඩා කිහිප වතාවක් ඉහළ ආදායම් ලබා ගතහැකි බව බෝග පද්ධතිවල ආර්ථිකමය දත්තවලින් පෙන්නුම් කරයි. මෙම සාපේක්ෂ ලාභදායිතාව බෝග විවිධාංගීකරණය පිළිබඳ වැදගත් තීරකයක් වී ඇත. බෝග විවිධාංගීකරණය රැකියා ජනනය කිරීම සඳහා ද ඉඩ ප්‍රස්ථා ලබා දී තිබේ. බෝග විවිධාංගීකරණය කිරීම තුළින්, ගොවි පවුල්වල ආහාර සුරක්ෂිතතාවට යම් අහිතකර බලපෑමක් ඇතිවී ඇත්ද යන්න පිළිබඳ කිසිදු සාක්ෂියක් නොමැති අතර එය ග්‍රාමීය ගෘහස්ථවල ආහාර හා පෝෂණමය සුරක්ෂිතතාව තහවුරු කරමින් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ වැය ශීර්ෂය අඩු කිරීමට දායක වී ඇත. ප්‍රමාණවත් තරම් බීජ සපයා ගත නො හැකිවීම, බීජවල ගුණාත්මක භාවය අඩුවීම හා බීජ හා කෘෂි රසායන මිල අධිකවීම, නිෂ්පාදන මිල අවිනිශ්චිතතාව, නිෂ්පාදන සඳහා සුදුසු වෙළෙඳපොළ නොමැතිවීම, ජල ප්‍රභවයන්ගේ ධාරිතාව සීමා සහිත වීම, රෝග පළිබෝධ ආසාදන හා වන ජීවීන්ගෙන් ඇතිවන හානි, නව තාක්ෂණය සීමා සහිත ලෙස භාවිතය හා අස්වනු නෙළන කාලසීමාව තුළ ආනයනික ආහාර ද්‍රව්‍ය වෙළෙඳපොළ තුළ පැවතීම යන කරුණු බෝග විවිධාංගීකරණයේ බාධක ලෙස හඳුනාගත හැකි ය.

එබැවින්, දේශීය බීජ නිෂ්පාදන වැඩසටහන් ශක්තිමත් කිරීම හා පුළුල් කිරීම, කෘෂි නිෂ්පාදන සැකසුම් ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවල අලෙවිසැල් වැඩි දියුණු කිරීම, ග්‍රාමීය කෘෂි අංශයේ මූලික යටිතල පහසුකම් ප්‍රකෘතිමත් කිරීම, අධික වියදම් දැරිය යුතු

පළිබෝධනාශක භාවිතය අවම කිරීම සඳහා සුදුසු කෘෂි තාක්ෂණික ක්‍රම ජනනය කිරීම සඳහා පර්යේෂණ සිදු කිරීම, රනිල හා අනෙකුත් ධාන්‍ය වර්ග සැකසුම හා පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ගවේෂණය කිරීම, අඩු ජල ප්‍රමාණයකින් වගා කළ හැකි කෙටි කාලීන ප්‍රභේද අභිජනනය කිරීම, ප්‍රශස්ථ යෙදවුම් භාවිතය හා නිසි පළිබෝධ පාලනය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම හා වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ගොවි ජනතාවගේ දැනුම ඉහළනැංවීම කෙරෙහි අවධානය යොමු කිරීම යන කරුණු වල අවශ්‍යතාව අධ්‍යයනය මඟින් අවධාරණය කරයි. තව ද, දේශීය නිෂ්පාදකයන් විසින් සිදු කරන රනිල බෝග හා ධාන්‍ය නිෂ්පාදනය සැපයුම ඉහළ නැංවීම සඳහා සුදුසු තීරු බදු පැනවීම හා එම නිෂ්පාදන පාරිභෝගිකයන් හට මිල දී ගැනීමට ඇති හැකියාව ඉහළ නැංවීම සඳහා උපරිම සිල්ලර මිල පැනවීම වැදගත් ප්‍රතිපත්තිමය කරුණු වශයෙන් සඳහන් කළ හැකි ය.

2. වයඹ පළාතේ අතිරේක බෝග වගාවේ ඇති වී ඇති වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ සම්බන්ධීකරණය: ආචාර්ය වසන්ති වික්‍රමසිංහ - පර්යේෂිකා

මූල්‍ය ප්‍රභවය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය හා අරමුණු:

පසුගිය කාල වකවානුවල දී, කුරුණෑගල හා පුත්තලම් දිස්ත්‍රික්කවල අතිරේක ආහාර බෝග රටාවේ සිදු වූ වෙනස්වීම් (ගොවිපොළ ක්‍රමවේද, බෝග වර්ග හා ප්‍රභේද වර්ගවල සිදු වූ වෙනස්වීම්) හා ඒ සඳහා බලපෑ හේතූන් මෙම අධ්‍යයනයට පාදක වන අතර අතිරේක බෝග වගාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ.

සොයා ගැනීම්:

හේන් වගාවේත්, කුඹුරුවල සිදු කරන අතිරේක බෝග වගාවේත්, උස් බිම් වගාවේත් සිදු වූ ක්‍රමික අඩුවීම හේතුවෙන් මෙම දිස්ත්‍රික්කවල අතිරේක ආහාර බෝග වගාව පසුබෑමකට ලක් වී තිබේ. හේන් වගාව අත්හැරීමෙන් කුරක්කන්, තල, මුං හා කව්පි වගාවේ විශාල අඩුවීමක් සිදු වී ඇත. ජනගහනය වැඩිවීමත්, හේන් වගාව සඳහා පැන වූ නීතිත් හේතුවෙන් ගොවීහු හේන් වගාව

අත්හැරීමටත්, තමන් සතු හේන්වල බහු වාර්ෂික බෝග වගා කිරීමටත් යොමු වී සිටිති. ඒ අනුව, මෙම ගොඩ ඉඩම්වල පොල් වගාව, කජු වගාව සහ කෙසෙල් වගාව ව්‍යාප්ත වී තිබේ. අසූව දශකයේ අග භාගයේ දී කුඹුරු ඉඩම්වල අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා රජය මැදිහත්වීම හේතුවෙන් මුං, කව්පි සහ අනෙකුත් අතිරේක ආහාර බෝග වගාවන් ඉහළ ගිය ද, අනූව දශකයේ මැද භාගයේ පටන් අන්තර් ජාතික වෙළෙඳාමේ අනුගමනය කළ හැකි ලිහිල් කරන ප්‍රතිපත්ති හේතුවෙන් එම වගාවන් සඳහා දිරිගැන්වීමක් සිදු නොවූ අතර ඒ හේතුවෙන් එම වගාවන් ක්‍රමයෙන් පහත වැටුණි. යල කන්නයේ කුඹුරු ඉඩම්වල බෝග විවිධාංගීකරණය සඳහා මහා පරිමාණ ගොවීන් නැඹුරු නොවීම හේතුවෙන් අතිරේක ආහාර බෝග වගාව ඉතා අඩු මට්ටමක පැවතුණි. නියමිත කාලයට වර්ෂාව නො ලැබීමත්, වර්ෂා පෝෂිත ප්‍රදේශවල වගා කිරීමත්, වැව් ගොඩවීමත් හේතුවෙන් යල කන්නය තුළ ප්‍රමාණවත් තරම් ජලය සපයා ගැනීමට නො හැකිවීමෙන් යල කන්නයේ අතිරේක ආහාර බෝග වගාව පහත වැටී ඇත.

කල්පිටිය අර්ධ ද්වීපයේ සාම්ප්‍රදායිකව ළූණු-මිරිස්-දුම්කොළ වගා රටාව වෙනස්වීමකට භාජනය වී ඇති අතර අධි තාක්ෂණික, අධි යෙදවුම් මිශ්‍ර බෝග වගාවකට ගොවීහු යොමු වී සිටිති. විවිධ එළවළු වර්ග හා පේර හා දෙළුම් වැනි පළතුරු වර්ග මෙම ප්‍රදේශවල වගා කෙරේ.

බීජ ආනයනයේ දී සිදු වූ වෙළෙඳපොළ ලිහිල් කිරීමේ ප්‍රතිපත්තිය නිසා, පොදුවේ මෙම දිස්ත්‍රික්කවල ගොවිපොළ රටාවන් හි විශාල වෙනස්වීම් සිදු වී ඇත. ගොවීහු දිගුකාලීන සාම්ප්‍රදායික ප්‍රභේදවලින් ඈත්වී කෙටි කාලීන මාසික ආදායම් ඉපැයිය හැකි බෝග හා ප්‍රභේද වෙත නැඹුරු වී සිටිති. දෙමුහුන් බීජ ආනයනය හේතුවෙන් නව බෝග හඳුන්වා දී ඇත. මැලේසියානු ප්‍රභේද බහුලව වගා කෙරේ. මිරිස් වැනි සමහර බෝග, මෙම ආනයනයන් නිසා ලෙඩ රෝගවලට බහුලව පාත්‍ර වීමෙන් වගා බිමෙන් සම්පූර්ණයෙන් ම ඈත්වූ අවස්ථා ද පවතී.

අධ්‍යයනයේ නිර්දේශ:

ව්‍යාප්ති සේවය, දිරි ගැන්වීමේ වැඩසටහන් සහ වෙළෙඳපොළ ස්ථාපිත කිරීම හරහා මෙම දිස්ත්‍රික්කවල අතිරේක බෝග වගාව ව්‍යාප්ත කිරීමේ හැකියාවක් ඇති බැවින් ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. ප්‍රධාන වශයෙන් ආනයනික බීජ මත යැපීමත්, දේශීයව බීජ සපයා ගත හැකි මූලාශ්‍රයන් සීමා වීමත් හේතුවෙන් අස්ථාවර වී ඇති බීජ වෙළෙඳපොළ ස්ථාවර කිරීම සඳහාත්, දේශීය බීජ ආරක්ෂා කිරීම හා එම බීජවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහාත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් වේ. එමෙන් ම, කුරක්කන් සහ තල

වැනි සාම්ප්‍රදායික වගා රටාවන්වලට සීමා වූ බෝග සඳහා නව වගා රටාවන් හඳුන්වාදීම සඳහා පර්යේෂණ පැවැත්වීමත් සිදු කළ යුතු ය.

3. ඉඟුරු වගාවේ නිෂ්පාදන, අලෙවි ගැටලු සහ බාධක හඳුනා ගැනීම

පර්යේෂණ කණ්ඩායම:	එස්. ඇපාසිංහ මහතා	- සම්බන්ධීකාරක
	ශ්‍යාමිනී කුසුම් කුමාර මහත්මිය	- සම පර්යේෂිකා
	සාගරිකා හිටිහාමු මහත්මිය	- සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය : ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

ඉඟුරු සඳහා වර්ධනය වන දේශීය හා විදේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුම සපුරාලීමට, දේශීය නිෂ්පාදනය සමත් වී නොමැත. එබැවින්, දේශීය නිෂ්පාදනයේ හා අලෙවියේ වත්මන් තත්ත්වය හා ඒ තුළින් ගැටලු හඳුනා ගැනීම සහ සැපයුම සහ අලෙවිය දියුණු කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනය ගම්පහ, කුරුණෑගල සහ මහනුවර යන දිස්ත්‍රික්කවලින් අහඹු ලෙස ගොවීන් 129 දෙනකු තෝරා ගෙන ප්‍රශ්නාවලියක් මඟින් තොරතුරු රැස් කිරීමෙන් සිදු කරන ලදී.

ගෘහස්ථ්‍ව වාණිජ බෝගයක් සහ අපනයන බෝගයක් ලෙස ඉඟුරු වගාවේ පවතින ගැටලු හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වූ අතර විශේෂිත අරමුණු වූයේ (i) ඉඟුරු වගා රටාව, නිෂ්පාදනය, ඉඟුරු වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු හා අලෙවි ගැටළු හඳුනාගැනීම, (ii) ඉඟුරු වලින් ලැබෙන ආදායම, වියදම සහ ලාභය ගණනය කිරීම සහ (iii) සාර්ථක ගෘහස්ථ හා වාණිජ බෝගයක් ලෙස ඉඟුරු වගාව ප්‍රචලිත කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම වේ.

සොයා ගැනීම්:

අධ්‍යයනයට අනුව, ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 86.4%ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 85.7%ක් සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 93%ක් ඉඟුරු වගාවට යොමුවීමට ප්‍රධාන ලෙස හේතු වූ කරුණක් ලෙස සඳහන් කරනු ලැබුවේ ඉඟුරු, වෙළෙඳපොළ තුළ හොඳ මිලක් ඇති ලාභදායී බෝගයක් බව යි. ගම්පහ, කුරුණෑගල, මහනුවර යන දිස්ත්‍රික්කයන් හි සාමාන්‍ය අස්වැන්න අක්කරයකට ගොඩ ඉඩම් සඳහා පිළිවෙලින් කිලෝග්‍රෑම් 3658ක්, කිලෝග්‍රෑම් 4145ක් සහ කිලෝග්‍රෑම් 3825ක් වූ අතර මෙම ප්‍රමාණය පිළිවෙලින් මඩ ඉඩම් සඳහා කිලෝග්‍රෑම් 4212ක්, කිලෝග්‍රෑම් 4034ක් සහ කිලෝග්‍රෑම් 5354ක් විය. මෙසේ අක්කරයකට ලැබෙන අස්වැන්න පිළිබඳ බහුතරයක් ගොවීන් සෑහීමකට පත් නොවූ අතර අස්වැන්න අඩුවීමට ප්‍රධාන කරුණ ලෙස සඳහන් කරනු ලැබුවේ, නිසි වගා ක්‍රම අනුගමනය නො කිරීම වේ. මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන් 89.5%ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් 96.3%ක් ද මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන් 82.6%ක් ද ලෙස සඳහන් කරන ලදී. මෙයට අමතරව, අස්වැන්න අඩුවීමට හේතු වූ කරුණු ලෙස උසස් ආරයේ බීජ සොයා ගැනීමේ ගැටළු, ඉඟුරු වගාවට රෝග වැළඳීම, පස නිසරු වීම, දේශගුණික බලපෑම් ආදිය සඳහන් කරනු ලැබී ය. සමස්ථ නියැදිය සැලකීමේ දී, පවුලේ ශ්‍රමය සහිතව ඉඟුරු කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම රු.58.00ක් වන අතර පවුලේ ශ්‍රමය රහිතව ඉඟුරු කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම රු.42.00ක් වේ.

ඉඟුරු වගාව සම්බන්ධයෙන් බාධක ලෙස කෘෂි ව්‍යාප්ති සේවයේ දුර්වලතා හැඳින්විය හැකි ය. ඉඟුරු කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදන මිල ඉහළ අගයක් ගැනීමට හේතුව වශයෙන් අස්වැන්න අනුපාතය 1:8ක් වැනි අඩු අගයක් ගැනීම සඳහන් කළ හැකි ය (මෙය මහනුවර දිස්ත්‍රික්කයේ මඩ ඉඩම් සඳහා පමණක් 1:9ක අගයක් ගැනිණ). පසුගිය වසරට (2010) සාපේක්ෂව, ඉඟුරු කිලෝග්‍රෑම් එකක් සඳහා අඩු මිලක් තීරණයවීමට හේතු වශයෙන් අලෙවිකරණය සඳහා ක්‍රමවත් ප්‍රවේශයන් නොමැතිවීම, ඉඟුරු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සඳහා යොමු නොවීම, ගොවීන් අතර පවතින දුර්වල සන්නිවේදන රටාව තුළ කේවල් කිරීමේ ශක්තිය හීනවීම, විදේශීය වෙළෙඳපොළ පිළිබඳ අඩු අවබෝධයක් පැවතීම යන කරුණු හඳුනාගත හැකි විය.

අධ්‍යයනයේ නිර්දේශ:

ඉඟුරු වගාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම තුළින් දේශීය අවශ්‍යතාවය මෙන් ම විදේශීය ඉල්ලුම ද සපුරාලීම සඳහා ඉඟුරු කර්මාන්තයේ පවතින ගැටළු අතර,

1. ඉඟුරු වගාවේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහළනැංවීම සඳහා ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු සම්පාදනය කළ යුතු ය.

2. කෘෂි ව්‍යාප්ති සේවය ශක්තිමත් කිරීම තුළින් ඉඟුරු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා "දිවි නැඟුම" සංවර්ධන ව්‍යාපෘතිය හරහා ගෘහස්ථ මට්ටමේ වගාවක් ලෙස ඉඟුරු බෝගය ප්‍රචලිත කිරීම සිදු කළ යුතු ය.

ඉඟුරු වගාව සාර්ථකවීම සඳහා කාර්යක්ෂම අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් අලෙවි රටාවක් බිහි කළ යුතු ය.

1. ගොවීන්ගේ ආදායම වැඩි කිරීම සඳහා අගය එකතු කළ නිෂ්පාදනවලට යොමු කිරීම හා ඒ සඳහා අවශ්‍ය තාක්ෂණ දැනුම ලබාදීම.

2. වෙළෙඳපොළ මිල පාලනය සඳහා ගබඩාකරණය වැඩි දියුණු කිරීමට අවධානය යොමු කිරීම හා ඒ සඳහා ගොවීන් දිරි ගැන්වීම. මේ සඳහා ඉඟුරුවල පවතින ගුණාත්මක තත්ත්වයට හානි නොවන සේ ගබඩා කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පර්යේෂණ ආයතන මඟින් හඳුන්වාදීම කළ යුතු ය.

මේ සම්බන්ධව වර්තමානයේ පවතින ගැටළු සඳහා විසඳුම් ලබාදීම තුළින් දේශීය ඉඟුරු අවශ්‍යතාව සපුරාගත හැකි අතර විදෙස් වෙළෙඳපොළ වෙත යොමුවීම තුළින් දේශීය ආර්ථිකයට යම් මට්ටමකින් හෝ ශක්තියක් සැපයීමට හැකියාව ලැබෙනු ඇත. එය "මහින්ද චින්තන සංකල්පය" මල්ඵල ගැන්වීමට හේතු වේ.

4. උතුරු පළාතේ කෘෂිකාර්මික ඉඩම්වල ඌන භාවිතය සඳහා හේතු

පර්යේෂණ සම්බන්ධීකරණය: ශ්‍යාමිනී කුසුම් කුමාර මහත්මිය - පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කෘෂිකාර්මික ඉඩම්වල ඌන භාවිතයට පාදක වී ඇති හේතු සොයා බැලීම සඳහා මන්නාරම, වවුනියාව, කිලිනොච්චි, මුලතිව් සහ යාපනය යන දිස්ත්‍රික්ක ඇසුරෙන් කඩිනම් ඇගයීමක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනයෙන් සොයා ගනු ලබන තොරතුරු, උතුරු පළාතේ කෘෂිකාර්මික ඉඩම් පිළිබඳව පවතින තත්ත්වය සම්බන්ධයෙන් ලිපිලේඛන සැපයීම සඳහා ප්‍රයෝජනවත් වේ. උතුරු පළාතේ ඉඩම් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ පදනම හෝ මාර්ග නිර්දේශ වශයෙන් මෙම ලේඛන භාවිතා කළ හැකි ය.

උතුරු පළාතේ වගා නො කළ ඉඩම් විශාල ප්‍රමාණයක් තවමත් පැවතීමට හේතු කවරේ ද යන්න සොයා බැලීම මෙම ඇගයුමේ ප්‍රධාන අරමුණ වේ.
කෘෂිකාර්මික උපකරණ, සේවාවන් හා වාරි ජලය නොමැතිවීම, ඉඩම් වගා කිරීම සඳහා මිනිස් සම්පත හිඟවීම, වතුර පොම්ප, ට්‍රැක්ටර් සහ අනෙකුත් නිෂ්පාදන හා සැකසුම් යන්ත්‍ර යනාදී යන්ත්‍ර සූත්‍ර හා නිෂ්පාදන යටිතල පහසුකම් නොමැතිකම හෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන වැනි කෘෂි උපකාරක සේවාවන් සපයන ආයතනික පහසුකම් සපයා නොමැතිකම යනාදිය පිළිබඳව මෙහි දී අධ්‍යයනය කරනු ලැබේ.

සොයා ගැනීම්:

එක් එක් දිස්ත්‍රික්කවල ගොවීන් මුහුණපාන විශේෂ ගැටළු පවතින අතර සමස්ථයක් ලෙස උතුරු පළාතේ ගොවීන් මුහුණපාන පොදු අපහසුතා පහත සඳහන් වේ.

1. විශාල, මධ්‍යම හා කුඩා වැව් කැඩී බිඳී ගොස් හෝ ජරාවාස වී ඇති අතර නළ ළිං, වතුර පොම්ප හා ජල සම්පාදන පද්ධති නොමැතිවීම හෝ අළුත්වැඩියා නො කර තිබීම.

2. වගා කළ හැකි ඉඩම් කැලෑ වැවී තිබීම, සමහර ප්‍රදේශවල බිම් බෝම්බ පැවතීම හා සමහර ප්‍රදේශ ආරක්ෂක හමුදා පාලනය යටතේ පැවතීම.

3. ගොවීන්ගේ අයහපත් ආර්ථික තත්ත්වය, කාන්තාවන් ගෘහමූලිකත්වය දරන ගෘහස්ථ වැඩි ගණනක් පැවතීම, දිස්ත්‍රික්කයෙන් පිටතට හෝ පිටරටවලට ජනතාව සංක්‍රමණය වීම.

4. ගොවිජන සේවා මධ්‍යස්ථාන වැනි ආයතනික ව්‍යුහ විනාශ වී පැවතීම, සුදුසු වෙළෙඳපොළ ක්‍රම නො පැවතීම.

5. නිදැල්ලේ හැසිරෙන විශාල ගව රංචු වගා ඉඩම්වලට ඇතුළුවීම හා වැට සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය නොමැතිකම.

අධ්‍යයනයේ නිර්දේශ:

1. වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
2. කෘෂිකාර්මික ඉඩම් වල බිම් බෝම්බ ඉවත් කිරීම.
3. කෘෂි උපකරණ මිල දී ගැනීම සඳහා ගොවි බැංකු හරහා ණය ලබා දීම.
4. පොහොර වැනි යෙදවුම් හා අනෙකුත් සේවාවන් ලබා දීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන නැවත ගොඩ නැංවීම.
5. වී අලෙවි මණ්ඩලය හරහා වී මිල දී ගැනීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම.
6. නිදැල්ලේ හැසිරෙන ගවයන් සඳහා පොදු ප්‍රදේශ වෙන් කිරීම.
7. කෘෂිකාර්මික ඉඩම් වෙත සමීප වීම සඳහා අවශ්‍ය මාර්ග සංවර්ධනය කිරීම.
8. අලෙවි ගැටළු නිරාකරණය කිරීම සඳහා පළාත තුළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

දැනට ක්‍රියාත්මක අධ්‍යයන

1. 2012-2016 දක්වා ආහාර බෝගවල ඉල්ලුම හා සැපයුම

පර්යේෂණ සම්බන්ධීකරණය: ආචාර්ය වසන්ති වික්‍රමසිංහ - පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණ

මෙම අධ්‍යයනය මගින් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ ඇති විය හැකි ආහාර බෝගවල ඉල්ලුම හා සැපයුම ගණනය කිරීමක් බලාපොරොත්තු වන අතර දැනට පවතින නිෂ්පාදන ප්‍රතිපත්ති වෙළෙඳපොළෙහි හා අන්තර් ජාතික වෙළෙඳාමේ ප්‍රතිපත්ති මෙන් ම දැනට භාවිතා කරන තාක්ෂණයත්, වාරිමාර්ග සඳහා යෝජිත ආයෝජනයනුත් දේශගුණික විපර්යාසත් මෙම ගණනය කිරීම සඳහා සලකා බැලේ.

පාරිසරික සහ ජල සම්පත්
කළමනාකරණ අංශය

පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය

අවසන් කළ අධ්‍යයන

1. වාරි ජල කළමනාකරණය සඳහා ගොවි සහභාගිත්වය: සාධනයන් සහ පසුබෑම්

පර්යේෂණ කණ්ඩායම:	එම්.එම්.එම්. අනියර් මහතා	- සම්බන්ධීකාරක
	එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා	- සම පර්යේෂක
	එම්.ටී. පද්මජානි මෙනවිය	- සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

මෙම අධ්‍යයනයෙහි අරමුණ වූයේ වර්තමාන සහභාගීත්ව වාරි කළමනාකරණ (PIM) ප්‍රතිපත්තියෙහි සාධනයන් සහ පසුබෑම් පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කිරීමත්, පංගු ජල යෝජනා ක්‍රමය (BWA), ඒකාබද්ධ මහා වාරි කළමනාකරණ යෝජනා ක්‍රමය (INMAS) , වාරි කළමනාකරණ යෝජනා ක්‍රමය (MANIS) සහ මහවැලි කළමනාකරණ මොඩලය යන කළමනාකරණ මොඩලයන් හතර යටතේ සහභාගිත්ව වාරි කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද ආයතනික ව්‍යුහයන්ගේ කාර්ය සාධනය ඇගයීමත් ය.

සොයා ගැනීම්:

1. ගොවි සංවිධානයන් හි ශක්තිමත් භාවය සැලකූ විට, මහවැලි H කලාපයේ ක්‍රියාත්මක පංගු ජල යෝජනා ක්‍රම (BWA) වැඩසටහන යටතේ ඇති කරන ලද ගොවි සංවිධාන මූලික ස්ථානය ගන්නා අතර ඒකාබද්ධ මහා වාරි කළමනාකරණ යෝජනා ක්‍රමය (INMAS) යටතේ පිහිටුවන ලද ගොවි සංවිධාන දෙවන ස්ථානය ගනියි. අවම ශක්තිමත්

භාවයක් දක්නට ඇත්තේ වාරි කළමනාකරණ යෝජනා ක්‍රමය (MANIS) යටතේ පිහිටුවන ලද ගොවි සංවිධානයන්හි ය.

2. සංවිධාන ශක්තිමත් කිරීම සඳහා අවම සහයෝගයක් ලබන්නේ MANIS යෝජනා ක්‍රමයට අදාළ ආයතනයන්ගෙන් වන අතර මේ සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ අදාළ සමාන්තර ආයතන සතු භෞතික සහ මානව සම්පත්වල හිඟතාවය යි.

3. රජය මඟින් තිරසාර මෙහෙයුම් සහ නඩත්තුවක් සහතික කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් ප්‍රමිතීන් ඉදිරිපත් කොට නොමැති අතරම ඒ සඳහා අවශ්‍ය සම්පත් සාධාරණ ආකාරයට බෙදා හැරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ඉදිරිපත් කොට නොමැත. සහභාගිත්ව වාරි කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් මෙහෙයුම් සහ නඩත්තු සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රජය මඟින් සිදු කළ යුතු ප්‍රධාන පද්ධතියෙහි නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම, ද්වීතියික සහ තෘතියික මට්ටමේ ඇළවල්වල ප්‍රමාණවත් සහ විශ්වාසදායක ලෙස ජලය පැමිණීමට බලපානු ලබයි.

4. වඩාත් හොඳ වාරි සේවාවක් සඳහා ගොවි සංවිධාන සඳහා ගෙවීමක් කිරීමට ඇති කැමැත්ත සියළුම වාරි යෝජනා ක්‍රමයන්ට අයත් ගොවීන් තුළ පැවතිය ද, එම සම්පත් එක්රැස් කිරීම සහ නියම ආකාරයෙන් භාවිතා කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් ඇති කිරීම අවශ්‍ය වේ.

5. INMAS සහ මහවැලි යෝජනා ක්‍රමයන් තුළ, ව්‍යාපෘති කළමනාකරණ කමිටු (PMC) ක්‍රමානුකූලව ක්‍රියාත්මක වුව ද, බහුතරයක් MANIS යෝජනා ක්‍රමයන් තුළ එය, ක්‍රමානුකූලව පැවැත්වීම සිදු නොවේ.

6. ව්‍යාපෘති කළමනාකරණ කමිටුව සතු බලය සහ අධිකාරිය අවම මට්ටමක පවතියි. සමාන්තර ආයතන නිලධාරීන් කමිටු රැස්වීමට සහභාගි වුව ද, එම සහභාගිත්වය තුළින් එම රැස්වීමෙහි ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට වගකීමෙන් බැඳී නැත.

අධ්‍යයනයේ නිර්දේශ:

1. ගොවි සංවිධානවලට කළමනාකරණය පැවරීමේ ගිවිසුම, PIM ප්‍රතිපත්තියට අනුව ඔවුන් සතු කාර්යයන් සහ වගකීම් , වාරි කළමනාකරණය සහ සම්බන්ධ පනත් මෙන් ම ඊට අදාළ පවත්නා අනෙකුත් පනත් මඟින් ගොවි සංවිධාන වෙත පවරා ඇති බලතල සහ අධිකාරිය පිළිබඳ ප්‍රමාණවත් වැටහීමක් ලබා දිය යුතු ය.

2. ගොවි සංවිධානය හා සම්බන්ධ කටයුතු සඳහා සමාන්තර ආයතන සහ රාජ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමේ දී, ගොවි සංවිධාන නියෝජිතයින් සඳහා හොඳ පිළිගැනීමක් සහ සේවා ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දීම අවශ්‍ය වේ.

3. වාරි පද්ධතීන් ගොවීන්ට භාර දීමට පෙර, ඒවා ඔවුන්ට නඩත්තු කළ හැකි තත්ත්වයට පුනරුත්ථාපනය කර හෝ අලුත්වැඩියා කොට භාර දිය යුතු ය. සියළුම අදාළ සමාන්තර ආයතන නිලධාරීන් PIM ප්‍රතිපත්තිය යටතේ සහ ව්‍යාපාර කළමනාකරණ කමිටු සම්බන්ධව ඔවුන් සතු කාර්යභාරයන් සහ වගකීම් පිළිබඳව දැනුවත් කළ යුතු ය.

4. මූල්‍යමය කටයුතුවල ගිණුම් කටයුතු සහ විනිවිද භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය නීති රෙගුලාසි සැකසීමට අවශ්‍ය මඟ පෙන්වීම රජය මඟින් ලබා දිය යුතු අතරම මූල්‍ය පාලනය සම්බන්ධව අවශ්‍ය පුහුණුව, අධීක්ෂණය සහ විගණන සහාය ලබා දිය යුතු ය.

5. සෑම ගොවි සංවිධානයක්ම ගොවීන්ගෙන් එකතු කරගන්නා මුදල්, මෙහෙයුම් හා නඩත්තු මුදල් සහ පුනරුත්ථාපන කොන්ත්‍රාත් මඟින් ලැබෙන මුදල් සඳහා වෙනම මෙහෙයුම් සහ නඩත්තු අරමුදලක් පවත්වාගෙන යා යුතු ය. මෙම අරමුදල සම්පූර්ණයෙන්ම වාරි පද්ධතියෙහි උන්නතිය සඳහා සහ ගොවීන්ට භාර දෙන ලද කොටසෙහි මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා පමණක් යෙදවිය යුතු ය.

6. MANIS යෝජනා ක්‍රමය යටතේ වූ වාරි පද්ධතීන් හි සංවිධාන ප්‍රවර්ධනය සඳහා වැඩිපුර සම්පත් සහ අභිප්‍රේරක උත්සාහයන් යෙදවිය යුතු ය.

2. කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද සූර්ය බල බිංදු ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර 1) ඇගයීම

පර්යේෂණ කණ්ඩායම:

	එම්.එම්.එම්. අභියර්	- සම්බන්ධීකාරක
	එම්. ජේ. සී. එස්. බණ්ඩාර	- සම පර්යේෂක
	එම්. ටී. පද්මජානි මෙනවිය	- සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

සූර්ය බල බිංදු ජල සම්පාදන (SPDI) තාක්ෂණය, ශ්‍රී ලාංකික ගොවීන් හට නව අත්දැකීමකි. මෙම ඇගයීමේ මූලික පරමාර්ථ වූයේ, සූර්ය බල බිංදු ජල සම්පාදන පද්ධති (SPDI) ලබා දීම තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අපේක්ෂාවන් ඉටු කර ගත්තා ද යන්න තක්සේරු කිරීමත්, එහි මූලික බලපෑම මෙන් ම එක් එක් පාර්ශවකරුවන්ගේ කාර්යයන් හා වගකීම් සම්බන්ධ ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීමත් ය.

සොයා ගැනීම්:

1. BP Solar සමාගම අසත්‍ය තොරතුරු සපයමින් සහ අදාළ රාජ්‍ය ආයතන නො සලකා හරිමින් මෙම වැඩසටහන ප්‍රචලිත කිරීමෙහි යෙදී ඇති බව බොහෝ ස්ථානයන්හි දී වාර්තා වී ඇත. BP Solar සමාගම මගින් සිදුකළ යුතු අලෙවියෙන් පසු සේවාවන් සැපයීම දුර්වල තත්ත්වයක පවතින අතරම ඔවුන් ගිවිසුම කඩ කළ අවස්ථා බොහොමයක් වාර්තා වී තිබේ.

2. ආරම්භක ගෙවීමට අමතරව කුමන හෝ මුදලක් වාරික වශයෙන් ගෙවා ඇත්තේ, ප්‍රතිලාභීන්ගෙන් 20%කට ආසන්න ප්‍රමාණයක් වන අතර කිසිම ප්‍රතිලාභියෙක්

ක්‍රමානුකූල ලෙස වාරික ගෙවා නොමැත. ගොවීන් හට පද්ධතිය මිල කර ඇති තරමට එය නො වටින තත්ත්වයක් පවතියි.

3. සම්පූර්ණ පද්ධතියම භාවිතා කරන්නේ, ප්‍රතිලාභීන්ගෙන් 5%ක ප්‍රමාණයක් පමණක් වන අතරම 7%ක ප්‍රමාණයක් පොහොර යොදන ටැංකිය හැර ඉතිරි කොටස භාවිතා කරයි. ගොවීන්ගෙන් 88%ක ප්‍රමාණයක් ඩ්‍රිප් සහිත බට හැර ඉතිරි පද්ධතිය භාවිතා කිරීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ ළඟා කරගත නො හැකිවීම පෙන්නුම් කරන අතර මෙය ව්‍යාපෘතියෙහි අසාර්ථකභාවය පැහැදිළි කරයි.

4. ඩ්‍රිපර්ස් භාවිතා නො කිරීමට ප්‍රධාන හේතු වී ඇත්තේ, ඩ්‍රිපර්ස් අවහිරවීම, ඩ්‍රිපර්ස් පවිත්‍ර කිරීමට ඇති අපහසුතාවය, ඩ්‍රිප් පද්ධතිය පිළිබඳව දැනුමක් නොමැති වීම, ඩ්‍රිපර්ස් සහිත බට පද්ධතියට සතුන්ගෙන් හානි සිදු වීම, ඩ්‍රිපර්ස් මඟින් ලැබෙන ජලය වගාවට ප්‍රමාණවත් නොවීම, භූමි ප්‍රමාණය කුඩා වීම සහ බිංදු ජල සම්පාදනය සිදු කිරීමට තරම් ජල හිඟයක් නො වීමත් ය.

5. 2010 යල කන්නය තුළ බිංදු ජල සම්පාදන කට්ටලය භාවිතා කර කුමන හෝ අන්දමක වගාවක් සිදු කර ඇත්තේ ගොවීන්ගෙන් 10% පමණක් වන අතර එය 2009/2010 මහ කන්නයේ දී ගොවීන්ගෙන් 4% කට සීමා වී ඇත. පද්ධතියේ මෙහෙයුම් හා නඩත්තු පිළිබඳව මෙන් ම බිංදු ජල සම්පාදන පද්ධතිය භාවිතයෙන් සිදු කළ හැකි වගාවන් පිළිබඳව ද ගොවීන්ට ඇති දැනුම ඉතා අවම මට්ටමක පවතියි.

අධ්‍යයනයේ නිර්දේශ:

සූර්ය බල බිංදු ජල සම්පාදන පද්ධතීන් ලබා දීමෙන් බලාපොරොත්තු වූ කාර්යයන් ඉටු වීම ඉතා අවම වීමත්, බහුතරයක් ගොවීන් ආරම්භක ගෙවීම හැර වෙනත් ගෙවීමක් සිදු කර නොමැති වීමත් නිසා පහත සඳහන් නිර්දේශයන් සපුරාලීමකින් තොරව, මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම නිර්දේශ නො කරයි.

1. ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් විසින් සිදු කළ යුතු ය. ව්‍යාපෘතිය අධීක්ෂණය සහ ණය වාරික අය කර ගැනීමේ සම්පූර්ණ වගකීම SAWMP හි ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් විසින් දරන්නේ නම්, BP Solar

සමාගමේ නිලධාරීන්, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ හෝ හඳුනා ගැනීමේ කාර්යයෙන් සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු ය.

2. එසේ නොමැති නම්, BP Solar සමාගම ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ ණය වාරික අය කර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

3. ගොවීන්ගේ සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ කුසලතා වර්ධන කාර්යයන්, ගිවිසුමෙහි දැක්වෙන ආකාරයට අදාළ පාර්ශවයන් විසින් සිදු කළ යුතු ය.

4. ඩ්‍රිපර්ස් පිරිසිදු කිරීමට පහසු වන පරිදි, ගලවා ඉවත් කළ හැකි ඒවා විය යුතු අතර ම ඒ සඳහා භාවිතා කරන බට පද්ධතිය කටුක පරිසර තත්ත්වයන්ට ඔරොත්තු දෙන, කල් පවත්නා ඒවා විය යුතු ය.

5. පද්ධතිය සඳහා ලබා දෙන ණය, වටිනා දේපළක් ඇපයට තබාගෙන ලබාදීමට සහ ගිවිසුම කඩ කරන ගොවීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නියෝග ගිවිසුමෙහි අන්තර්ගත කිරීම මඟින් ප්‍රතිලාභී ගොවීන් සහ රජය අතර අත්සන් කරනු ලබන ගිවිසුම ශක්තිමත් කළ යුතු ය.

3. බිංදු ජල සම්පාදන පද්ධති භාවිතයේ වත්මන් තත්ත්වය, ගැටලු සහ විකල්ප

පර්යේෂණ කණ්ඩායම: ජී. ජී. ද එල්.ඩබ්. සමරසිංහ මහත්මිය - සම්බන්ධීකාරක
එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - සම පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

වර්ෂ 2025 වන විට, අපේක්ෂිත ලෝක ආහාර අවශ්‍යතාවය පිරිමැසීම සඳහා අවශ්‍ය කෘෂිකාර්මික ජල අවශ්‍යතාවය වත්මන් කෘෂිකාර්මික ජල පරිභෝජනය මෙන් 1.2 ගුණයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, එම ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ජල භාවිතයේ කාර්යක්ෂමතාවය උපරිම කළ හැකි සුදුසු වාරි ජල තාක්ෂණයක් භාවිතයට ගැනීම අනිවාර්ය වේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ බිංදු ජල සම්පාදන පද්ධති භාවිතය සඳහා අනුගතවීමේ වත්මන් තත්ත්වය, ගැටලු සහ විකල්ප හඳුනා ගැනීම ය.

සොයා ගැනීම් :

1. බිංදු ජල සම්පාදන පද්ධති ලබාගත් ගොවීන්ගෙන් පද්ධති භාවිතා කරන්නේ 38%ක් පමණි. ඔවුන්ගෙන් ද පොහොර ඒකකය ඇතුළුව සම්පූර්ණ පද්ධතිය භාවිතා කරනුයේ 37%කි.

2. බිංදු ජල සම්පාදන පද්ධති භාවිතයට නැඹුරුවීම, රජයේ සහනාධාර ව්‍යාපෘතීන් සඳහා 45% කුත්, පුද්ගලිකව මුදල් ආයෝජනය කළ ගොවීන් සඳහා 63% කුත් විය.

3. බිංදු ජල සම්පාදන තාක්ෂණයට නැඹුරු වීම සඳහා බිංදු ජල සම්පාදනය මඟින් ජලය ඉතිරි වීමේ වාසිය බලපෑම් කර නොමැත.

4. බිංදු ජල සම්පාදිත බිම් ප්‍රමාණය අක්කර 2 ට වැඩි ගොවීන්ගේ බිංදු ජල සම්පාදනයට නැඹුරු වීමේ ප්‍රතිශතය 88%ක් වන අතර බිංදු ජල සම්පාදිත බිම් ප්‍රමාණය අක්කර 1 ට වඩා අඩු ගොවීන්ගේ එම අගය 40%කි.

5. බිංදු ජල සම්පාදන පද්ධති භාවිතයේ දී, ගොවීන්ට අත්දැකීමට සිදු වූ ප්‍රධාන බාධාවන් අතර ඩ්‍රිප් සිරවීම, අමතර උපාංග පහසුවෙන් ලබා ගැනීමට නො හැකිවීම, ජලයේ පීඩනය හේතුවෙන් බට පද්ධතියට හානි සිදුවීම සහ බිම් සැකසීමේ දී බට පද්ධතියට හානි සිදු වීම පෙන්වා දිය හැකි ය.

අධ්‍යයනයේ නිර්දේශ:

1. බිංදු ජල සම්පාදන පද්ධති භාවිතය දිරි ගැන්වීමේ දී, අක්කර 2 ට වැඩි වගා බිම් සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

2. බිංදු ජල සම්පාදන පද්ධති ක්ෂේත්‍රයේ ස්ථාපනය හා නඩත්තුව පිළිබඳ තාක්ෂණික දැනුම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහ ගොවි

සංවිධානවල ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට ලබාදීම මඟින් ගොවීන්ට වඩා හොඳ තාක්ෂණික සහායක් ලබා ගත හැකි වේ.

3. බිංදු ජල සම්පාදන පද්ධති සඳහා අවශ්‍ය අමතර කොටස් අඩු මිලට ප්‍රාදේශීය වශයෙන් පහසුවෙන් ලබාගත හැකි ස්ථානයක පැවතිය යුතු ය.

4. බිංදු ජල සම්පාදන පද්ධති ප්‍රචලිත කිරීමේ තේමාව ලෙස, "ජලය ඉතිරි කිරීමේ හැකියාව" වෙනුවට "ආදයම් ඉහළ නැංවීමට ඇති හැකියාව" යොදා ගැනීමට නිර්දේශ කෙරේ.

4. ශ්‍රී ලංකාවේ පළිබෝධ නාශක භාවිතය සහ වර්තමාන යාමන ක්‍රියාවලිය

පර්යේෂණ කණ්ඩායම:	එම්.එම්.එම්. අහියර් මහතා	- සම්බන්ධීකාරක
	එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා	- සම පර්යේෂක
	එම්.ටී. පද්මජානි මෙනවිය	- සම පර්යේෂිකා

මූල්‍යය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ වර්තමාන පළිබෝධ නාශක භාවිතය පිළිබඳව තත්ත්ව විශ්ලේෂණ වාර්තාවක් සැකසීම සහ ඵලදායී සහ කාර්යක්ෂම පළිබෝධ නාශක රෙගුලාසි ඇති කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වර්තමානයේ පවත්නා යාමන රාමුවෙහි සඵලදායකත්වය අධ්‍යයනය කිරීමයි.

සොයා ගැනීම් :

1. යොදන කෘෂි රසායන වර්ගය අනුව, නොසල්ස් වර්ග ද වෙනස් ව භාවිතා කළ යුතු බව මෙන්ම, විවිධ නොසල්ස් වර්ග පිළිබඳව ද දැනුවත් වී නොමැති අතරම ඒ පිළිබඳව අවධානය යොමු කිරීමක් ද ගොවීන් අතර දක්නට නො ලැබේ.

2. පළිබෝධ නාශක අධික භාවිතය, අව භාවිතය සහ විවිධ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කිරීම යන විවිධ අනුචිත යෙදීම් බොහෝ ස්ථානයන්හි දී වාර්තා විය.

3. පළිබෝධ නාශක යෙදිය යුතු වෙලාව, දිශාව පිළිබඳව අවධානය යොමු කිරීම, සෞඛ්‍ය අවදානම අවම කිරීමට ආරක්ෂක ඇඳුම් ඇඳීම ආදිය කලාතුරකින් අවස්ථාවක පමණක් සිදු කරනු ලබයි.

4. බොහෝ ගොවීන් විෂ අවම (Green Band) පළිබෝධ නාශක සහ සුරක්ෂිත නිෂ්පාදන පිළිබඳව දැනුවත් වී නොමැත.

5. බලය ලත් නිලධාරීන් මෙම අංශයේ නව දැනුම සහ පුහුණුවීම් කෙරෙහි යොමුවීමේ නැඹුරුතාවය අවම මට්ටමක පවතී.

6. බලය ලත් නිලධාරීන් හට ආවරණය කළ යුතු ප්‍රදේශය විශාල වීමත්, අනෙකුත් රාජකාරීන් විශාල ප්‍රමාණයක් පැවතීමත් නිසා ප්‍රමාණවත් සේවයක් ලබා දීමට අපහසු වී ඇත.

අධ්‍යයනයේ නිර්දේශ :

1. නව පළිබෝධ නාශක තාක්ෂණයන් සහ ආරක්ෂාකාරී නිෂ්පාදනයන් ගේ ප්‍රවර්ධනය සැලකිල්ලට ගනිමින් ඒකක බිම් ප්‍රමාණයකට අවශ්‍ය පළිබෝධ නාශක ප්‍රමාණය අනුව, 50 ml ට අඩු ඇසුරුම් සඳහා අවසර දීමට නිර්දේශ කළ හැකි ය.

2. පළිබෝධ නාශක මිශ්‍ර කිරීම සහ බාල කිරීම සඳහා වූ දඩුවම රුපියල් මිලියනය දක්වා ඉහළ දැමීම සහ වසර දෙකකට නො අඩු කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීම. මානව සහ පාරිසරික සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා මෙම අංශයෙහි නියැලී සිටිය හැකි අවිශ්වාසදායක පාර්ශවකරුවන් වන්නා වූ නිපදවන්නන්, සංයෝජනය කරන්නන්, ඇසුරුම් කරන්නන් සහ වෙළෙන්දන් අපලේඛණගත කිරීම.

3. පළිබෝධ නාශක යාමනය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව සඳහා වල් පැළෑටි මර්ධනය පිළිබඳ විශේෂඥයින්, කීට විද්‍යාඥයින් සහ ව්‍යාධි විද්‍යාඥයින් වැනි එම අදාළ අංශයන් හි ජ්‍යෙෂ්ඨයින් ඇතුළත් කිරීම.

4. එකම ප්‍රතිඵලය ඇති කරන්නා වූ අඩු විෂ සහ අධික විෂ සහිත රසායනිකයන් ඇති විට, අධික විෂ සහිත දිගු කාලයක් පවතින අණු සහිත රසායනිකය වෙළෙඳපොළෙන් ඉවත් කිරීම.

5. සක්‍රීය සංඝටකයන්ට පමණක් නොව, පළිබෝධ නාශක සඳහා මිශ්‍ර කරන අමතර සංඝටකයන්, තාක්ෂණික කාණ්ඩ අමුද්‍රව්‍යයන් සහ සංයෝජන අමුද්‍රව්‍යයන් සඳහා ද නීති-රීති පැනවීම.

6. පෞද්ගලික අංශය සමඟ කටයුතු කිරීමට සහ පොරොත්තුව අවම කිරීම සඳහා පළිබෝධ නාශක ලේකම් (ROP) දෙපාර්තමේන්තුවේ මානව සහ භෞතික සම්පත් වැඩි දියුණු කළ යුතු ය. පළිබෝධ නාශක ලේකම් කාර්යාලය සඳහා පෞද්ගලික අංශයේ මූල්‍යමය දායකත්වය ද ලබා ගෙන පිළිගත් රසායනාගාරයක් ලබා දීම ඉතා වැදගත් ය.

7. පළිබෝධ නාශක සම්බන්ධ සමාගම් මඟින් පළිබෝධ නාශක භාවිතය සහ අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ දැන්වීම් සඳහා ක්‍රියා පටිපාටියක් සහ ප්‍රමිතියක් ඇති කළ යුතු ය. එමෙන් ම, යම් නිෂ්පාදනයක් සඳහා අදාළ සමාගම මඟින් ක්ෂේත්‍ර මට්ටමේ ආදර්ශනයන් සිදු කළ යුතු ය.

8. පළිබෝධ නාශක භාවිතා කරන්නන් හා සම්බන්ධ වූ බොහෝ ගැටළු, ඔවුන්ගේ දැනුවත්භාවය අඩුවීම, ආකල්ප, ගොවියාගේ චර්යාව සහ ව්‍යාප්ති සේවයේ දුර්වලතාවයන් හා සම්බන්ධ වී පවතී. එම නිසා, ගොවි මට්ටමේ දී ඉස්මතු කොට ඇති ගැටළු සඳහා හැකි සියළුම දැනුවත් කිරීමේ ක්‍රම සහිත ප්‍රබල දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් අවශ්‍ය වේ.

සිදු කරමින් පවතින අධ්‍යයන

1. වළවේ ද්‍රෝණිය ආශ්‍රිත අමුණු පද්ධතීන්ගේ බෝග නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම: එම්. එම්. එම්. අනියර් මහතා - සම්බන්ධීකාරක
එම්. ටී. පද්මජානි මෙනවිය - සම පර්යේෂිකා

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා රජය මඟින් මෙරට ජලාශයන් හි ජල ධාරිතාවය ඉහළ නැංවීමේ සහ දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම මැඩපැවැත්වීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් අමුණු පද්ධතීන් ඇතුළුව කුඩා වාරි පද්ධතීන් පුනරුත්ථාපනය කිරීමට සහ නවීකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේ. කුඩා වාරි පද්ධතීන් පුනරුත්ථාපනය සඳහා වර්ෂ 2010 සිට 2020 දක්වා සෑම වසරකම රුපියල් මිලියන 50 බැගින් වියදම් කිරීමට සැලසුම් කොට ඇත. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේම දැක්වෙන පරිදි බොහොමයක් වාරි පද්ධතීන් කාලයත් සමඟ එහි උපරිම ක්‍රියාකාරී මට්ටමට ළඟා වී නොමැති අතර ඒවායේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හැඟී ගොස් තිබේ. 2010 වර්ෂයේ මෙරට ඇති වූ විශාල ගංවතුර හේතුවෙන් වැව් 200කට වැඩි ප්‍රමාණයක් කැඩී යාමත් සමඟම, මෙවැනි මැදිහත්වීමක අවශ්‍යතාවය තවදුරටත් වැඩි වී තිබේ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, වෙනස් වන කෘෂිකාර්මික සහ දේශගුණික තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අමුණු පද්ධතීන් ආශ්‍රිත බෝග නිෂ්පාදන ක්‍රියාවලියට බලපාන්නා වූ සාධක පිළිබඳව ඇගයීමයි. විශේෂිත අරමුණු වූයේ (i) අමුණු ආශ්‍රිත ගොවීන් කෘෂිකර්මාන්තය මත යැපෙන ප්‍රමාණය පරීක්ෂා කිරීම, (ii) පවත්නා වූ ජල කළමනාකරණ ක්‍රමවේදය සහ ආයතනික ව්‍යුහයන් හි ක්‍රියාකාරිත්වය ඇගයීම, (iii) බෝග නිෂ්පාදනයෙහි කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම, (iv) දේශගුණික විපර්යාසයන්ට අනුගත වීම සඳහා යොදා ගන්නා සම්ප්‍රදායික ඥානය ලේඛනගත කිරීම, (v) දේශගුණික විපර්යාසයන්ට අනුගතවීමේ තාක්ෂණයන් ගේ සමාජයීය බාධාවන් පිළිබඳ සොයා බැලීම සහ (vi) අමුණු ආශ්‍රිත බෝග නිෂ්පාදන ක්‍රියාවලිය සහ ජල කළමනාකරණය ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායයන් දියුණු කිරීම වේ.

දත්ත රැස් කිරීම (ප්‍රශ්නාවලි සමීක්ෂණ, සිද්ධි අධ්‍යයන සහ ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ පරීක්ෂණ) සහ දත්ත විශ්ලේෂණය සම්පූර්ණ කර ඇති අතර අධ්‍යයන වාර්තාව සැකසෙමින් පවතී.

අලෙවි ආහාර ප්‍රතිපත්ති හා
කෘෂි ව්‍යාපාර අංශය

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, වර්ෂ 1979 දී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තුළ ස්ථාපිත කරන ලදී. මෙම පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ, කෘෂිකාර්මික වෙළෙඳපොළ දත්ත එකතු කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම, දත්ත වගු ගත කිරීම, දත්ත සකස් කිරීම සහ අදාළ තොරතුරු මූලික වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ගොවීන්ට, වෙළෙඳුන්ට සහ අධ්‍යාපනික කටයුතු වල නිරත වූවන්ට සහ අදාළ වෙනත් පාර්ශවකරුවන්ට ප්‍රචාරණය කිරීම ය. මූලික වශයෙන් මෙම දත්ත හා තොරතුරු ශ්‍රී ලංකා ජනාධිපති කාර්යාලයේ සතිපතා පැවැත්වෙන අමාත්‍ය මණ්ඩලීය අනුකාරක සභාවක් වන ජාතික ආහාර සුරක්ෂිතතාවය හා ජීවන වියදම සමාලෝචනය පිළිබඳ කමිටුව වෙත අදාළ ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීම සඳහා ලබාදෙයි. එමෙන් ම, මෙම දත්ත හා තොරතුරු ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම, වෙළෙඳ හා පාරිභෝගික කටයුතු, මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය වැනි අමාත්‍යාංශ සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ආයතන සඳහා සැපයෙන අතර ඒවා අදාළ වෙළෙඳපොළ ස්ථාවර කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීම සඳහා භාවිතා කෙරේ. එමෙන් ම, මෙම දත්ත හා තොරතුරු මූලික වශයෙන් අවශ්‍ය වන ප්‍රධාන අමාත්‍යාංශය හැර වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථාපිත හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, පුද්ගලික අංශයේ බැංකු, වෙළෙඳ සමාගම්, විශ්ව විද්‍යාල, සමුපකාර ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, විදේශ ආධාර ලබාදෙන ආයතන සහ තානාපති කාර්යාලයන් සඳහා ද ලබාදෙයි. මෙහි දී, විශේෂයෙන් ම මෙම දත්ත හා තොරතුරු දේශීය ගොවි සහ වෙළෙඳ ප්‍රජාවන් වෙත ලබාදීමට ද කටයුතු කරන අතර රාජ්‍ය හා පුද්ගලික අංශයේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන් සඳහා ලබාදීමෙන් ද, මෙම කටයුතු තවදුරටත් පුළුල් කොට ඇත.

එසේ ම, මෙම කාර්යයට අමතරව, මෙම අංශය මඟින් කෘෂිකාර්මික අලෙවිකරණ ක්ෂේත්‍රයට අදාළ වෙළෙඳපොළ ව්‍යාප්ති සේවා කටයුතු සැලසීම, වෙළෙඳපොළ උපදේශක සේවා සැපයීම සහ කෘෂිකාර්මික අලෙවිකරණ ක්ෂේත්‍රයේ ගොවීන් සහ වෙළෙඳ කණ්ඩායම් හා නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ අධ්‍යයනයන් ක්‍රියාත්මක කිරීම ද මූලික කාර්යයන් වී ඇත. දෛනිකව තොග වෙළෙඳපොළ මිල ගණන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ට සහ මෙම ක්ෂේත්‍රයේ වෙළෙඳ කටයුතුවල නිරත රාජ්‍ය හා පුද්ගලික වෙළෙඳ ආයතන වෙත ලබාදෙයි.

1. වෙළෙඳපොළ තොරතුරු හා දත්ත එකතු කිරීමේ හා ප්‍රචාරණය කිරීමේ වැඩසහටන (අඛණ්ඩව ක්‍රියාත්මක වන)

පර්යේෂණ කණ්ඩායම:

ලලිත් කාන්ත ජයසේකර මහතා - සම්බන්ධීකාරක (ජුනි-දෙසැම්බර් 2011)

සී.පී. හතුරුසිංහ මහත්මිය - සම්බන්ධීකාරිකා (ජනවාරි -ජුනි 2011)

ආර්.පී. විදානපතිරණ මහත්මිය - පර්යේෂිකා

ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - පර්යේෂක

එන්.පී.ජී. සමන්ත මහතා - පර්යේෂක

ඩබ්ලිව්.ඒ.එන්. විජේසූරිය මහතා - පර්යේෂක

ආර්.ඩබ්.ඩී.එම්.ආර්.එන්.කේ. රඹුක්වැල්ල මහත්මිය - පර්යේෂිකා

ඊ.ඒ.ඩී. ප්‍රියංකර මහතා - පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

සතිපතා ප්‍රකාශයට පත්කරනු ලබන "ආහාර ද්‍රව්‍ය විවරණිකාව" සහ මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන "ආහාර තොරතුරු පිළිබඳ විවරණිකාව" (ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍ය) අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ ප්‍රධාන වාරික ප්‍රකාශන වී ඇත. මෙම ප්‍රකාශන මඟින් අදාළ දත්ත හා තොරතුරු ගොවි හා වෙළෙඳ ප්‍රජාවන්ට, රාජ්‍ය ආයතන සහ අනෙකුත් මේ පිළිබඳ අදාළ පාර්ශවකරුවන් වෙත ලබාදෙන අතර මෙම දත්ත හා තොරතුරු භාවිතා කරන්නන් ගේ සම්පත් බෙදීයාමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව කරන අතර ගණුදෙනු පිරිවැය (Transaction cost) අඩු කිරීමේ ක්‍රියාවලියට දායක වේ. එමෙන් ම, මෙම දත්ත හා තොරතුරු මඟින් අදාළ තොරතුරු භාවිතා කරන්නන්ගේ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම වර්ධනය වන අතර ගොවීන් ගේ වෙළෙඳපොළ කේවල් කිරීමේ ශක්තිය වැඩි කරමින් වෙළෙඳුන්ගේ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් පොදුවේ වර්ධනය කෙරේ. එමෙන් ම, පාරිභෝගිකයන් ගේ වෙළෙඳපොළ කේවල් කිරීමේ ශක්තිය වර්ධනය කරන අතරම ප්‍රතිපත්ති සම්පාදකයින්ට ප්‍රමාණවත් ආහාර තොග පිළිබඳ තොරතුරු සහතික කරමින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීමට උපකාරි වේ.

"ආහාර තොරතුරු පිළිබඳ විවරණිකාව" මාසිකව ප්‍රකාශයට පත් කරන අතර එමඟින් ආහාර නිෂ්පාදනය, නිෂ්පාදන තත්ත්වය, ආහාර තොග තත්ත්වය සහ ආහාර වර්ගයන් හි ගොවිපොළ මිල, තොග මිල හා සිල්ලර මිල ගණන් පිළිබඳ විස්තර සපයා දීමක් සිදු කර යි. තව ද එමඟින්, මාසික වෙළෙඳපොළ තොග සහ සිල්ලර මිල ගණන්, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ වල නිෂ්පාදන මිල ගණන්, ආනයන භාණ්ඩ ප්‍රමාණයන්, ඒවායේ වටිනාකම සහ මිල සහ භාණ්ඩ ආනයනය කරන රටවල් ආදී බහුවිධි සංඛ්‍යා ලේඛණය භාවිතා කරමින් රටෙහි ආහාර වෙළෙඳපොළ පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කෙරේ. මෙයට අමතරව, නිෂ්පාදන ප්‍රදේශවල නිෂ්පාදන තත්ත්වය, වගාබිම් ප්‍රමාණය, ඉලක්කගත වගා බිම් හා නිෂ්පාදන ඉලක්ක සහ ඒවායේ දැනට අත් කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳව වගා බිම් ප්‍රමාණයන් හා නිෂ්පාදන ප්‍රමාණයන්, ප්‍රධාන ජලාශ වල ජල මට්ටම්, ගංවතුර තත්ත්වය, නියං කාලගුණික තත්ත්වය සහ වගා හානි ආදී විවිධ තොරතුරු මෙමඟින් අදාළ පාර්ශවකරුවන්ට ලබාදෙයි.

මෙම අංශයේ මිල තොරතුරු මූලික වශයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින්ට ලබාදෙන අතර එම තොග සහ සිල්ලර වෙළෙඳපොළ වල මිල ගණන් ප්‍රධාන වශයෙන් ම කොළඹ නගරය ආශ්‍රිතව එකතු කරනු ලබයි. මෙහි දී තොරතුරු එකතු කිරීම සඳහා කොළඹ නගරය තුළ පිටකොටුව, තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත හා කිරිබත්ගොඩ නාගරික මධ්‍යස්ථාන තෝරා ගෙන ඇත. මෙයට අමතරව, තවත් දිවයිනේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන හා වෙළෙඳපොළ ආශ්‍රිත මධ්‍යස්ථාන 28ක් තෝරාගෙන තිබේ. මෙම මධ්‍යස්ථාන නම් කුරුණෑගල, දඹුල්ල, නිකවැරටිය, අනුරාධපුරය, තඹුත්තේගම, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, බදුල්ල, කැප්පෙටිපොළ, රත්නපුරය, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාමය, මාතර, ගාල්ල, කළුතර, මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, පුත්තලම, අම්පාර, මීගොඩ සහ මරදගහමුල වේ. එමෙන් ම, මෙම වසරේ කැපී පෙනෙන සංසිද්ධිය ලෙස දැක්විය හැක්කේ, මෙම දත්ත හා තොරතුරු එකතු කරනු ලබන නිෂ්පාදන, වෙළෙඳපොළ හා පාරිභෝගික බල ප්‍රදේශය තවදුරටත් උතුරු පළාත දක්වා පුළුල් කිරීම ය. ඒ අනුව, මෙම මිල තොරතුරු දත්ත එකතු කිරීමේ කාර්යය යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් හා වව්නියාව දක්වා පුළුල් කරන ලදී. මේ අතර දෛනික තොග මිල ගණන් එකතු කිරීම කොළඹ නගරය තුළ මැනිං වෙළෙඳපොළත්, හතරවැනි හරස්වීදිය ආශ්‍රිතවත්, මහනුවර, දඹුල්ල, නොරොච්චෝල, නාරාහේන්පිට, මරදගහමුල සහ මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන ආශ්‍රිතවත් සිදු කරනු ලබයි.

2011 වසරේ ප්‍රගතිය

- මෙම වසරේ දී ද, සතිපතා ප්‍රකාශයට පත් කරන "ආහාර ද්‍රව්‍ය විවරණිකාව" ඉංග්‍රීසි මාධ්‍ය කලාප 52 ක් ද සිංහල මාධ්‍ය කලාප 52ක් ද නිකුත් කරන ලදී.
- මෙම වසරේදී ද, "මාසික ආහාර ද්‍රව්‍ය විවරණිකාවන්" ඉංග්‍රීසි මාධ්‍ය කලාප 12ක් ද සිංහල මාධ්‍ය කලාප 12ක් ද නිකුත් කරන ලදී.
- දෛනික තොග මිල ගණන් රාජ්‍ය සහ පුද්ගලික ආයතන සඳහා ලබාදීමේ ක්‍රියාවලිය ද වසර පුරාම අඛණ්ඩව සිදුකර ඇත.
- සියළුම දෛනික, සතිපතා හා මාසික දත්ත, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සඳහා නියමිත අවස්ථාවල දී ලබා දී ඇත.
- දත්ත හා තොරතුරු, ඉල්ලුම් කරනු ලබන සියළුම රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතන සඳහා ලබා දී ඇත.
- නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේ දෛනිකව එකතු කරනු ලබන දත්ත වසර පුරාම ක්‍රියාත්මක පරිදි වෙළෙඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.
- ජනාධිපති කාර්යාලය මඟින් මෙහෙය වනු ලබන ආහාර මිල දී ගැනීමේ හා ඇගයීමේ ඒකකය වෙත අඛණ්ඩව අදාළ තොරතුරු වසර පුරාම සපයන ලදී.
- දෛනික එළවළු තොග මිල ගණන් තෝරා ගන්නා ලද ආර්ථික මධ්‍යස්ථාන 08ක් ආශ්‍රිතව, කෙටි පණිවිඩ සේවා (sms) මඟින් දැනුම් දීමේ ජංගම දුරකථන සේවාවක් ක්‍රියාත්මක කරන ලදී.

2. උතුරු පළාතේ කෘෂිකාර්මික වෙළෙඳපොළ ක්‍රම පිළිබඳ ඇගයීමේ අධ්‍යයනය

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න - අධි පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

උතුරු පළාත තුළ සිදු කළ යුතු කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලිය තුළ පවතින ප්‍රධාන අභියෝගයන් වන්නේ, කාර්යක්ෂම කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රමයක් නැවත ස්ථාපිත කිරීමය. කාර්යක්ෂම කෘෂි අලෙවිකරණ ක්‍රමයක් නැවත ගොඩනැඟීමේ දී, ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රමාණවත්, අදාළ හා සුදුසු දත්ත හා තොරතුරු නොමැති අතර ප්‍රදේශයේ ගොවි ජනතාවගේ අලෙවිකරණ ගැටළු පිළිබඳව ද ප්‍රමාණවත් තොරතුරු නොමැත. එම නිසා, රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, උතුරු පළාතේ කෘෂිකර්මික වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ගත හැකි යම් යම්

උපාය මාර්ගික සැලසුම් හා ප්‍රතිකර්ම කළ නො හැකි ය. මෙම අධ්‍යයන මඟින් දැනට පවතින කෘෂි අලෙවිකරණ ව්‍යුහය සහ ක්‍රියාදාමය සහ එහි පවතින දුර්වලතාවයන් හඳුනා ගැනීම ඔස්සේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට අදාළ තීරණයන් ගැනීම සඳහා උපකාරී වනු ඇත. මෙම අධ්‍යයනයේ සමස්ථ අරමුණු වන්නේ, පළාතේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන හා අලෙවිකරණය පදනම්කර ගනිමින් පවත්නා කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රමයන් පිළිබඳ අධ්‍යයනය කිරීමත්, ඒවායේ පවතින ආයතනික සම්බන්ධතාවයන් සහ ඒවායේ කළමනාකරණ හා ක්‍රියාකාරි ක්‍රමයන් පිළිබඳ අධ්‍යයන කිරීමත් මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට ප්‍රයෝජනවත් වන දත්ත හා තොරතුරු සම්පාදනය කිරීම ය.

සොයා ගැනීම්:

1. තිස් වසරක් පුරා පැවති දිගු කාලීන යුද්ධය හා ඒ හේතු කොට ගෙන පැවති සමාජ-ආර්ථික හා දේශපාලන අර්බුදයත්, විවිධ කාල වකවානු තුළ පැවති විවිධ රජයන් විසින් අනුගමනය කරන ලද විවිධාකාර ආර්ථික ප්‍රතිපත්තිමය හඳුන්වාදීම් හා වෙනස් කිරීම් හේතු කොටගෙනත්, උතුරු පළාත් කෘෂිකර්මික අලෙවිකරණ ක්‍රියාදාමය සහ ඒවා ආශ්‍රිත පැවති පාදක ව්‍යුහමය පහසුකම් සහ වෙනත් උපාය මාර්ගික වැඩපිළිවෙලවල් සම්පූර්ණයෙන්ම අඩපණ වී තිබුණි. උදාහරණයක් ලෙස වී අලෙවි මණ්ඩලය වසා දැමීමත්, ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා ඇති කළ නිදහස් ආනයන ක්‍රියාවලියත් මෙම කලාපයේ කෘෂි නිෂ්පාදන හා අලෙවියට ඉතා තදින් බලපෑම් සිදු කොට තිබේ. මෙහි මූලික ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය, ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ අලෙවිකරණ සබඳතාවයන් සහ ගොවීන්ගේ වෙළෙඳපොළ සහභාගීත්වයන් මෙන් ම, ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් අත්හැර දමා ඇත.

2. කෘෂිකාර්මික නිෂ්පාදන අතිරික්තය බොහොමයක් බෝග වර්ග සඳහා ක්‍රමානුකූලව වර්ධනය වන බව දක්නට ලැබේ. රතුළූණු, කෙසෙල් සහ මිදි පළාතේ පරිභෝජන අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් පරිදි දැනට නිෂ්පාදනය වන අතර අනෙකුත් බොහෝ නිෂ්පාදනයන් පළාතේ අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් පරිදි දැනට නිෂ්පාදනය නොවේ. උතුරු පළාතේ වී අවශ්‍යතාවයෙන් 82%ක් උතුරු පළාතේ නිෂ්පාදනය වන අතර වියළි මිරිස් අවශ්‍යතාවයෙන් 66%ක් ද, මාංශ බෝග වලින් 14%ක් ද, එළවළු වලින් 60%ක් සහ රතුළූණු වලින් 195%ක් ද මෙම පළාත තුළ නිෂ්පාදනය කෙරෙන බව නිල සංඛ්‍යා ලේඛන පෙන්වා දී තිබේ.

3. ප්‍රදේශය හා ජාතික මට්ටමේ වෙළෙඳ සම්බන්ධතාවයන් හා ගොවීන්ගේ වෙළෙඳපොළ සහභාගීත්වය බිඳී ගොස් ඇත. එසේ ම, වෙළෙඳපොළ සහභාගීවන්නන් ගේ දායකත්වය සංවර්ධනය සම්බන්ධයෙන් නො සලකා හැර ඇත. සැපයුම් කළමනාකරණ ක්‍රියාවලියක් හෝ වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාදාමයන් සහ සැපයුම් කළමනාකරණ ක්‍රියාදාමයන් සම්පූර්ණයෙන් අතහැර දමා ඇත. ගොවීන් තම අලෙවිකරණ කටයුතු ඒ ඒ අවස්ථානුකූලව සිදුකරන අතර එම කටයුතු සඳහා සැපයුම් ක්‍රියාදාමයක් හෝ වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාදාමයන් හෝ ක්‍රියාකාරිත්වයක් දක්නට නොලැබේ.

4. පළාත පුරා භාවිතයට නොගත් සහ වෙළෙඳපොළ බලවේගයන්ට අසුනොවූ සුවිශේෂී කෘෂිකාර්මික හා සත්ත්ව නිෂ්පාදන සම්පත් ප්‍රමාණයක් පවතී. සුවිශේෂී වූ විශාල ප්‍රමාණයේ භාවිතයට නොගත් කෘෂිකාර්මික සම්පත් ප්‍රමාණයක් කලාපය පුරා පවතින අතර ඒවා උපයෝගී කොටගෙන කෘෂි නිෂ්පාදන ප්‍රමාණයන් මෙන් ම, සත්ත්ව නිෂ්පාදනයන් තවදුරටත් වර්ධනය කළ හැකි වේ. මේවා සඳහා ඉතාමත් ඉහළ වෙළෙඳපොළ වටිනාකමක් නිර්මාණය වී තිබේ. ඒ සඳහා ගොවීන්ගේ කෘෂි බෝග වගා කිරීමේ හැකියාවත්, ධාරිතාවය සහ නිපුනතාවයත් වර්ධනය කළ යුතු අතර ඒ සඳහා ක්ෂණික තාක්ෂණික සංවර්ධනයක් කළ යුතු වේ.

5. සම්ප්‍රදායිකව කෘෂි නිෂ්පාදනයන් හි පරාදීසයක් ලෙස සැලකෙන යාපන අර්ධද්වීපය ප්‍රමුඛ මෙම කලාපයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික කටයුත්ත වී ඇත්තේ කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම ය. අතීතයේ දී පටන් ම වී/සහල් රතුළූණු, අමු මිරිස්, අර්තාපල්, මාංශ බෝග, දුම්කොළ, කිරි සහ බිත්තර ඇතුළුව සත්ත්ව නිෂ්පාදනයන් ප්‍රධානතම කෘෂි නිෂ්පාදනය විය. මෑත කාලීනව, කෙසෙල්, මිදි, අඹ සහ එළවළු වර්ග බීට් රූට්, කැරට්, ගෝවා සහ වම්බටු ඉතාමත් ජනප්‍රිය බෝග මෙන් ම, වාණිජ වශයෙන් ලාභදායී බෝග බවට පරිවර්තනය වී තිබේ. මේ අතර බෝග විවිධාංගීකරණය යාපන අර්ධද්වීපයේ කැපී පෙනෙන ලක්ෂණ වන අතර අනෙකුත් දිස්ත්‍රික්කයන් හි තවදුරටත් ප්‍රමුඛතාවය ලැබී ඇත්තේ තනි වගාවක් ලෙස වී නිෂ්පාදනයට ය.

6. මුලතිව්, මන්නාරම හා කිලිනොච්චි වැනි දිස්ත්‍රිකයන් හි වෙළෙඳපොළ පිළිබඳ ක්‍රමවේදයන් සම්පූර්ණයෙන් ම අභාවයට ගොස් ඇත්තේ ඒ සඳහා දිගු කාලීනව ගොවීන්ගේ දායකත්වය නො තිබීම හේතුකොට ගෙන ය. එම නිසා, අසමාකාරයෙන් සංවර්ධනය වි ඇති

කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රමයන්ගේ ක්‍රියාකාරීත්වය පළාතේ කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රමය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වී තිබේ.

7. කිලිනොච්චි, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රිකයන් හි කෘෂි අලෙවිකරණය තවදුරටත් ප්‍රාථමික මට්ටමින් සිදුවන අතර සියළු වෙළෙඳ ක්‍රියාකාරකම් රඳා පවතින්නේ එදිනෙදා සිදුවන තත්කාලීන ස්වරූපයන් මත ය. කෙසේ වුව ද, යාපනය හා වව්නියා දිස්ත්‍රික්කයන් හි කෘෂිකාර්මික අලෙවිකරණ ක්‍රමවේදයන් තරමක් දුරට ගොඩනැඟී ඇති අතර බොහෝ අලෙවිකරණ කටයුතු නො සලකා ඇති බැවින්, දිගුකාලීනව ඒවා නටබුන් බවට පත් වී ඇත. කෙසේ වුව ද, මෙම දිස්ත්‍රික්ක දෙක තුළ මෑතකාලීනව ඉතා සුවිශේෂී වෙළෙඳපොළ ක්‍රමවේදයන් වර්ධනය වෙමින් පවතින බව දක්නට ලැබේ.

8. කෘෂිකාර්මික වෙළෙඳපොළ අතිරික්තයක් නිෂ්පාදනය කිරීම සඳහා ඉඩම් හිමිකම් ලබා ගැනීමේ හැකියාව ඉතාමත් තීරණාත්මක සාධකයක් වී ඇත. එසේ ම, මේ සඳහා අවශ්‍ය සමාජමය ආයතනික රටාවක් සහ සාමූහික තීරණයන් ලබා ගැනීමේ ක්‍රියා පිළිවෙතක් මෙම ගොවි /වෙළෙඳ සමාජය තුළ තවමත් වර්ධනය වී නැති අතර එමගින් වෙනස් වන හා අභියෝගයන්ට මුහුණපාන නිෂ්පාදන හා වෙළෙපොළ සඳහා සුදුසු තීරණයන්ට එළඹීමේ හැකියාවක් නො පවතී.

9. කෘෂිකාර්මික නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රමවේදයන්ගේ සංවර්ධනය සඳහා සුදුසු දේශපාලන, සමාජ හා ආර්ථික පරිසරයක් මෙම කළාපය තුළ තවදුරටත් වර්ධනය විය යුතු අතර ඉඩම් අයිතිය හා ඉඩම් බෙදාදීම, කෘෂිකාර්මික අතිරික්තයන් සහ වෙළෙපොළක් බිහිකරලීමේ මූලික කොන්දේසි වී තිබේ. ගොවි සහ වෙළෙඳ ප්‍රජාවන්ගේ සාමූහික නිෂ්පාදන හා වෙළෙඳපොළ තීරණයන් ගැනීම සඳහා දායක විය හැකි ප්‍රමාණවත් සමාජ ආයතනික රටාවක් කලාපය තුළ වර්ධනය වී නැත. කෙසේ වුව ද, දැනට පවත්නා සමාජ, ආර්ථික හා දේශපාලනමය ප්‍රතිපත්ති ආකෘතිය තුළ බලය විමධ්‍යගත කිරීම තුළින් ජනතාවගේ දේශපාලන දර්ශනයන් බලාපොරොත්තු සපුරා ගත හැකි වුව ද, එය දහස් ගණනක් වූ දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙන, කුඩා පරිමාණයේ, වරප්‍රසාද රහිත සුළු ගොවීන්ගේ ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීමට ප්‍රමාණවත් නොවන්නකි.

අධ්‍යයනයේ නිර්දේශ:

නැඟී එන ගෝලීය වෙළෙඳපොළ පදනම් කරගත් ආර්ථික පද්ධතියක් තුළ, කුඩා පරිමාණ ගොවීන් මැනවින් සංවිධානය විය යුතු හෙයින්, ඒ සඳහා, විශ්වීය වෙළෙඳපොළ වෙනස් වීම් වලට අනුගත විය හැකි පරිදි පළාතේ ග්‍රාමීය කෘෂි ආර්ථිකය නැවත සංවිධානය විය යුතු ය. ඒ සඳහා, සම්පූර්ණයෙන් ම පළාතේ වෙළෙඳපොළ ක්‍රමවේදයන් නැවත සංවිධානය කළ යුතුව ඇති අතර වෙළෙඳපොළ ක්‍රමයන් නැවත ආයතනගත කිරීමත් වෙළෙඳපොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, සම්පත් බෙදී යාමේ ක්‍රියාදාමයේ ඒකරාශී කිරීමත් මෙන් ම, අඛණ්ඩව සිදු කිරීමත්, වෙළෙඳපොළ පදනම් කරගත් බෝග ප්‍රවර්ධනය කිරීමත්, පුද්ගලික හා රාජ්‍ය දායකත්වය වර්ධනය කිරීමත්, ව්‍යාපාරික කෘෂිකර්මය වර්ධනය කිරීමත් හා කාර්යක්ෂම කිරීමත්, ගොවීන්ගේ උනන්දුව හා සහයෝගය මත සමුපකාර පිහිටුවීම හා සංවර්ධනය කිරීමත්, ගොවීන් හා වෙළෙඳුන් දැනුවත් කිරීමත් සහ වෙළෙඳපොළ පහසුකම් පහසුවෙන් ලබාගැනීමට හැකි පරිදි වෙළෙඳපොළ සංවර්ධනය කිරීම වැනි ඒකාබද්ධ ක්‍රියාකාරකම් රාශියක අවශ්‍යතාවය මෙහි දී කැපී පෙනේ.

3. පොළොන්නරුව හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් හි සහල් සැකසීමේ කර්මාන්තයෙහි ව්‍යුහය, ක්‍රියාකාරිත්වය හා සාධනය පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම:	ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	- සම්බන්ධීකාරක
	ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	- සම පර්යේෂක
මූල්‍ය මූලාශ්‍රය:	ඒකාබද්ධ අරමුදල	

විෂය පථය සහ අරමුණු:

ව්‍යුහය, ක්‍රියාකාරිත්වය සහ සාධනය පිළිබඳ ප්‍රවේශය ආහාර නිෂ්පාදන කර්මාන්තයෙහි තරඟකාරී ස්වභාවය පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා බහුල වශයෙන් උපයෝගී කරගන්නා අතර එමගින්

කර්මාන්තයේ ව්‍යුහය, එහි ක්‍රියාකාරිත්වය සහ සාධනය කෙරෙහි බලපෑම පරික්ෂා කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි සහල් ඉතා වැදගත් තැනක් ගන්නා අතර සහල් සැකසීමේ කර්මාන්තය මෙරට විශාලතම කෘෂි ආශ්‍රිත කර්මාන්තය වෙයි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ සහල් සැකසීමේ කර්මාන්තයෙහි ප්‍රධාන කලාපයන් වන පොළොන්නරුව හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් හි එම කර්මාන්තයෙහි පවතින ව්‍යුහය හා පැතිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම ය. කර්මාන්තයෙහි තරඟකාරිත්වය පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නොමැති අතර අධ්‍යයනය තුළින් ඒ පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

සොයා ගැනීම්:

දෛනිකව වී සහල් බවට පත් කරන ප්‍රමාණය අනුව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් මෝල් අතුරින් 53% දිනකට මෙ.ටො 8ට වැඩි අතර එම ප්‍රමාණයෙන් 19%ක් දිනකට මෙ.ටො. 20ට වැඩි වේ. හම්බන්තොට මුළු ප්‍රමාණයෙන් 50%ක්ම දිනකට මෙ.ටො. 8-20 අතර ගණයට අයත් වේ. සංකේන්ද්‍රතා සංගුණකයන්ට අනුව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් සැකසීමේ කර්මාන්තය සුළු වශයෙන් සංකේන්ද්‍රණය වීමේ තත්ත්වයක් පවතී. එසේ වුව ද, හම්බන්තොට දිසත්‍රික්කයේ කර්මාන්තය ඉහළ තරඟකාරීත්වයකින් යුක්ත බව පෙන්නුම් කරයි.

ආරම්භක ප්‍රාග්ධනය සොයා ගැනීම අපහසුකම, ක්ෂේත්‍රය පිළිබඳව අවබෝධය හා පළපුරුද්ද නොමැතිකම, සහල් සැකසීමේ කර්මාන්තයෙහි තාක්ෂණය පිළිබඳව පවතින දැනුම නොමැතිකම යනා දී කරුණු කර්මාන්තයට පවතින ප්‍රධාන පිවිසුම් බාධකයන් ලෙස දැක්විය හැකි ය. එසේ වුව ද, වසර 2000-2010 අතර කාලයේ දී සැලකිය යුතු මෝල් සංඛ්‍යාවක් කර්මාන්තයට පිවිසී ඇති අතර මෙම මෝල් සියල්ලක්ම පාහේ දෛනික ධාරිතාවය ටොන්. 10ට අඩු මට්ටමක පවතින කුඩා පරිමාණ ඒවා වේ.

ධාරිතාවය අනුව, සහල් මෝල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය පැරණි වන අතර කර්මාන්තයෙහි සිදුව ඇති වර්ධනයත් සමඟ එය යාවත්කාලීන විය යුතු ය.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් මෝල් හිමියන්ගෙන් 30%ක්ම වසර 20කට පෙර කර්මාන්තය ආරම්භ කරන කොට ඇති අතර මොවුන් අතරින් බොහොමයක් මේ වන විට විශාල පරිමාණ මෝල් හිමියන් වේ. විශාල පරිමාණ මෝල් හිමියන් සතුව දීර්ඝ පළපුරුද්දක් පවතින

අතර එම මෝල් සුළු පරිමාණ මට්ටමින් ආරම්භ කොට, දීර්ඝ කාලයකට පසු ක්‍රමයෙන් මහා පරිමාණ තත්ත්වයට ළඟා වී ඇති බව පෙනී යයි.

පොළොන්නරුව සහල් මෝල් හිමියන්ගෙන් 80%කට වියළන යන්ත්‍ර පවතින අතර වැඩි වටිනාකමකින් යුක්ත වන අව පැහැති සහල් ඇට ඉවත් කිරීමේ යන්ත්‍ර (Colour Sorter) සහ පාලම් තරාදි (Weighing Bridge) යනාදිය 30%කට අඩුවෙන් පවතී. ජල තාක්ෂණ පොලිෂර් යන්ත්‍ර (Water Jet Polisher) සහ සහල් වෙන් කිරීමේ යන්ත්‍ර (Rice Graders) වැඩි වශයෙන් පවතින අතර සහල් පොලිෂ් කිරීම සහ කැඩුණු සහල් ඉවත් කිරීම බොහොමයක් මෝල් හිමියන් අතර ජනප්‍රිය වීම එමගින් පෙන්නුම් කරයි.

සියළුම සහල් මෝල් හිමියන් අත්විඳින ගැටළුවක් වන්නේ, ඒකාකාරී විදුලි සැපයුමක් නොමැතිකම යි.

පොළොන්නරුවේ විශාල මෝල් හිමියන්ගේ ප්‍රධානතම වී මිල දී ගැනීමේ ක්‍රමය වන්නේ, එකතු කරන්නන්ගෙන් සහ වී තැරව්කරුවන් හරහා වී මිල දී ගැනීම යි. හම්බන්තොට ප්‍රධානතම ක්‍රමය, සහල් මෝල් හිමියන් සෘජුවම ගොවීන්ගෙන් මිල දී ගැනීම යි.

දිස්ත්‍රික්ක දෙකෙහිම විශාල මෝල් හිමියන්ගේ ප්‍රධාන සහල් වෙළෙඳපොළ වන්නේ, කොළඹ සහ අවට නගර වේ.

වී මිල දී ගැනීමේ දී, මෝල් හිමියන් ලබා ගනු ලබන "ඔඩපන ණය" සලකා බැලූ විට ඉහළ අසමානතාවයක් පෙන්නුම් කරයි. පොළොන්නරුවේ රාජ්‍ය බැංකු මගින් ණය ලබාදීම සිදු කරන අතර හම්බන්තොට ප්‍රධාන වශයෙන් පෞද්ගලික බැංකු එයට සම්බන්ධව සිටී.

සහල් සිල්ලර මිල සහ වී මිල අතර ආන්තිකයන් වසර ගණනාවක දත්ත මගින් විශ්ලේෂණය කළ විට, සිල්ලර මිලෙන් ගොවියාට ලැබෙන කොටස ස්ථාවරව පැවතීම හෝ සුළු වශයෙන් වර්ධනය වීමක් දිස්ත්‍රික්ක දෙක තුළම පෙන්නුම් කරයි.

සියළු මෝල් හිමියන් අතුරෙන්, මෝල් හතරක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන්, හොඳ නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ තත්ත්ව සහතිකය ලබා ඇති අතර එම මෝල් සුළු වශයෙන් සහල් අපනයනය කරන ඒවා වේ.

අධ්‍යයනයේ නිර්දේශ:

1. කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා පර්යේෂණ, පුහුණු සහ ඇගයීමේ කටයුතු සඳහා වෙනම ඒකකයක් පවතින අතර ආයතනික ව්‍යුහය තුළ ස්ථාපිත කිරීම සිදු කළ යුතු ය. නව සහල් මෝල් ස්ථාපිත කිරීමේ දී, ග්‍රාමීය ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ වලට ප්‍රමුඛ ස්ථානයක් ලබා දීම.

2. නව සහල් වර්ගීකරණය කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය ය. අධ්‍යයනයේ සොයා ගැනීම් සහ වෙනත් සහල් නිපදවන රටවල කර්මාන්තය පිළිබඳ තොරතුරු පදනම් කරගෙන, දෛනිකව වී කොටනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 8 ට වඩා අඩු කුඩා පරිමාණ ලෙස ද, නව වර්ගීකරණයක් නිර්දේශ කළ හැකි ය.

3. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් හට යන්ත්‍ර ලබා ගැනීම, ගබඩා පහසුකම් වැඩි කිරීම, වී මිල දී ගැනීමේ හැකියාව ඉහළ නැංවීම වැනි කරුණු සඳහා උත්තේජන වැඩ පිළිවෙලක් අවශ්‍ය ය.

4. අවාරයේ දී වී අලෙවි මණ්ඩලය සතු වී තොග නිදහස් කිරීමේ දී, සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට ප්‍රමුඛස්ථානය දීම අවශ්‍ය ය. කර්මාන්තය සඳහා වෙනත් සියළු රටවල දැනට පවතින, සහල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම අවශ්‍ය ය.

5. වියට්නාමය වැනි රටවල දක්නට ලැබෙන සහල් පොලිෂ් කිරීමේ සහ කළු අරටු ඉවත් කිරීමේ කාර්යයන් හි පමණක් නිරතව සිටින සහල් මෝල් බිහි කිරීම අවශ්‍ය ය. දැනටමත් සුළු වශයෙන් පවතින එවැනි සහල් මෝල් ව්‍යාප්ත කිරීම අවශ්‍ය ය. මෙම ක්‍රමය තුළින්, මිල අධික තාක්ෂණික යන්ත්‍ර ලබා ගැනීමට නො හැකි, කුඩා පරිමාණ සහල් නිපදවන්නන්ට ඔවුන්ගේ සහල් සඳහා වැඩි එකතු කළ අගයක් ලබා ගත හැකි වේ.

6. කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා නව තාක්ෂණය පිළිබඳ කර්මාන්තයේ නිරත වූවන් පුහුණු කිරීමේ වැඩසටහන් අත්‍යාවශ්‍ය ය. ගුණාත්මක වී නිෂ්පාදනය සඳහා ගොවීන්, අස්වනු නෙළන යන්ත්‍ර ක්‍රියාකරුවන්, වී මිල දී ගන්නන් ඇතුළු සැපයුම් දාමයෙහි නිරත සියළු පාර්ශව සඳහා පුහුණුව හා දැනුවත් කිරීමේ වැඩසටහන් අවශ්‍ය ය.

7. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන්ට යටත් ව, සහල් ශ්‍රේණිගත කිරීමක් හඳුන්වාදී එම ශ්‍රේණිගත කිරීම් යටතේ වෙළෙඳපොළට සපයන සහල් වර්ග සඳහා උපරිම සිල්ලර මිල සීමාවෙන් යම් ප්‍රමාණයකට සහන ලබාදීම් සිදු කිරීම සලකා බැලිය යුතු කරුණකි.

8. සහල් නිවුඩු වලින් තෙල් නිපදවීමේ කර්මාන්තයක් පොළොන්නරුව ප්‍රදේශය තුළ ඇති කිරීම සඳහා ආයෝජකයින් දිරි ගැන්වීම. හම්බන්තොට විශාල වශයෙන් අපතේ යන දහයියා කාර්යක්ෂම ලෙස භාවිතයට ක්‍රමවේදයක් හඳුන්වා දීම.

9. කර්මාන්තයෙහි තිරසාර බව රැකෙන පරිදි බදු ක්‍රමයන් සරල කිරීම සහ ඒවා පිළිබඳව තවදුරටත් පුනරීක්ෂණය සිදු කිරීම.

4. අර්තාපල් සහ රතුළූණු පිළිබඳ අලෙවිකරණ ආන්තිකය ගණනය කිරීම

පර්යේෂණ කණ්ඩායම: ඩබ්. එච්. දුමින්ද ප්‍රියදර්ශන මහතා - සම්බන්ධීකාරක
ආර්.පී.විදානපතිරණ මහත්මිය - සම පර්යේෂිකා
එන්.පී.ජී. සමන්ත මහතා - සම පර්යේෂක

මූල්‍ය මූලාශ්‍රය: ඒකාබද්ධ අරමුදල

විෂය පථය සහ අරමුණු:

වෙළෙඳපොළ ආන්තිකය අලෙවිකරණ ක්‍රියාවලියෙහි විවිධ අදියරයන් හි භෞතික තත්ත්වය වටිනාකමෙහි වෙනස ලෙස අර්ථ දැක්විය හැකි ය. එය, ගොවිපොළ මිල සහ තොග මිල අතර වෙනස හෝ තොග මිල සහ සිල්ලර මිල අතර වෙනස ලෙස පෙන්නුම් කරයි. අලෙවි පිරිවැය ගණනය සඳහා මෙන් ම, කෘෂි ව්‍යාපාර සැලසුම්කරණයෙහි සහ උපාය මාර්ග සම්පාදනයෙහි මෙය ඉතා වැදගත් තැනක් ගනී. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ අර්තාපල් සහ රතුළූණු වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය සහ කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා න්‍යායාත්මක පසුබිමක් ගොඩනගනු ඇත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ ලෙස අර්තාපල් සහ රතුළූණු අලෙවිකරණ ආන්තිකයන් විශ්ලේෂණය කිරීම සහ වෙළෙඳපොළ පිරිවැය සහ කාර්යක්ෂමතාවය මැන බැලීම ලෙස දැක්විය හැකි ය.

සොයා ගැනීම්:

- අධ්‍යයනයෙන් හෙළිවන ආකාරයට, නුවර එළිය සහ වැලිමඩ සිට කොළඹ තොග වෙළෙපොළ දක්වා අර්තාපල් සැපයුම්දාමයෙහි අවසන් පාරිභෝගිකයාගේ මිලෙන් පිළිවෙළින් 68%ක් සහ 60%ක් නිෂ්පාදකයාගේ කොටස ලෙස හඳුනාගනු ලැබී ය.

- අර්තාපල් සඳහා රජය විසින් පොහොර සහනාධාර ලබාදීමත් සමඟ අර්තාපල් කිලෝවක් නිෂ්පාදනය සඳහා යන වියදම 10%කින් අඩු වී ඇත.

- මිල ආන්තිකය ගණනය කිරීමට අනුව, නුවරඑළිය අර්තාපල් නිෂ්පාදකයන් වැලිමඩ අර්තාපල් නිෂ්පාදකයන්ට සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ ලබාගනී. නුවරඑළිය සිට කොළඹ දක්වා අර්තාපල් සැපයුමේ ප්‍රධාන අලෙවි මාර්ග දෙක ලෙස පහත අලෙවි මාර්ග හඳුනාගත හැකි විය.

ඒ අනුව, පළමු මාර්ගය ලෙස ගොවියා, ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගම් ප්‍රවාහන නියෝජිතයා, කොළඹ කොමිස් වෙළෙඳපොළ (තොග වෙළෙඳපොළ) සහ සිල්ලර වෙළෙඳපොළ හරහා පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කිරීම හඳුනාගත හැකි විය. එසේ ම, දෙවන අලෙවි මාර්ගය ලෙස ගොවියා, එකතු කරන්නා, කොළඹ කොමිස් වෙළෙඳපොළ හරහා පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කිරීම ලෙස හඳුනා ගත හැකි විය.

මෙම අලෙවි මාර්ග දෙක තුළින් තොග වෙළෙඳපොළ ආන්තිකය පිළිවෙළින් 9%ක් සහ 1%ක් ලෙස පළමු අලෙවි මාර්ගය තුළින් හඳුනාගත හැකි විය. එසේ ම, සිල්ලර වෙළෙඳපොළ තුළ ශුද්ධ ආන්තිකය මෙම අලෙවි මාර්ග දෙක තුළ පිළිවෙළින් 23%ක් සහ 27%ක් ලෙස සටහන් විය. ඒ අනුව, වෙළෙඳපොළ කාර්යක්ෂමතාවය පළමු අලෙවි මාර්ගයෙහි ඒකක 09ක් ලෙසටත්, දෙවන මාර්ගය තුළ ඒකක 07ක් ලෙස ද, සටහන් විය. ඒ අනුව, මෙම මාර්ග දෙක අතුරින් පළමු මාර්ගය කාර්යක්ෂමතාවයේ ඉහළ අලෙවි මාර්ගය ලෙස හඳුනාගත හැකි ය. මේ සඳහා අතරමැදියන් නොමැති වීම හේතු වී තිබුණි.

ඒ අනුව, පළමු මාර්ගය ලෙස ගොවියා, කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය, පිටකොටුව තොග වෙළෙඳපොළ හරහා පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කිරීම හඳුනා ගත හැකි විය. එසේ

ම, දෙවන අලෙවි මාර්ගය ලෙස ගොවියා, ප්‍රවාහන නියෝජිතයා පිටකොටුව තොග වෙළෙඳපොළ, සිල්ලර වෙළෙඳපොළ හරහා පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කිරීම ලෙස හඳුනාගත හැකි විය.

මෙම මාර්ග අතුරින් පළමු හා දෙවන මාර්ගයන් හි තොග වෙළෙඳුන් ශුද්ධ ආන්තිකය ඒකක 6ක් සහ 8ක් ලෙස හඳුනා ගත හැකි අතර ඒ අනුව, දෙ වැනි මාර්ගය වඩා කාර්යක්ෂම අලෙවි මාර්ගය ලෙස හඳුනා ගත හැකි විය. පිටකොටුව තොග වෙළෙඳපොළ තුළ නුවරඑළි අර්තාපල් සඳහා කොමිස් ක්‍රමයට ගෙවීම් නො කරන අතර මුදලට ගැනීම සිදු වේ. එසේ ම, වැලිමඩ මෙම තත්ත්වය වෙනස් ස්වරූපයක් ගනී. එනම්, වැලිමඩ අර්තාපල් සඳහා කොමිස් මුදලට අර්තාපල් සඳහා ගෙවීම් සිදු වේ.

අධ්‍යයනයේ සොයා ගැනීම් වලට අනුව, රතු ළූණු සඳහා පුත්තලම සහ යාපනය ප්‍රදේශයෙන් අලෙවි මාර්ගයන් සලකා බැලූ විට, පාරිභෝගිකයා ගෙවන මිලෙන් සිල්ලර 67%ක් සහ 65%ක් නිෂ්පාදකයාගේ කොටස වේ. යාපනය රතු ළූණු ගොවියාට සාපේක්ෂව පුත්තලම ගොවියා ඉහළ ප්‍රතිලාභ ලබා ගනී. මේ සඳහාත් තත්ත්වයෙන් ඉහළ නිෂ්පාදන පැවතීම ද ප්‍රධාන හේතු වී තිබේ. වෙළෙඳපොළ කාර්යක්ෂමතාව සැලකූ විට, එය පිළිවෙළින් පුත්තලම සහ යාපනය අලෙවි මාර්ග සඳහා ඒකක 4.18ක් සහ 3.78ක් ලෙස හඳුනා ගත හැකි විය. ඒ අනුව, පුත්තලම ප්‍රදේශයෙන් සැපයෙන අලෙවි මාර්ගය ඉතා කාර්යක්ෂම එකක් විය. රතු ළූණු සඳහා සිල්ලර වෙළෙඳපොළ ඉහළ ගිය ආන්තිකයක් තබා ගන්නා බව අධ්‍යයනය විය. ඒ සඳහා පසු අස්වනු හානිය අනුව ඉහළ මට්ටමක පැවතීම හේතු වී ඇත.

අධ්‍යයනයේ නිර්දේශ:

1. නො දියුණු අලෙවි මාර්ගයන් පැවතීමත් සමඟ අඩු කාර්යක්ෂමතාවයක් සහ නිෂ්පාකයා හා පාරිභෝගිකයා අතර ඉහළ ආන්තිකයක් නුවරඑළිය අර්තාපල් සපයන පළමු මාර්ගය සහ යාපනයෙන් සැපයෙන අලෙවි මාර්ගයන් තුළ හඳුනාගත හැකිවිය. ඒ අනුව, දියුණු, වඩා කාර්යක්ෂම අලෙවිකරණ රටාවක අවශ්‍යතාවය පවතී. මේ හේතුවෙන් ප්‍රවාහනය, වෙළෙඳපොළ, මහාමාර්ග යන යටිතල පහසුකම් සංවර්ධනය කර ඒ තුළින්, අලෙවි මාර්ග කාර්යක්ෂම කළ යුතු ය.

2. දෛනික වෙළෙඳපළ තොරතුරු පිළිබඳ අලෙවිකරණ ක්‍රියාවලිය සියළුම පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කිරීම තුළින් වෙළෙඳපොළ කාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකි බැවින් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය පවතී.

3. වෙළෙඳුන් සහ ගොවීන් සංවිධාන ගත විය යුතු අතර ඒ තුළින් වර්තමානයේ පවතින වෙළෙඳපොළ ව්‍යුහයට සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ ළඟා කර ගත හැකි වේ.

මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හැඳින්වීම

ශ්‍රී ලාංකීය ගොවිජන ක්ෂේත්‍රයේ සමාජ, ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතනය වශයෙන් කටයුතු කරන මෙම ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය ප්‍රධාන කාර්යය භාරයන් 3ක් ඔස්සේ ක්‍රියාත්මක වේ. එනම්,

1. ශ්‍රී ලාංකීය ගොවි ජනතාවගේ ජාතික අවශ්‍යතාවන් මත නිත්‍ය පුහුණු වැඩසටහන් සැකසීම, සංවිධානය කිරීම, සම්බන්ධීකරණය හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

2. ගොවිජන ක්ෂේත්‍රයේ කාලීන වශයෙන් මතුවන ගැටළු වලට අදාළව සිදු කරනු ලබන ඉල්ලීම් මත පුහුණු වැඩසටහන් සැකසීම සම්බන්ධීකරණය හා පැවැත්වීම.

3. අනෙකුත් රාජ්‍ය ආයතනවල පුහුණු වැඩසටහන් සැකසීම හා මෙහෙයවීම සඳහා පුහුණු විශේෂඥයන් ලබාදීම.

තව ද, දේශීය හා ජාත්‍යන්තර සංවිධාන, ආයතන අතර සහයෝගීත්වයෙන් ග්‍රාමීය සංවර්ධනය හා ගොවි කටයුතුවලට අදාළ සම්මන්ත්‍රණ, වැඩමුළු, සාකච්ඡා සංවිධානය කිරීම හා මෙහෙයවීම ද මෙම අංශය මඟින් සිදු කෙරේ.

2011 වර්ෂය සඳහා, මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන් මෙසේ ය.

2011 වර්ෂයේ දී පැවැත් වූ පුහුණු වැඩසටහන්

1. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම හා කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව - 7

පුහුණු ලාභීන් සංඛ්‍යාව - 252

	සහභාගිවූවන්	දිනය	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුලාභීන් සංඛ්‍යාව
1.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්	1. 24 – 28 ජනවාරි 2. 25 – 29 අප්‍රේල්	02	51
2.	සබරගමු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්	1. 28.03.11 සිට 02.06.11-06.06.11	02	70
3.	උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ව්‍යාප්ති නිලධාරීන්	1. 26 – 27 සැප්. 2011	01	44
4.	මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය සංවර්ධන කාර්යයේ නියුතු නිලධාරීන්	20 – 24 ජූනි	01	41
5.	දික්වැල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්	17 – 22 ඔක්.	01	41
			07	**252**

විෂය පථය සහ අරමුණු :

වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ, "ප්‍රජා සහභාගීත්ව ප්‍රවේශය" ඔස්සේ වර්තමානයේ ක්‍රියාත්මක වන ග්රාමීය/කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් වලට අනුයුක්තව සෘජුව කටයුතු කරන සංවර්ධන නිලධාරීන් සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය මගින් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සැකසීම පිළිබඳව න්‍යායාත්මක මෙන් ම, ප්‍රායෝගික දැනුම ලබාදීම යි. සෑම වැඩසටහනක් අවසානයේ දී ම තෝරාගත් ගම්මානයක ප්‍රායෝගික අභ්‍යාසයක් සිදු කරන ලද අතර ඒ අනුව අදාළ ආයතන විසින් එම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ අනුරාධපුරයේ පැවැත් වූ තෝරාගත්

ගම්මානය වන රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "කෝණකුඹුක්වැව" ගම්මානයේ සංවර්ධනය "දැයට කිරුළ - 2012" ට සමගාමීව මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

පුහුණු කණ්ඩායම:

එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	සම්බන්ධීකාරක
ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	අංශ ප්‍රධාන
ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා	-	අධි පර්යේෂක
එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	සහාය අධිපර්යේෂක
එස්. ඇපාසිංහ මහතා	-	පර්යේෂණ නිලධාරී
එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

2. අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ පුහුණු වැඩසටහන

පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - 05

පුහුණුලාභීන් සංඛ්‍යාව - 161

සහභාගීවූවන්		දිනය	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුලාභීන් සංඛ්‍යාව
1.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්	1. 6 – 8 අප්‍රේල් 2. 12 – 14 ජනවාරි	02	48
2.	බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්	1. 18 – 20 ජුලි	01	26
3.	උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ව්‍යාප්ති නිලධාරීන්	1. 12 – 14 දෙසැ. (වවුනියාව)	01	31
		2. 13 – 17 දෙසැ. (යාපනය)	01	56
			05	161

විෂය පථය සහ අරමුණු:

කෘෂි ව්‍යාප්තිකරණයේ නවතම සංකල්පය වන, "අලෙවිකරණ ව්‍යාප්තිය" පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුබද්ධ එම ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාප්ති නිලධාරීන් සඳහා දැනුම ලබාදීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

පුහුණු කණ්ඩායම:

ආචාර්ය එල්.පී. රූපසේන මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	සම්බන්ධීකාරක
ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා	-	අධිපර්යේෂක
ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	පර්යේෂණ නිලධාරී
ආර්.ඒ.සී. ප්‍රියංකර මහතා	-	පර්යේෂණ නිලධාරී
එන්.පී.ජී. සමන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී
ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා	-	පර්යේෂණ නිලධාරී
එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

3. සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

විෂය පථය සහ අරමුණු:

මෙම පුහුණු වැඩසටහනේ පොදු පරමාර්ථය වූයේ, කෘෂිකාර්මික හා ග්‍රාම සංවර්ධන කටයුතු ක්ෂේත්‍රයේ නියැලි නිලධාරීන් හට සමාජ සජීවීකරණය හා සහභාගීත්ව සංවර්ධනය මූලික සංකල්පය හා ක්‍රම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමයි.

මෙම පුහුණු වැඩසටහන ප්‍රධාන වශයෙන් සකස් කරනු ලැබුවේ ගොවිකටයුතු හා ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයේ සමාජ සජීවීකරණ ක්‍රියාවලියට සම්බන්ධිත නිලධාරීන් සඳහා ය. මෙම පුහුණු වැඩසටහන් සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වයඹ ගැමි සවිය හා සබරගමු පළාත් සභාවට අයත් කෘෂිකර්ම හා ග්‍රාම

සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් ඇතුළත් වුණු අතර 2011 වර්ෂය තුළ සමාජ සජීවීකරුවන් 175 දෙනෙකු පුහුණු කොට ඇත.

වැඩසටහන පිළිබඳ විස්තරය :

සහභාගිවූවන්		දිනය	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුලාභීන් සංඛ්‍යාව
1.	සබරගමුව පළාත් සභාවට අයත් කෘෂිකර්ම හා සත්ත්ව සංවර්ධන නිලධාරීන්	2011.11.14 දින සිට 16 වන දින දක්වා	01	32
2.	වයඹ ගැමි සවිය යටතේ සේවය කරන ග්‍රාම සංවර්ධන නිලධාරීන්	2011.08.29 – 30 දින දක්වා	01	59
3.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්-තුවේ පර්යේෂණ හා ව්‍යාප්ති නිලධාරී-න් සඳහා	2012.05.09 දින සිට 11 දින දක්වා	01	31
4.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්-තුවේ කෘ.ප.නි.ස. නිලධාරීන් සඳහා	2012.12.14 – 16 දින දක්වා	01	53
			04	175

පුහුණු කණ්ඩායම:

එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	සම්බන්ධීකාරක
ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	අංශ ප්‍රධාන මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය
එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	පර්යේෂණ නිලධාරී
චතුර ජයම්පති ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරී
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	-	පර්යේෂණ නිලධාරී
එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

4. ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන: මාතර සහ අනුරාධපුර දිස්ත්‍රික්ක

ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ග්‍රාමීය ප්‍රජා සංවිධාන අතර විශාල වැඩ කොටසක් කළ හැකි නීතිමය වශයෙන් පනතකින් බලය ලැබී ඇති එකම ප්‍රජා සංවිධානය ගොවි සංවිධානයයි. දැනට ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන 14000 - 15000 ක් අතර ප්‍රමාණයක් පිහිටුවා තිබෙන බව විවිධ වාර්තා පැවතිය ද නිල සංඛ්‍යා ලේඛනවලට අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, ක්‍රියාත්මක ගොවි සංවිධාන ප්‍රමාණය 6000 ක් පමණ බව පෙනී යයි. එසේ වුව ද, මෙම ප්‍රමාණයෙන් වැඩි කොටසක් තමන්ගේ කාර්ය භාරය කුමක්ද යන්න හඳුනා නොගෙන කටයුතු කරන බවක් පෙනේ. මේ තත්ත්වය මත, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ග්‍රාමීය ක්ෂේත්‍රයේ වැදගත් සේවාවක් ඉටු කළ හැකි ගොවි සංවිධාන විශාල ප්‍රමාණයක් නිසි ප්‍රයෝජනයකින් තොරව පවතින නිසා ඒවා සජීවීකරණය කොට, සවිබලකරණයකට ලක් කිරීමෙන්, ඒවායේ උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා සුදුසු පරිසරයක් සැකසීමට මෙම පුහුණු වැඩසටහන සැලසුම් කොට ඇත.

මෙම පුහුණු වැඩසටහන මඟින් ප්‍රධාන වශයෙන්,

- සංවිධාන සාර්ථකත්වය සඳහා නායකත්වය
- සමාජ සජීවීකරණය
- ගොවි සංවිධානවල නෛතික පසුබිම හා කාර්යය භාරය
- ගොවි සංවිධාන පවත්වා ගත යුතු පොත්පත්
- නිරෝගී පරපුරකට වසෙන් විසෙන් තොර දේශීය ආහාර

යනා දී තේමාවන් රැසක් යටතේ ගොවි සංවිධානවල ප්‍රධාන නිලධාරීන් ඇතුළු කාරකසභිකයන් සඳහා එක්දින පුහුණු වැඩසටහනක් ලෙස පවත්වනු ලැබේ. මෙහි දී, අදාළ දිස්ත්‍රික්කවල සියළුම ගොවි සංවිධාන දැනුවත් කිරීම මඟින් සවිබල කිරීම මේ මඟින් සැලසුම් කොට තිබේ.

දැනට මෙම වැඩසටහන මාතර දිස්ත්‍රික්කයේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කොට ඇත.

මාතර දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන 600ක් පමණ තිබෙන බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිල වාර්තා අනුව තහවුරු විය. එම ගොවි සංවිධාන 600ම ප්‍රධාන නිලධාරීන්

ඇතුළු කාරක සභාවේ සියළු දෙනාටම මෙම පුහුණුව ලබාදීමට කටයුතු කොට තිබුණි. ඒ අනුව, ගොවි සංවිධානයකින් 12 බැගින් සංවිධාන 600ක 7200 දෙනෙක් පුහුණු කර ඇත. මේ වැඩසටහන එක් පුහුණු වාරයකට පුද්ගලයන් 60 බැගින් ගෙන 7200 වැඩසටහන් 120කින් සම්පූර්ණ කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැයට කිරුළ 2012ට පූර්වගාමීව ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක ගොවි සංවිධාන 1500ක් පමණ තිබෙන අතර එම සංවිධානවල ප්‍රධාන නිලධාරීන් වන සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනා සඳහා පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ගොවි සංවිධාන නිලධාරීන් 4500ක් පමණ පුහුණුවට ලක්විය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සියලු සංවිධාන කටයුතු සිදුකරනු ලබන අතර සම්පත්දායකයින් වශයෙන් ද ඔවුන්ගේ සේවය ලබාදෙන ලදී.

මෙම වැඩසටහන මඟින් අනුරාධපුර හා මාතර දිස්ත්‍රික්කවල ගොවි නායකයින් 11700 ක් පමණ දැනුවත් කිරීම් කොට ගොවි සංවිධාන 2100 ක් පමණ ක්‍රියාකාරී තත්ත්වයකට පත් කිරීමට 2011 වසරේ දී හැකි විය.

පුහුණු කණ්ඩායම:

ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	සම්බන්ධීකරණ නිලධාරි
එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
සී.පී.ජේ. ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරි
ජේ. දික්මාදුගොඩ මහතා	-	බාහිර සම්පත්දායක
ආර්.එම්. ජයතිලක මහතා	-	බාහිර සම්පත්දායක

5. ගොවි නායකයන් සවිබලගැන්වීමේ පුහුණු වැඩසටහන (සොබා දහම් කෘෂිකර්මය)

පුහුණු කණ්ඩායම:

ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	සම්බන්ධීකාරක
තිලක් කන්දේගම මහතා	-	සභාපති-ජාතික ගොවි සමුළුව (බාහිර සම්පත්දායක)
එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	පර්යේෂණ නිලධාරි
එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
පී.සී.ජේ. ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරි

සොබා දහම් කෘෂිකර්මය පිළිබඳ සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන විශේෂයෙන් සැලසුම් කොට තිබුණේ, සියළුම ගොවීන්, ගොවි නායකයන්, ක්ෂේත්‍ර මට්ටමේ සියළු නිලධාරීන්, ඍජුව හෝ වක්‍රව කෘෂි කර්මාන්තයට දායක වන සියළුම රාජ්‍ය නිලධාරීන් ප්‍රතිපත්ති සම්පාදකයන් මෙන් ම, දේශපාලන අධිකාරියට ද දැනුම ලබාදීම සඳහා සුදුසු ආකාරයට ය. මෙම වැඩසටහන එක්දින පුහුණු වැඩසටහනක් වන අතර අපේක්ෂිත ආකාරයට සියළුම පාර්ශවයන්ට ඉහළ දැනුම් සම්භාරයක් ලබාදීමට හැකිවන ආකාරයට වැඩසටහන ක්‍රියාත්මක විය.

වැඩසටහනේ අන්තර්ගතය :

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා එහි කාර්ය භාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- ගොවි සංවිධානවල සාර්ථකත්වය සඳහා නායකත්වය.
- ගොවි සංවිධානවල කාර්යභාරය හා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය.
- රසායනික පොහොර හා කෘෂි රසායන වලින් තොර කෘෂිකර්මයක්.
- ඉර, හඳ, තාරකා, අව්ව, වැස්ස භාවිතා කරමින් එදා අපේ මුතුන් මිත්තන් පෑ ආශ්චර්යය, කන්නට, කලට - කයියට ගොවිතැන කිරීම මත ලැබෙන ප්‍රතිඵල.

මෙම එක්දින පුහුණු වැඩසටහන, දේශන, සාකච්ඡා, වීඩියෝ දර්ශන හා ඉදිරිපත් කිරීම් රැසකින් සමන්විත ය. වැඩසටහන් අවසානයේ ඉතා විශාල මහජන ප්‍රතිචාර ලද අතර ඒ නිසාම මෙම වැඩසටහන සඳහා විශාල ඉල්ලීමක් ලැබුණි.

2011 වසර තුළ කාලය උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගනිමින් ගොවි සංවිධාන, විවිධ ආයතන, නිලධාරීන්, විශ්ව විද්‍යාල, පළාත් සභා වැනි ආයතන සඳහා වැඩසටහන් 82ක් පමණ දිවයින පුරා පැවැත්වූ අතර ඒ මඟින් ගොවීන්, නිලධාරීන්, දේශපාලන නියෝජිතයන් ඇතුළු 7775 දෙනෙකු පමණ පුහුණු කිරීමට හැකි විය. මෙම වැඩසටහන් සඳහා විවිධ කණ්ඩායම් සහභාගී වූ අතර ගොවි නායකයන්, ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්, උසස් නිලධාරීන්, ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, හමුදා භටයන් හා නිලධාරීන් මෙන් ම දේශපාලන නායකයන් ද සහභාගි විය.

එමෙන් ම, දිස්ත්‍රික්ක වශයෙන් ගතහොත් මාතර, ගාල්ල, හම්බන්තොට, මොණරාගල, මහනුවර, නුවරඑළිය, මාතලේ, පොළොන්නරුව, අනුරාධපුරය, රත්නපුර, මුලතිව් හා කොළඹ දිස්ත්‍රික්ක පදනම් කරගෙන පුහුණු වැඩසටහන් විශාල ප්‍රමාණයක් පවත්වන ලදී. මෙම වැඩසටහන් වලින් ලද දැනුම උපයෝගී කරගෙන ගොවි නායකයන්, ගොවි සංවිධාන, රාජ්‍ය නිලධාරීන් විශාල ප්‍රමාණයක් අත්හදා බැලීමේ පදනම මත සොබා දහම් කෘෂිකර්මය සඳහා 2011/12 මහ කන්නයේ වැඩ ආරම්භ කොට ඇත. මේ සඳහා අවශ්‍ය උපදෙස්, මඟපෙන්වීම හා අවශ්‍ය බීජ ලබා දීම නිරන්තරයෙන් ම කරනු ලබයි.

මෙයට අමතරව, කෘෂිකර්ම ඇමතිතුමාගේ උපදෙස් පරිදි මාතර දිස්ත්‍රික්කයේ කනංකේ ග්‍රාම නිලධාරී වසම ආදර්ශ සොබා දහම් කෘෂි ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම ආරම්භ කොට ඇත. මෙම ගම්මානය ආරම්භ කිරීමේ දී, මුල් අවස්ථාවල තරමක් පස්සට ගිය ගොවීන් දේශීය වී වගා කටයුතු සාර්ථක වී ඇති බැවින් ඉතා කැමැත්තෙන් වැඩ කටයුතු කරනු ලබන බව පෙනේ. දෙවන ආදර්ශ ගම්මානය වශයෙන්, රත්නපුර දිස්ත්‍රික්කයේ "දියවින්න" ගම තෝරාගත් අතර සබරගමුව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය යටතේ මේ ගම සංවර්ධනය කරන ලදී. මෙම ආදර්ශ ගම් දෙකෙහිම සියලු ගොවීන් කෘෂි රසායන හා රසායනික පොහොර මෙන් ම පිටරට බීජ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි.

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මෙම ව්‍යාපෘතිය සඳහා 50% සහනදායක මිලට දේශීය බීජ ලබා දුන් අතර ඉතිරි 50% හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය දරන ලදී. මෙම ආදර්ශ ගොවි ගම්මානයේ ගොවීන්ට බිත්තර වී නො මිලයේ ලබාදී ඇත්තේ, බිත්තර වී හුවමාරු ක්‍රමවේදයක් මඟිනි. ඒ අනුව, එක් බිත්තර වී බුසලකට නැවත බිත්තර

වී බුසල් 2ක් කන්නය අවසානයේ දී ආයතනයට ලබාදිය යුතු ය යන කොන්දේසිය මත ය. එම ලැබෙන බිත්තර වී නැවත වෙනත් ගොවීන්ට ලබා දීමට කටයුතු කෙරේ. එමෙන් ම, ගොවීන්ගේ අස්වැන්න ද බිත්තර වී සඳහා නැවත වෙළෙඳපොළේ මිලට වඩා වැඩි මිලකට මිල දී ගැනීමට ද සැලසුම් කොට ඇත.

දෙවන ආදර්ශ ගම්මානය වන රත්නපුර දිස්ත්‍රික්කයේ "දියවින්න" ගම්මානය සඳහා, සබරගමු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය අනුග්‍රහය දක්වන අතර දේශීය වර්ග වල බිත්තර වී නො මිලයේ ලබාදීමට කටයුතු කොට ඇත. මේ සඳහා සබරගමුව පළාත් සභාව රු. 100,000/- පමණ මුදලක් වටිනා බිත්තර වී ලබා දී තිබුණි. මෙයට අමතරව, ගොවීන් පුහුණු කිරීමේ, ව්‍යාප්ති සේවාවන් ලබාදීම යනාදිය ද සබරගමු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලැබී ය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මේ සඳහා අවශ්‍ය සියලු උපදේශන සේවාවන් ලබාදීම සිදු කරනු ලබයි.

සොබා දහම් කෘෂිකර්ම පුහුණු වැඩසටහනේ ප්‍රගතිය 2011

දිස්ත්‍රික්කය	පුහුණු වැඩසටහන් ගණන	පුහුණුලාභීන් ගණන
1. මාතර	22	1930
2. ගාල්ල	04	310
3. හම්බන්තොට	02	301
4. මොණරාගල	06	371
5. රත්නපුර	02	355
6. මාතලේ	17	1313
7. අනුරාධපුර	04	288
8. පොළොන්නරුව	08	988
9. නුවරඑළිය	04	695
10. මුලතිව්	04	410
11. කොළඹ	02	122
12. මහනුවර	07	691
	82	7774

මූලාශ්‍රය: මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය-HARTI

මෙම වැඩසටහන සඳහා විශාල වශයෙන් ඉල්ලුම් කළත්, කාලයේ සීමිත බව හා මූල්‍ය ප්‍රතිපාදන සීමිත බව නිසා වැඩසටහන් සීමා කිරීමට සිදුවිය. ඉහත වගුවේ මාතර දිස්ත්‍රික්කයේ වැඩසටහන් 22 සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අරමුදල් සපයන ලදී.

6. ගොවිජන සංවර්ධන නිලධාරීන් සඳහා හැකියා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන

පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව - 4
පුහුණුලාභීන් සංඛ්‍යාව - 153

(මාතර, කුරුණෑගල, අනුරාධපුරය හා ගාල්ල දිස්ත්‍රික්කවලට අනුයුක්ත ගොවිජන සංවර්ධන නිලධාරීන් සඳහා)

	සහභාගීවූවන්	දිනය	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුලාභීන් සංඛ්‍යාව
1.	කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නිලධාරීන්	1. 12 – 15 සැප්.	01	44
2.	ගාල්ල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නිලධාරීන්	10.10.11 – 13.10.11	01	47
3.	බදුල්ල සහ මොණරාගල ගොවිජන සංවර්ධන නිලධාරීන්	1. 31.10.11 සිට 03.11.2011	01	34
4.	මහනුවර දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නිලධාරීන්	21 – 24 නොවැ.	01	28
			04	**153**

විෂය පථය සහ අරමුණු:

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීමක් මත සැකසූ මෙම පුහුණු වැඩසටහන මඟින් ඉහත කී දිස්ත්‍රික් 4 හි ගොවිජන සංවර්ධන නිලධාරීන් සඳහා මෙම වැඩසටහන් පවත්වනු ලැබී ය. තිරසාර කෘෂිකර්ම සංවර්ධනයක් උදෙසා ග්‍රාමීය ගොවි ප්‍රජාව සමඟ සෘජුව කටයුතු කරන්නා වූ ගොවි ජන සංවර්ධන නිලධාරීන්ගේ හැකියා වර්ධනය ඉලක්ක කොටගත් මෙම වැඩසටහන

තුළින් සමාජ සජීවීකරණ කාර්ය භාරය, සහභාගීත්ව ප්‍රවේශය මෙන් ම රාජකාරි කටයුතු වල දී නිතර මුහුණ දෙන ප්‍රධාන ගැටලු වන නීතිමය ගැටලු, මූල්‍යමය ගැටලු හා ටෙන්ඩර් පටිපාටීන් සම්බන්ධ දැනුම ලබාදීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

පුහුණු කණ්ඩායම:

එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	සම්බන්ධීකාරක
ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	අංශ ප්‍රධාන
ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා	-	අධිපර්යේෂක
එස්.එම්.ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	සහාය අධිපර්යේෂක
පී.සී.ජේ. ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරි
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	-	පර්යේෂණ නිලධාරි
එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි

7. සංවර්ධන කතිකාවත

2011 වසරේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය මඟින් සංවර්ධන කතිකාවත වැඩසටහන් දෙකක් පවත්වන ලදී. මෙහි පළමුවන වැඩසටහන පරිගණක භාවිතයේ සරල බව සහ නිතරම අවශ්‍ය වන නඩත්තු දැනුම තේමාව මත විය. මෙම වැඩසටහන පරිගණක භාවිතා කරන ලොකු කුඩා කාටත් ඉතාම වැදගත් වටිනා වැඩසටහනක් විය. මෙම වැඩසටහන මඟින් ආයතනයේ පරිගණක භාවිතා කරන අයගේ නො දැනුවත්කම මත ඇති කරගෙන තිබූ බිය නැති කිරීමට හැකි වූ අතර සුළු දෝෂයක් ඇති වූ විට එය හඳුනා ගැනීමට හා ඒ සඳහා අවශ්‍ය පිළියම් පිළිබඳ දළ අදහසක් ලබා ගත හැකි විය.

මෙහි, දෙවන සංවර්ධන කතිකාවත වැඩසටහන වෙන් කරනු ලැබුවේ ළමා හා කාන්තා කාර්යාංශය මඟින් මෙහෙයවන "පූර්ව ළමාවිය සංවර්ධනය" යන මාතෘකාවට ය.

මෙම සංවර්ධන කතිකාවත වැඩසටහනට දරුවන් සිටින සෑම අයෙකුට සහභාගී වීමට අවස්ථාව ලබා දුන් අතර එම වැඩසටහන මඟින් ළමා මනස, ළමාවිය පිළිබඳ විශාල තොරතුරු සමුදායක් දෙමාපියන්ට ලබා දීමට අවස්ථාව ලැබුණි. මෙම වැඩසටහන කාගේත් ප්‍රසාදයට ලක් වූ අතර ඒ

තුළින් අනාගතය භාරගැනීමට සිටින දරුවන් වෙනුවෙන් දෙමාපිය වගකීම් පිළිබඳ පැහැදිළි අවබෝධයක් ලබාදෙන ලදී.

2011 වසර තුළ මෙම "සංවර්ධන කතිකාවත" වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට සැලසුම් කළ ද, මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශයේ කාර්ය බහුලතාව මත ඉතිරි වැඩසටහන් කළමනාකරණය කරගැනීමට නො හැකි විය.

8. දැයට කිරුළ - 2012 කෝණකුඹුක් වැව ග්‍රාම සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘති කණ්ඩායම:

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර	-	අධ්‍යක්ෂ
ආචාර්ය එල්.පී. රූපසේන	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
ආචාර්ය එම්.එස්. සේනානායක	-	අංශ ප්‍රධාන
ඊ.ඒ.සී. ප්‍රියංකර මහතා	-	පර්යේෂණ නිලධාරි
සී.යූ. සේනානායක මහතා	-	ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි
එම්.එන්.එම්. නලීම් මහතා	-	සංඛ්‍යාන සහකාර

පසුගිය දශක තුනක කාලයක ආයතනය විසින් සිදු කළ පර්යේෂණ ඔස්සේ සොයාගත් දැනුම උපයෝගී කරගනිමින් කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ආදර්ශනයක් ආරම්භ කොට ඇති අතර එහි යටිතල පහසුකම් වර්ධනය, යෙදවුම් ලබාදීම, සහාය සේවාවන් පැවැත්වීම, සැකසුම හා අලෙවිය ආදි සංවර්ධන කළ යුතු අංශ කෙරෙහි ඉලක්ක කරන ලදී. මෙයට අමතරව, කෘෂි නොවන ආර්ථික ක්‍රියාදාමයන් නැංවීමට ද මෙමගින් අපේක්ෂා කෙරුණි.

2012 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මෙම ආදර්ශනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෝණකුඹුක්වැව ගම්මානයේ ක්‍රියාත්මක කිරීමට ආයතනය තීරණය කෙට ඇත. මේ අනුව, ගම්වාසීන්ගේ සහභාගීත්වයෙන් සහභාගීත්ව ගැමි පිවිසුමක් මගින් ක්‍රියාත්මක සැලසුමක් සකස් කළ අතර ඒ අනුව, ගමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. මේ අනුව, අදාළ රාජ්‍ය ආයතන සහයෝගයෙන් වැඩසටහන් කිහිපයක්ම වසර අවසාන වන විට අවසන් කිරීමට හැකි විය. ඒ අතර ගමේ ඇති ප්‍රධාන වැව් 5 ප්‍රතිසංස්කරණය කිරීම, කෘෂි මාර්ග ඉදි කිරීම, ගෙවතු 138ක්

ආරම්භ කිරීම, වැසි ජලය රැස්කිරීමේ ටැංකි 10ක් අලුතින් ඉදිකරදීම හා දැනට පවතින ටැංකි 38ක් ප්‍රතිසංස්කරණය කිරීම, ගමේ පාසල ප්‍රතිසංස්කරණය, ස්වයං රැකියා අවස්ථාවන් ඇති කිරීම, ගම්මුන් අතර බෙදා දීම සඳහා අඹ පැල තවානක් ඇති කිරීම, දිගු කල් පැවති අලි මිනිස් ගැටුමට පිළියමක් වශයෙන් ජීව තල් වැටක් ඉදිකිරීම සඳහා තල් පැල තවානක් ඇති කිරීම ප්‍රධාන විය. මෙහි දී ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වූයේ, වැඩසටහන සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා නිරීක්ෂණ කිරීමට අදාළ කාර්යයන් ය.

මගේ අංකය:8/10/ ෆො 3,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
උරුබොක්ක.
2011.12.06.

පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය,
ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය
காணி, மாகாண நீர்ப்பாசன விவசாய, கால்நடை உற்பத்தி மற்றும் கால்நடைச் சுகாதாரம், விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகார அமைச்சு
Ministry of Land, Provincial Irrigation, Agriculture, Animal Production & Animal health, Sports and Youth Affairs
සබරගමුව පළාත් සභාව
சப்பிரகமுவ மாகாண சபை
Sabaragamuwa Provincial

අධ්‍යක්ෂ ලලිත් කාන්ත ජයසේකර,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
අංක.114,
විජේරාම මාවත,
කොළඹ.07.

2012 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා.

අධ්‍යක්ෂ තුමනි ඔබ තුමාගේ ප්‍රධානත්වයෙන් ගොවිජන සේවා ...
මාතර දිස්ත්‍රික්කය තුල 2011 වර්ෂය පුරාම ගොවිජන සේවා ...
කරන ලද පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ ...
උත්සාහය ඉතාම සාර්ථක වූ බව උරුබොක්ක ...
කැමැත්ත වෙමි.
2011 වර්ෂය තුල එවැනි ගොවි...
ආකල්පමය වශයෙන් වි...

1) පාරම්පරික දැනුම ...
දියුණු කිරීම.

2) පරිසරය ආරක්ෂා කි...
ආරක්ෂා ...

Sanasa Bank - Ukuwela
සණස බැංකුව - උකුවෙල
Tele: 066-2244063, 066-4932266, 066-5678233, 066-2242220, Conference Hall 066-5677539
Fax: 066-2243277 E-Mail: sanasabkuk@sltnet.lk
SANASA Ukuwela Established Under the Cooperative Societies Act No. 05 of 1972
ISO 9001:2008 CERTIFICATE No. QSC 0281

OUR NO: උකෙ/IFA1/සං/2011
YOUR NO:

2011.01.11

ලලිත් කාන්ත ජයසේකර මහතා
අධ්‍යක්ෂ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.

මහත්මයාණෙනි,

සොබාදම් ගොවිතැන මාතලේ දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත කරවීම උදෙසා අවශ්‍ය සහයෝගය ඔබ ආයතනයෙන් ලබා ගැනීම සම්බන්ධවයි

ශ්‍රී ලංකා ... දුක්ඛ දෝමනස්සයන් සහනාලන මාර්ගෝපදේශකයෙකු ... උකුවෙල සණස බැංකුව ප්‍රදේශයට පමණක් ... රැසක් ඉටු කරමින් ගෞරව බහුමානයට පාත්‍ර වූ ...

දැනට අප ආයතනය සොබාදම් ගොවිතැන ව්‍යාප්ත කරමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ... කෘෂිකාර්මික වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන පාරිසරික ... සංවර්ධන කටයුතු ජාතික ගොවි සමුළුවේ සභාපති, පරිසරවේදී ... මහතාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. එතුමා අප පාරිසරික ගොවිපල සහ ... පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය.

මාතලේ දිස්ත්‍රික්කයේ රජයේ සේවකයින්, ගොවි මහතුන්, විද්‍යාල ගුරු භවතුන්, විද්‍යාල ශිෂ්‍යයින් හා ... ජනතාව විශාල වශයෙන් සොබාදම් ගොවිතැන පිළිබඳ දේශන හා ප්‍රායෝගික පුහුණුවීම් අප ... ආයතනයෙන් ඉල්ලා ඇත. මේ සඳහා ඔබ ආයතනයේ මූලිකත්වයෙන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන්ගේ ... උපදෙස් අනුව අවශ්‍ය සහයෝගය බලාපොරොත්තු වන බව අප ගරු අධ්‍යක්ෂ මණ්ඩලය, මහ සභාව ... තීරණය කර ඇත. ඔබ ආයතනය මැදිහත් වීමෙන් දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන්හි සිදු කරමින් පවතින ... කෘෂිකාර්මික විප්ලවය පිළිබඳව සොබාදම් ගොවිතැනට ආදරය කරන පිරිසක් ලෙස අපි සතුටු වන්නෙමු.

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කරවීමට යන ගමනේ දී සොබාදම් ගොවිතැන තුලින් ... කෘෂිකාර්මික ආශ්චර්යය මුළු ලෝකයාටම පෙන්වීමට අප යන ගමනේ දී මෙම ජාතික යුතුකම අප

02 පිටුවට

නන්දිමිත්‍ර ඒකනායක (පා.ම.)
උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය
NANDIMITRA EKANAYAKE (M.P.)
DEPUTY MINISTER OF HIGHER EDUCATION

හිතවත් ලලිත් කාන්ත ජයසේකර මහතා,
අධ්‍යක්ෂක,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ-07

ප්‍රිය මහත්මයාණෙනි

සොබාදම් ගොවිතැන පිළිබඳ ...

ඔබතුමාගේ 2011/01/20 T/3/2011 දිනැති ලිපිය හා ... ඉතා තරුණ පිළිබඳ මා විසින් කරන ... ස්තූතිය ප්‍රකාශ කරමි ...

මෙම වැඩමුළුව මාලාව තුළින් සපුව ... සඳහා ගොවි නිලධාරීන්, ගුරුවරුන් වෙත ඉතා ... ලබා ගත් කරුණකි.

මෙම වැඩ සටහන ඉතාමත් ... නිරතුරුව සූදානම් සිටින අතර අවශ්‍ය සහය ... මහතා (071-8079747) අමතා අවශ්‍ය සහය ...

මේ වෙනුවෙන් දක්වන නිරන්තර ...

මෙයට හිතවත්,

විශ්වකීර්ති නන්දිමිත්‍ර ඒකනායක (පා.ම.)
උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය,

පිටපත : ගොනුවට - ද.ග.පි

නන්දිමිත්‍ර ඒකනායක ... උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමා... අංක.33/21, ඔලුවත්ත පාර, මාතලේ

කාර්යාලය | அலுவலகம் | Office
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
Ministry of Higher Education 18, Ward Place, Colombo 07
දුරකථන | Telephone : 011 3091240 - 011 2685268
ෆැක්ස් | Fax : 011 2682612 - 011 2682610

Ministry of Yout...
ජාතික තරුණ...
தேசிய இளைஞர்
National Youth

ඔබේ අංකය:
தங்கள் இல.
Your Ref:

අංකය :- මාර/දිකා/අ.ව.ඨ.න

ඇ. ලලිත් කාන්ත ජයසේකර මැතිතුමා,
...ක්ෂක,
...ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ ආයතනය
...ළඹ.

හිතුමනි

ගවතුවගා පුහුණු වැඩසටහන - 2011

...ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධ මාතර ... කටයුතුවල නියැලීමට රුචිකත්වයක් දක්වන සහ ... සඳහා පසුගිය දිනයන්හිදී ඔබ ආයතනය හා එක්ව ...

මෙම වැඩසටහන් මාතර දිස්ත්‍රික්කයේ විවධ ස්... ක්‍රියාවලියට මහත් පිටුවහලක් වූ බව පෙන්වා දෙන ... වූ බවද කාරුණිකව දන්වා සිටිමි.

විශේෂයෙන් අපගේ ඉල්ලීම පරිදි මෙම වැඩස... සම්පත්ධාරීන්ගේ දායකත්වය ලබාදෙමින් ඔබතුමන් ... අගය කරන අතර, ඒ වෙනුවෙන් ස්තූතිය පල කර සිටි...

තවද මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා වැ... ඉවුකල ආචාර්ය එම්.එස්. සේනානායක මැතිතුමා ඇතු... සඳහන් කරමි.

ස්තූතියි
මෙයට - විශ්වාසී

එන්.රණසිංහ
සහකාර අධ්‍යක්ෂ (මාතර),
ජාතික තරුණ සේවා සභාව,
දිස්ත්‍රික් කාර්යාලය,
මාතර. 2011.07.15 දින

පිටපත :- සභාපති/අධ්‍යක්ෂ ජෙනරාල් - ජා.ත.සේ සභාව - කා.දැ.පි

Chairman/Director General
Office
email : info@srilankayouth.lk
Web : http://www.srilankayouth.lk
Facebook : srilankayouthgroup

... දෙදෙනකු පමණ ... යටතේ දෙහිඕවිටකන්ඩිය ප්‍රාදේශීය ලේකම් කො... ප්‍රදේශයේ සිටින සම්පත් දායකයින් යොදවා පුහුණු වැඩසටහන් පවත්වන අතර, ... කෘෂිකාර්මික ව්‍යාපෘතින් හි නියැලී සිටි. මෙම ප්‍රතිලාභී ... දැනුම අනුසාරයෙන් බොහෝ පිරිසක් සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ආර්ථික වශයෙන් ද ස්... තත්ත්වයකට පත්ව ඇත. ඒ තුළින් ලබා...

2.) රසායනික ද්‍රව්‍ය තුළින් ඇත් වී පාරම්පරික හා පරිසරයට හිතකර ආකාරයට කාබනික පොහොර භාවිතා කර වගා කටයුතු සිදු කරන ආකාරය හා ඒ තුළින් වැඩි අස්වැන්නක් නෙලාගැනීමට හැකිවන පරිසර හිතකාමී පිරිසක් බිහිකිරීම මෙන්ම වසවිෂ වලින් තොර එළවළු පළතුරු නිෂ්පාදනයටද ඔවුන් දායක වී ඇත. එය වඩාත් දියුණු කරගැනීම සඳහා අනාදිමත් කාලයක සිට අප රටේ පැවැති පරිසර හිතකාමී යහපත් දේ එක් කරමින් රසායනික කර්මාන්තයට අභියෝග කරන පාරිසරික කර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා අදහස් කරගෙන සිටින අතර, ඒ සඳහා සබරගමු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය පරිසරවේදී තිලක් කන්දේගම මහතාගේ සම්පත් දායකත්වය යටතේ පුහුණු වැඩසටහනක් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

(බී.පී.එම්. හේමන්ත කුමාර),
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිටකන්ඩිය

පිටපත්
1.) එන්.පී. වසන්ත පුෂ්ප කුමාර මහතා
කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර

2011.12.09 දිනැති ඔබේ ලිපියට අනුව වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සඳහා

අනෙකුත් ක්‍රියාකාරකම්

ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම

ජේ. කේ. එම්. ඩී. චන්ද්‍රසිරි මහතා "ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන් හි ඉඩම් භුක්ති ක්‍රමය, එහි වෙනස්වීම හා අනාගත අයිතිය සම්බන්ධ අභියෝග" යන මැයෙන් ගොවි කටයුතු අධ්‍යයන සඟරාවෙහි 10 වෙළුම, 1 කලාපය, 2011 සඳහා ලිපියක් සම්පාදනය කරනු ලැබිණ.

එම්.කේ.එන් දමයන්ති මෙනවිය ගොවි කටයුතු අධ්‍යයන සඟරාවේ 10 වෙළුමේ 1 කලාපය (2011) සඳහා විමධ්‍යගතකරණ භාවිතය තුළ සේවා සැපයීම සහ සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය: ඉඩම් විෂයය ආශ්‍රිත අධ්‍යයනයක් යන මැයෙන් ලිපියක් පළ කළා ය.

එච්. ටී. පද්මජානි මෙනවිය ගොවි කටයුතු අධ්‍යයන ශාස්ත්‍රීය සඟරාවේ 14 වන වෙළුමේ අංක 1 සහ 2 සඳහා "ශ්‍රී ලංකාවේ වී වගා ක්ෂේත්‍රයේ වර්ධන සහ ව්‍යුහාත්මක වෙනස්වීම: ස්වතන්ත්‍රනයට පෙර සහ පසු කාල වකවානු අතර සංසන්දනයක්" යන මාතෘකාවෙන් ලිපියක් සම්පාදනය කරන ලදී.

එම්. ඩී සුසිලා ලූර්දු මහත්මිය ගොවි කටයුතු අධ්‍යයන සඟාරාවේ 10 වෙළුමේ 1 කලාපය (2011) සඳහා ශ්‍රි ක්‍රමය, එහි කාලීන වැදගත්කම හා ප්‍රචලිත කිරීමේ දී මතුවන ගැටලු යන මැයෙන් ලිපියක් පල කළා ය.

ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මිය ශ්‍රී ලංකා කෘෂි ආර්ථික විද්‍යාඥයින්ගේ පස් වන පර්යේෂණ සමුළුව සඳහා "සම්මත වර්ෂාපතන දර්ශකය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදන ප්‍රදේශ වල පවතින නියං තත්ත්වය පිළිබඳ ආනුභාවික විශ්ලේෂණය යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් සහ "ශ්‍රී ලංකාවේ එළවළු අලෙවිකරණයේ දී මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කාර්යභාරය" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

එම්. ඩබ්. ඒ. සී. එස්. විජේතුංග මහත්මිය 2011 නොවැම්බර් 09 දින රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පවත්වන ලද කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ අන්තර් ජාතික සම්මේලනයේ දී, "ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග වල ආනයන බදු පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත්

කරන ලදී. එමෙන් ම, 2011 දෙසැම්බර් 09 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පවත්වන ලද ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික විද්‍යා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකාවේ වී වගා නිෂ්පාදන අංශයේ වෙළෙඳ අනුපාතය" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

ටී. ඒ. ධර්මරත්න මහතා සහ පූජ්‍ය විමලරත්න ස්වාමීන් වහන්සේ කෘෂිකාර්මික අලෙවිකරණ සංඛ්‍යා : ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණයේ දී පවතින ගණුදෙනු පිරිවැය ගණනය කිරීම පිළිබඳ ගැටලුව යනුවෙන් පර්යේෂණ පත්‍රිකාවක් http:/ 4th Wy econferencerio.ibge.gove.br/images/papers/56-poster_40_Dharmaratne_wimalaratna.pdf අන්තර්ජාල වෙබ් අඩවියේ පළ කොට ඇත. හතරවන කෘෂිකාර්මික සහ ග්‍රාමීය ගෘහවල සංඛ්‍යා ලේඛන පිළිබඳ සම්මන්ත්‍රණය, රියෝ ද ජෙනිරෝ, බ්‍රසීලය 9-11 නොවැම්බර් 2011.

ටී. ඒ. ධර්මරත්න මහතා "ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කෘෂිකාර්මික අංශයේ පවතින උදාසීනත්වය පිළිබඳ අවබෝධ කර ගැනීම: නව ආයතනික ආර්ථික විද්‍යාව පිළිබඳ විශ්ලේෂණයක්" යනුවෙන් පර්යේෂණ පත්‍රිකාවක් "ආසියාවේ කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික අභියෝගතා" යන මැයෙන් ආසියානු කෘෂිකාර්මික ආර්ථික විද්‍යාඥයින්ගේ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා වන සම්මේලනය සඳහා ඉදිරිපත් කරන ලදී. 2011 ඔක්තොම්බර 13-15 හැනෝයි, වියට්නාමය.

ආචාර්ය වික්‍රමසිංහ මහත්මිය ජාතික විද්‍යා පදනමේ පැවති සම්මන්ත්‍රණයක දී ආහාර සුරක්ෂිතතාවය හා ආර්ථික වර්ධනය මැයෙන් දේශනයක් පැවැත්වීම සහ CAPSA – UNESCAP ආයතනය මඟින් සංවිධානය කරන ලද ආහාර සුරක්ෂිතතාවය හා දිළිඳුකම පිටුදැකීම සඳහා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්පාදනයේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳව සිදු කරන ලද වැඩමුළුවක් සඳහා සම්පත්දායකයෙකු ලෙස සහභාගිවීම.

කමිටු උපදේශකත්වය

ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මිය ඇළ වේලි වල සුරක්ෂිතතාවය හා ජල සම්පත් දියුණු කිරීම පිළිබඳ ලෝක බැංකු ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කමිටුවේ උපදේශිකාව ලෙසත්, ජාතික විද්‍යා පදනමේ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ කමිටුවේ සමාජිකාවක් ලෙසත්, විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙසත් කටයුතු කිරීම.

එම්. එම්. එම්. අහියර් මහතා ලංකා වැසි දිය රැස්කරන්නන් ගේ සංසදයේ උප සභාපති ලෙසත්, ලංකා ජලනි හි නියාමන කමිටු සමාජිකයෙකු ලෙසත්, තරුණ විද්‍යාර්ථීන් ගේ සංසදයේ වාර්ෂික සමුළුවේ විමර්ශක කමිටු සමාජිකයෙකු ලෙසත්, සභාවාරයේ තීරකවරයෙකු ලෙසත් කටයුතු කරන ලදී.

ජී. ජී. ද. එල්. ඩබ්. සමරසිංහ මහත්මිය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමෙ හි තරුණ විද්‍යාර්ථීන් ගේ සංසදයෙහි නියාමන කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කළේ ය.

එම්. ඒ .සී එස්. බණ්ඩාර මහතා ජාතික අධ්‍යාපන ආයතනයේ උසස් පෙළ කෘෂි තාක්ෂණය විෂය මාලා සංවර්ධන කමිටු සමාජිකවරයෙකු ලෙස සේවය කරන ලදී.

සී. පී. හතුරුසිංහ මහත්මිය රජයේ හමුදා රෝහලේ හා බන්ධනාගාර සඳහා ආහාර මිල දී ගැනීමේ හා ඇගයීමේ තාක්ෂණික කමිටුවට වසර පුරා සහභාගී විය. එමෙන් ම, වෙළෙඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ කමිටුවට වසර පුරා සහභාගි විය.

ආචාර්ය ටී. ඒ. ධර්මරත්න මහතා මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය භාරකරුවෙකු ලෙස එම මධ්‍යස්ථාන භාරකාර මණ්ඩලයේ රැස්වීම් සඳහා වසර පුරා සහභාගි විය.

ආර්. පී. විදානපතිරණ මහත්මිය එළවළු, පළතුරු, බිත්තර සහ මස් සඳහා ශීත ගබඩා පහසුකම් සැපයීම හා ඉදි කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන පිළිබඳ කමිටුවේ සාමාජිකාවක ලෙස කටයුතු කළ අතර එම කමිටුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. එම කමිටුව සඳහා එහි අවශ්‍යතාවය පිළිබඳ වාර්තාවක් 2011 මැයි-ජූනි ඉදිරිපත් කරන ලදී.

ඩබ්.එච්.දුමින්ද ප්‍රියදර්ශන මහතා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ ලෝක ආහාර වැඩසටහන මගින් මෙහෙය වන ලද උතුරුමැද, උතුරු හා නැගෙනහිර පළාතේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ඇගයීමේ හා තොරතුරු එකතු කිරීමේ අධ්‍යයනයේ දි පොළොන්නරුව, අනුරාධපුරය හා මඩකලපුව දිස්ත්‍රික්කයන් හි කණ්ඩායම් නායකයෙකු ලෙස කටයුතු කරන ලදී.

විශේෂිත වාර්තා

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් සිදුකරන ලද ආසියා හා පැසිපික් කලාපයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධනය පිළිබඳ ආයතනයේ පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය මැයෙන් අධ්‍යයන වාර්තාවක් සකස් කරන ලදී.

ආර්.පී. විදානපතිරණ මහත්මිය එළවළු වල වර්තමාන මිල තත්ත්වය යනුවෙන් කෙටි සංක්ෂිප්ත වාර්තාවක් 2011 මාර්තු මස කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ශ්‍රම සංවර්ධනය සහ දරිද්‍රතාවය දුරලීම සඳහා වූ විශේෂිත පර්යේෂණ හා පුහුණු ආයතනය යනුවෙන් වාර්තාවක් ආසියා හා පැසිපික් කලාපයේ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය වෙත් ඉදිරිපත් කරන ලදී.

කෘෂිකර්ම ඇමතිතුමා ගේ ඉල්ලීම පරිදි, පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ නිලධාරින් විසින් සාහිත්‍ය විමර්ශනයක් සිදු කොට පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීම පිළිබඳ වාර්තාවක් පිළියෙල කරන ලදී.

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද සූර්ය බල බිංදු ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පිළියල කරන ලදී.

පී. ආර්. වීරක්කොඩි මහත්මිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැද කන්නයේ මුං වගාව පිළිබඳ අධ්‍යයනයක් කොට එම සොයා ගැනීම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

අර්තාපල් වෙළෙඳපොළෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සී. පී. හතුරුසිංහ මහත්මිය, ඩබ්.ඒ.එන්.විජේසූරිය මහතා සහ යූ.ඒ.එස්.එදුස්සූරිය මහතා එකතුව පිළියෙල කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ජනවාරි මාසයේ දි භාරදෙන ලදී.

ශ්‍රී ලංකාවේ වී සහ සහල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් සී.පී. හතුරුසිංහ මහත්මිය, ඩබ්.ඒ.එන්.විජේසූරිය මහතා සහ යූ.ඒ.එස්.එදුස්සූරිය මහතා විසින් පිළියෙල කොට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත මාර්තු මාසයේ දි භාරදෙන ලදී.

පශ්චාත් උපාධි හා උපාධින් හි සුපරීක්ෂකයින් වශයෙන් කටයුතු කිරීම

ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මිය පේරාදෙණිය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයන් විසින් සකසන ලද පශ්චාත් උපාධි නිබන්ධන සඳහා පර්යේෂණ අධීක්ෂකයෙකු මෙන් ම පරීක්ෂකයෙකු ලෙස සහ රුහුණු විශ්ව විද්‍යාලයේ සහ රජරට විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයන් විසින් සකසන ලද උපාධි නිබන්ධන සඳහා පර්යේෂණ අධීක්ෂකයෙකු මෙන් ම පරීක්ෂකයෙකු ලෙස සේවා සපයන ලදී.

පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගිත්වය

එච්.ජී.ජී. සමන්ත මහතා විසින් ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු නිෂ්පාදනය හා වෙළෙඳපොළ පිළිබඳ දේශනයක් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත 2011 නොවැම්බර් 24 දින පවත්වන ලදී.

ඩබ්. එච්. ඩී. ප්‍රියදර්ශන මහතා විසින් ශ්‍රී ලංකාවේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය සඳහා ආහාර අර්බුදයේ බලපෑම යනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ දෙ වැනි හා තෙ වැනි වසර වල විශේෂ හා සාමාන්‍ය උපාධි පාඨමාලා හදාරන සිසුන් සඳහා දේශනයක් 2011 දෙසැම්බර් මස පවත්වන ලදී.

ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා විසින් ලෝක ආහාර අර්බුදයේ අභියෝගතා සහ අවස්ථා යනුවෙන් එයිට්කන් ස්පෙන්ස් පුද්ගලික සමාගමේ හෝටල් කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා දේශනයක් 2011 දෙසැම්බර් 13 දින පවත්වන ලදී.

"දිවි නැගුම" වැඩසටහනේ ක්‍රියාත්මක වැඩපිළිවෙළ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා උඩුබද්දාව, පස්යාල සහ මිල්ලනිය ගොවිජන සේවා මධ්‍යස්ථාන වල දී පැවැත් වූ වැඩසටහන් සඳහා කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ සියලුම පර්යේෂණ නිලධාරීන් සහභාගි වීම.

කෝණකුඹුක්වැව ග්‍රාම සංවර්ධන වැඩසටහනේ කාන්තා සංවර්ධන කටයුතු සඳහා කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරින්ගේ දායකත්වය ලබා දීම.

- කාන්තා සංවර්ධන හා ළමා අභිවෘද්ධි අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය සිදු කිරීම
- 'දිරිය ශක්ති' කාන්තා කාර්ය සංවිධානය පිහිටු වීම හා චක්‍රිය අරමුදලක් ආරම්භ කිරීම
- ආදායම් උත්පාදන කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- කාන්තාවන්ගේ අත්කම් හා නිර්මාණ ඇතුළත් ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම

පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය, ඉන්දියාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ජාතික ආයතනය (NIRD) සමඟ සහයෝගයෙන් "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන උත්සාහයන් පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහන" 2011 වසරේ දෙසැම්බර් 11–17 දක්වා වූ කාලය තුළ සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී. මෙම වැඩසටහන සඳහා, NIRD හි අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් හත් දෙනෙකු සහභාගී විය.

දැයට කිරුළ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝණකුඹුක්වැව ග්‍රාමයෙහි පානීය ජල ගැටලුවට විසඳුමක් ලෙස, වැසි දිය රැස්කිරීමේ ව්‍යාපෘතියක් සහ අලි මිනිස් ගැටුමට විසඳුමක් ලෙස තල් වැටක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙම අංශය විසින් සාර්ථකව දියත් කරන ලදී.

සහායක අංශ
පර්යේෂණ හා පුහුණු

දත්ත සහ තොරතුරු කළමණාකරණ ඒකකය

මෙම ඒකකය, දත්ත බැංකුවකින් හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මෙන් ම දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කරන අංශයන්ගෙන් සමන්විතය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් මෙන්ම විවිධ ආයතනයන්ගෙන් ලබා ගන්නා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දත්ත සහ තොරතුරු දත්ත බැංකුවෙහි අන්තර්ගත වේ. දත්ත බැංකුවෙහි ප්‍රධාන අරමුණ වන්නේ, විවිධ මූලාශ්‍ර වලින් ලබා ගන්නා වූ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යාත්මක දත්ත ගබඩා කිරීමත් අවශ්‍ය අය සඳහා තොරතුරු ලෙස ඒවා නැවත ලබාදීමත් ය. ආයතනය සඳහා වූ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට අදාළ වාර්ෂික සැලසුම් සකස් කරනු ලබන්නේ, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කාණ්ඩය මගිනි. පර්යේෂණ ව්‍යාපෘති වලට අදාළ දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන්නේ දත්ත විශ්ලේෂණ කාණ්ඩයෙන් ය. 2011 වර්ෂයේ මෙම ඒකකය මගින් කරන ලද කාර්යයන් පහත දැක් වේ.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුව සඳහා අවශ්‍ය සමාජ-ආර්ථික පර්යේෂණ සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වලදී ඊට අදාළ පහසුකම් සපයන අරමුණ දත්ත බැංකුව තුළ පවතී. ආයතනයේ පර්යේෂණ නිළධාරීන් විසින් සිදු කරනු ලබන සමාජ-ආර්ථික පර්යේෂණ මගින් ලබා ගන්නා තොරතුරු ඇතුළත් වටපිටාවක් තුළ දත්ත බැංකුව ස්ථාපනය කොට ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික තත්ත්වයන්ට අදාළ, දත්ත එකතු කිරීම සහ ගබඩා කිරීමත් දත්ත බැංකුව මගින් කරනු ලබන අමතර කාර්යයකි.

දත්ත බැංකුව මගින් කරනු ලබන කාර්යයන් ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන කරුණු වලට සම්පිණ්ඩනය කළ හැකිය.

1. දත්ත එකතු කිරීම.
2. දත්ත කේත ගත කිරීම.
3. දත්ත වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
4. දත්ත ගබඩා කිරීම.
5. දත්ත නැවත ලබා ගැනීම.
6. දත්ත විශ්ලේෂණය.

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි ආයතන වලට අදාළ වෙබ් අඩවි වලින් මෙන් ම එම ආයතන වලින් ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශන මඟින් දත්ත බැංකුවට අදාළ තොරතුරු එකතු කරනු ලැබේ. මෙම වසරේ දී පරිගණක අක්‍රියතාවයට පත් වීම නිසා, ඊට අදාළ පරිගණක වැඩසටහන් වෙනස් කරන ලදී.

යාවත්කාලීන කරන ලද දර්ශන

පසුගිය වසර තුළ, දත්ත බැංකුව විසින් එකතු කරන ලද, කේත ගත කරන ලද මෙන් ම පරීක්ෂාවට ලක් කරන ලද දත්ත මෙසේය.

1. මිල ගණන් - තොග මිල, සිල්ලර මිල හා නිෂ්පාදන මිල -2010
2. අපනයන - 2010
3. ඉඩම් භාවිතය - 2010 යල වී වගා කරන ලද ඉඩම් ප්‍රමාණය
   - අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කරන ලද බිම් ප්‍රමාණය 2010 යල , මහ
4. බෝග රැක බලා ගැනීම - නෙළන ලද බිම් ප්‍රමාණය - 2010 යල - වී
5. නිෂ්පාදනය - වී නිෂ්පාදන ප්‍රමාණය 2010 යල, අනෙකුත් ක්ෂේත්‍ර බෝග 2010 මහ,යල
6. කෘෂි රසායන භාවිතය, නිෂ්පාදන වියදම, ආදායම

2011වසර තුළ එකතු කරන ලද දත්ත ප්‍රමාණය මෙන් ම නිවැරදිතාවය පරීක්ෂා කරන ලද දත්ත ප්‍රමාණය 46422ක් සහ 45000ක් වේ. පරිගණක ඡායා සඳහා 44070ක ප්‍රමාණයන් එකතු කරන ලදී. මෙම කාලය තුළ තොරතුරු සඳහා ඉල්ලීම් 129ක ප්‍රමාණයක් ලැබී ඇති අතර ඉන් 65ක පමණ අභ්‍යන්තර ඉල්ලීම් වේ.

කරන ලද දත්ත විශ්ලේෂණ කාර්යයන්

2011 වසර තුළ, පහත දැක්වෙන පර්යේෂණ ව්‍යාපෘති වල දත්ත විශ්ලේෂණ කටයුතු කරන ලදී.

- R-377 - විවිධ කළමනාකරණ ක්ෂේත්‍ර යටතේ ඇති වාරි පද්ධතීන් වල ගොවි සහභාගිත්වය: සාර්ථක අසාර්ථක භාවය
- R-381 - ජනාවාස ඉඩම් තුළ අවිධිමත් ලෙස ඉඩම් බෙදී යාම පිළිබඳ අධ්‍යයනය.
- R-389 - ඉඟුරු සහ කහ වගාවේ නිෂ්පාදන අලෙවි ගැටළු සහ විභවතා හඳුනා ගැනීම.
- R-387 - සූර්ය බල බිංදු ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 01 ඇගයීම.
- R390 - රූපවාහිනී මාධ්‍යය හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කෙරෙන කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර අධ්‍යයනය කිරීම.
- R391 - කුඹුරු ඉඩම් වල බෝග විවිධාංගීකරණය පිළිබඳ අධ්‍යයනය.
- R-380 - තෝරා ගත් වාණිජ බෝග සම්බන්ධ ග්‍රාමීය ණය වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයනය.
- R392 - ගොවි සංවිධානයේ සාමාජිකයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ ප්‍රශ්නාවලිය.
- G-30 - දැයට කිරුළ -2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආදර්ශ කෘෂි ගම්මානය සඳහා පූර්ව ව්‍යාපෘති ; සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය
- R-394 - ශ්‍රී ලංකාවේ සහල් සැකසීමේ කර්මාන්තයේ ව්‍යුහය ක්‍රියාකාරිත්වය සහ සාධනය පිළිබඳ අධ්‍යයනය.
- R-403 - හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සම්බන්ධිත සේවා සැපයීම පිළිබඳ අධ්‍යයන
- R-398 - බිංදු ජල සම්පාදන පද්ධති භාවිතයේ වර්තමාන තත්ත්වය ගැටළු සහ විකල්ප.

පුස්තකාලය

පුස්තකාලයෙහි මූලික පරමාර්ථය වන්නේ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනීය පර්යේෂණ කාර්යය මණ්ඩලයෙහි හා බාහිර ආයතන හා පුද්ගලයින්ගේ ප්‍රයෝජනය සඳහා කෘෂිකාර්මික අංශයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම සහ තොරතුරු අවශ්‍යතා සැපයීම වේ. වර්ෂය තුළ කාර්ය මණ්ඩලය සඳහා ග්‍රන්ථ 1068 ක් ද, වාර ප්‍රකාශන කලාප 163 ක් ද, නිකුත් කර තිබේ. වසර තුළ පුස්තකාලය පරිහරණය කළ බාහිර පාඨක සංඛ්‍යාව 271 කි.

පොත්, සඟරා හා වාර්තා අත්පත් කරගැනීම

2011වසර තුළ ග්‍රන්ථ 253ක් පුස්තකාල එකතුවට අයත් කරගෙන ඇත. මෙයින් 62ක් සෘජු මිල දී ගැනීම් වූ අතර පරිත්‍යාග හා ප්‍රකාශන හුවමාරු වැඩසටහන යටතේ 171ක් ද, බඳින ලද වෙළුම් 20 ක් ද වේ.

විදේශීය සඟරා නාමයන් 11ක් (එය කලාප 125 ට ඇතුළත් වේ) සහ දේශීය සඟරා නාම 10 කට ආයතනය විසින් දායකත්වය ලබා ගන්නා ලදී.

පුස්තකාල සේවා

පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨක ඉල්ලීම් පරිදි, තොරතුරු හා ප්‍රලේඛණ සේවාවන් වන සාහිත්‍ය ගවේෂණ, විමර්ෂණ සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් හා ඡායා පිටපත් සේවා සපයන ලදී. පුස්තකාලයේ අන්තර්ජාල පහසුකම් මඟින් පර්යේෂණ කාර්ය මණ්ඩලයේ තොරතුරු හා දත්ත අවශ්‍යතා සපුරා ගැනීමට සේවා සලසන ලදී.

පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර පාඨකයන් සඳහා විවිධ විෂයයන් යටතේ පවත්වාගෙන යන පුවත්පත් ලිපි එකතුව ක්ෂණික විමර්ෂණය සඳහා අඛණ්ඩව දර්ශකගත කොට ඇත.

අන්තර් (AGRINET) පුස්තකාල සහයෝගිතාවය (ILC)

පුස්තකාලය, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පුස්තකාලයේ පවත්වා ගෙන යන කෘෂිකාර්මික පුස්තකාල තොරතුරු ජාලයේ (AGRINET) සාමාජිකයකු වන අතර අඛණ්ඩව එම දත්ත ජාලය සඳහා තෝරා ගත් පටුන පිටු බෙදා හැරීමේ දත්ත පදනම හා සම්බන්ධව කටයුතු කරයි. සාමාජික පුස්තකාලයන් මඟින් සඟරා නාම 09ක පටුන පිටු 142ක ඡායා පිටපත් ඉල්ලූම් කළ අතර සාමාජික පුස්තකාලයන්ගෙන් සඟරා නාම 10ක පටුන පිටු 22ක් ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය ඉල්ලා ඇත.

AGRINET තොරතුරු ජාලය මඟින් සම්පාදනය කරන පහත සඳහන් දත්ත පදනම් වෙත පුස්තකාල එකතුවෙන් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සපයන ලදී. :

1. ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලිය (National Agriculture Bibliography)
2. සාම්ප්‍රදායික දැනුම පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය (කෘෂිකර්මයට අදාළව)

අන්තර් පුස්තකාල බැහැරදීමේ සේවය යටතේ වෙනත් පුස්තකාල විසින් පොත් 10ක් විමර්ෂණ සඳහා ලබාගෙන ඇත.

ප්‍රකාශන හුවමාරු වැඩසටහන

ආයතනයේ ප්‍රකාශන හතළිස් පහක් (45) හුවමාරු වශයෙන් පුස්තකාල හතකට (07) යවන ලද අතර ප්‍රකාශන විස්සක් (20) පුස්තකාල පහක් (05) වෙතින් ලැබී තිබේ.

ප්‍රකාශන ඒකකය

මෙම ඒකකය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වන අතර පර්යේෂණ වාර්තා සංස්කරණය, ප්‍රකාශයට පත් කිරීම, කාලීන වාර්තා සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, අත් පත්‍රිකා හා අනෙකුත් තොරතුරු භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි. ප්‍රකාශන ඒකකය අදාළ (වසර) තුළ දී මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් වැඩසටහන් ද මෙහෙයවනු ලැබී ය.

2011 වසර තුළ දී සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් පර්යේෂණ වාර්තා 14 ක් නිකුත් කරන ලදී. අදාළ විස්තර පහත දැක් වේ.

01. ශ්‍රී ලංකාව තුළ මතුපිට අපදා වැසිදිය රැස්කිරීමේ නැඹුරුතාවය (ER 133)
02. ආයතනික මට්ටමේ වැසිදිය එක්රැස් කිරීම පිළිබඳ ආර්ථික ඇගයීම (ER 134)
03. වී ගොවිතැන හා සම්බන්ධ පොහොර ප්‍රතිපත්තිය: 2005 සහනාධාර වැඩසටහන පිළිබඳ ඇගයීමක් (ER 135)
04. පුල්එළිය නැවත අධ්‍යයනය - ගොවිජන වෙනස්වීම් පිළිබඳ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් (ER 136)
05. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදන අංශය තුළ වෙළෙඳ අනුපාතය (ER 137)
06. ග්‍රාමීය ගොවිජන සමාජය තුළ කාන්තා භූමිකාවෙහි වෙනස්වීම (ER 138)
07. වාරි කළමනාකරණය තුළ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය: රිදී බැඳි ඇළ ගොවි සමාගම් ආකෘතියෙහි අත්දැකීම් (ER 139)
08. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් විසින් පැරණුට් තාක්ෂණය කෙරෙහි අනුගත වී ඇති රටාව හඳුනාගැනීම (ER 140)
09. ශ්‍රී ලංකාවෙහි සුළුපරිමාන කෘෂිකර්මාන්තයෙහි පරිවර්තනය: සංඛ්‍යානමය විවරණයක් (ER 141)
10. සුපිරි වෙළෙඳසැල් මඟින් එළවළු බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ එමඟින් ගොවියන්ට සිදුවන බලපෑම පිළිබඳ අධ්‍යයනය (ER 142)
11. නිල්වලා ගංගා ද්‍රෝණිය තුළ ක්‍රමවේදය (ER 143)
12. ආහාර බෝග අංශය තුළ රසායනික පොහොර ආදේශක සඳහා විකල්ප පිවිසුම්:සමෝධානික ගොවිතැන් ක්‍රමවේදය පිවිසුම සහ මතු දවස (කාර්යය පත්‍රිකා 4)

13. එළවළු සහ පලතුරු අලෙවිකරණය සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතයෙහි බලපෑම ඇගයීමේ අධ්‍යයනය (SR 45)
14. සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ප්‍රගතිය හා බලපෑම පිළිබඳ අධ්‍යයනය (SR 46)

ඊට අමතරව අදාළ වසර තුළ දී පහත සඳහන් වාර ප්‍රකාශනයන් නිකුත් කරන ලදී.

1. Sri Lanka Journal of Agrarian Studies Vol: 14, No. 1&2
2. Sri Lanka Journal of Agrarian Studies Vol: 15, No. 1
3. සමුළු සංවාද
4. ගොවිකටයුතු අධ්‍යයන, 8 වෙළුම 2 කලාපය
5. ගොවිකටයුතු අධ්‍යයන, 10 වෙළුම, 1 කලාපය
6. ගොවිජනතා - ඔක්තෝබර් - දෙසැම්බර් 14 වෙළුම, 4 කලාපය
7. ගොවිජනතා - ජනවාරි - මාර්තු 15 වෙළුම, 1 කලාපය
8. පුවත් හසුන - 31 වෙළුම, 1 සහ 2 කලාප
9. පුවත් හසුන -31 වෙළුම, 3 කලාපය
10. වාර්ෂික වාර්තාව - 2010 (සිංහල)
11. වාර්ෂික වාර්තාව - 2010 (දෙමල)
12. වාර්ෂික වාර්තාව - 2010 (ඉංග්‍රීසි)
13. සොබාදහම් ගොවි ලිත - 2011

ඉහත සඳහන් කරන කාලපරිච්ඡේදය තුළ මෙම ඒකකය පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය පළ කිරීම මෙන් ම වැඩමුළු, මාධ්‍ය සම්මන්ත්‍රණ සංවිධානය හා වාර්තා චිත්‍රපට නිෂ්පාදනයෙහි නිරත විය.

1. දැයට කිරුළ ජාතික වැඩසටහන 2011.02.02 සිට 2011.02.11 දක්වා බුත්තල.
2. වාණිජ මණ්ඩලය මඟින් සංවිධානය කළ කාර්මික ප්‍රදර්ශනය - 2011.06.10 සිට 2011.06.12 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
3. ජාතික ගොවි සතිය - 2011.08.01 සිට 2011.08.05 දක්වා වව්නියාව
4. කෘෂිකාර්මික සන්නිවේදනයේ දී මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය මැයෙන් තෙ දිනක ජනමාධ්‍යවේදීන් සඳහා වූ මාධ්‍ය වැඩමුළුවක් නුවරඑළියේ දී පවත්වන ලදී.
5. මාධ්‍ය සම්මන්ත්‍රණය
6. සොබාදහමේ ගොවිතැන පිළිබඳ වාර්තා වැඩසටහන

කාර්ය මණ්ඩලය
ආයතන ව්‍යුහය



කාර්ය මණ්ඩල විශ්ලේෂණය

වගුව 1 : 2011 දෙසැම්බර් 31 දිනට වයස අනුව කාර්ය මණ්ඩලයේ විශ්ලේෂණය

වයස් කාණ්ඩය	පරිපාලන කාර්ය මණ්ඩලය	පර්යේෂණ කාර්ය මණ්ඩලය	සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි	මෙහෙයුම් හා සමාන්තර ශ්‍රේණි	එකතුව
51-60	04	07	03	10	14	38
41-50	04	03	10	11	10	38
31-40	05	28	09	10	23	75
21-30	-	01	04	23	13	41
එකතුව	13	39	26	54	60	192

වගුව 01 අනුව කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හා තාක්ෂණික පිරිසෙන් වැඩි පිරිසක් වයස් කාණ්ඩ 31 – 40 අතර වන අතර මෙය ආයතනයේ ඵලදායිතාවය සඳහා ඉතා හොඳ නිදර්ශකයකි. එයට හේතුව වන්නේ වයස 31 – 40 අතර කාණ්ඩය වෘත්තිමය හා ප්‍රවීණතාවය අනුව ඉහළ තත්ත්වයක පසුවීමයි. එලෙසම සහය කණ්ඩායම වැඩි පිරිසක් වයස් කාණ්ඩය 21 -30 අතර වේ.

වගුව 2 : 2011 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ සේවා කාලය විශ්ලේෂණය

සේවා කාලය (අවුරුදු)	පරිපාලන කාර්ය මණ්ඩලය	පර්යේෂණ කාර්ය මණ්ඩලය	සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි	මෙහෙයුම් හා සමාන්තර ශ්‍රේණි	එකතුව
20 වැඩි	02	07	06	16	16	47
16-20	06	05	07	06	07	31
11-15	02	04	03	04	09	22
06-10	02	11	03	02	08	26
05 අඩු	01	12	07	26	20	66
එකතුව	13	39	26	54	60	192

වගු අංක 02 ට අනුව කාර්ය මණ්ඩලයෙන් 1/3 ක් අවුරුදු 16 ට වඩා සේවා කාලයක් ආයතනයට ලබා දී ඇත. මෙම තත්ත්වය වඩා පැහැදිළි වන්නේ මාණ්ඩලික නිලධාරීන් පිරිස තුළින් ය. එලෙසම පර්යේෂණ කණ්ඩායමේ නිලධාරීන් 07 දෙනෙකු අවුරුදු 20 ට වඩා සේවා කාලයක් සපුරා ඇත.

2011 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩලයේ තත්ත්වය/ස්වභාවය

	2010.12.31 දිනට තත්ත්වය	වසර තුළ දී සේවය නැවැත්වීම/ඉල්ලා අස්වීම	පත්වීම්	2011.12.31 දිනට තත්ත්වය
අධ්‍යක්ෂ	01	-	-	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ(පර්යේෂණ)	01	-	-	01
අංශ ප්‍රධාන	05	-	-	05
පර්යේෂණ කාර්ය මණ්ඩලය	27	03	10	34
පරිපාලන කාර්ය මණ්ඩලය	06	02	02	06
ජ්‍යෙෂ්ඨ පුස්තකාල කාර්ය මණ්ඩලය	02	-	-	02
දත්ත සංවර්ධන ඒකකය	01	-	-	01
පරිගණක ඒකකය	02	01	-	01
ප්‍රකාශන ඒකකය	01	-	-	01
සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	18	01	07	24
තාක්ෂණිකකාර්යය මණ්ඩලය	02	01	-	01
ලිපිකාර, ලේකම් සහ සමාන්-තර ශ්‍රේණි	48	05	21	64
මෙහෙයුම් සහ සමාන්තර ශ්‍රේණි	35	02	18	51
එකතුව	**148**	**14**	**58**	**192**

කාර්ය මණ්ඩල සංවර්ධනය

පහත සඳහන් පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයනයන් හි නිරත වී සිටිය හ.

1. ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා - පරිසර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, කෘෂිකර්ම පීඨය රයුකස් (Ryukyus) විශ්ව විද්‍යාලය, ජපානය (2008 අප්‍රේල් සිට 2011 ජූනි දක්වා) සහ ආචාර්ය උපාධිය (2011 සිට)

2. එම්.කේ.එන්. දමයන්ති මෙනවිය - රාජ්‍ය ප්‍රතිපත්ති සහ පාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය, උතුරු-දකුණු විශ්ව විද්‍යාලය, ඩකා, බංගලාදේශය (2009 අගෝස්තු සිට 2011 ජූලි දක්වා)

3. ඊ.ඒ.සී. ප්‍රියංකර මහතා - ග්‍රාමීය සංවර්ධන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, 2010 - 2011 ඉන්දියාවේ හයිද්‍රාබාද් හි නර්ඩ් (NIRD) ආයතනය මඟින් සංවිධානය කරන ලදී.(2010 අගෝස්තු සිට 2011 ජූලි දක්වා)

විදේශ පුහුණු/ සම්මන්ත්‍රණ/ දේශන/ රැස්වීම් සහභාගිත්වය

ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - පර්යේෂණ නිලධාරී හා එන්.ජී.ජී. සමන්ත මහතා - පර්යේෂණ නිලධාරී, ග්‍රාම සංවර්ධනය සඳහා භූ විද්‍යාත්මක තොරතුරු භාවිතයේ නිර්මාණාත්මක බව සහ එහි භාවිතය පිළිබඳ දැනුම බෙදා ගැනීම යනුවෙන් ඉන්දියාවේ ජාතික ග්‍රාමීය සංවර්ධන ආයතනය හා ආසියා හා පැසිපික් කලාපයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානය විසින් 2011 ජනවාරි 24 සහ පෙබරවාරි 04 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවැත් වූ පුහුණු පාඨමාලාවට සහභාගි විය.

එන්.එස්.බී. ඇපාකන්ද මහතා - පර්යේෂණ නිලධාරී සහ එස්.එම්.ඒ. සමරකෝන් මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවැත් වූ පුහුණු වැඩසටහනක් වෙනුවෙන් 2011 පෙබරවාරි 14 – 23 සහභාගි විය.

ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - පර්යේෂණ නිලධාරී, ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය යනුවෙන් තායිලන්තයේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතාවය පිළිබඳ ආයතනයේ සහයෝගයෙන් මහිබෝල විශ්ව විද්‍යාලයේ පෝෂණය පිළිබඳ පැවති පුහුණු පාඨමාලාව සඳහා 2011 ජුනි 13 – 16 දක්වා සහභාගි විය.

එස්.එම්.ඒ. සමරකෝන් - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, විමධ්‍යගත පාලනය පිළිබඳ 2011 පෙබරවාරි 14 – 23 දක්වා හයිද්‍රාබාද් හි පැවති වැඩසටහනට සහභාගී විය.

ආර්.එල්.එන්. ජයතිස්ස මහතා - සහය අධි පර්යේෂණ නිලධාරී සහ ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා - පර්යේෂණ නිලධාරී, ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවති "ප්‍රතිඵල පාදක කළමනාකරණය: හැකියාවන් මැන බැලීමේ දර්ශක අධීක්ෂණය හා ඇගයීම" . පුහුණු වැඩසටහනකට 2011 අගෝස්තු 17 – 27 දක්වා සහභාගි විය.

එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මහත්මිය - පර්යේෂණ නිලධාරී, බ්‍රසීලයේ පැවති "සමාජ ආර්ථික සංවර්ධනයේ නියමුවෙකු වශයෙන් කෘෂිකර්මාන්තය" යන මැයෙන් පැවති පුහුණු වැඩසටහනක් සඳහා 2011 ඔක්තෝබර් 17 – 28 දක්වා සහභාගි විය.
ආචාර්ය ටී.ඒ.ධර්මරත්න මහතා - අධි පර්යේෂණ නිලධාරී, වියට්නාමයේ හනොයිහි 2011 ඔක්තෝම්බර් 13 -18 දක්වා පැවති කෘෂිකාර්මික ආර්ථික කටයුතු පිළිබඳ විශේෂඥයින් ගේ ආසියානු සමාජ හත් වැනි ජාත්‍යන්තර සමුළුව සඳහා සහභාගි විය.

එම්.එම්.එම්. අහියර් මහතා - සහාය අධි පර්යේෂණ නිලධාරී සහ එච්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - පර්යේෂණ නිලධාරී, 2011 නොවැම්බර් 24 සිට දෙසැම්බර් 03 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද් හි පැවති "කෘෂිකාර්මික වර්ධනය සහ පරිසර සංරක්ෂණය සඳහා දියබෙත්ම කළමනාකරණය" පුහුණු වැඩසටහනට සහභාගි විය.

එච්.ටී. පත්මජානි මෙනවිය - පර්යේෂණ නිලධාරිණී, චීනයේ පැවති "සංවර්ධනය වන රටවල් සඳහා දේශගුණ විපර්යාස" පුහුණු වැඩසටහනට 2011 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 19 දක්වා සහභාගි විය.

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා - අධි පර්යේෂක නිලධාරී, බ්‍රසීලයේ පැවති "පවුල් ඒකක තුළ කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීමට සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා දීම පිළිබඳ පොදු ප්‍රතිපත්ති" පුහුණු වැඩසටහනකට 2011 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 07 දක්වා සහභාගි විය.

සහයක කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවීම්

පී.පී. චතුදුර මහතා - ගණකාධිකාරී, මූල්‍ය අයවැය සැකසීම සහ තීරණ ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් 2011 පෙබරවාරි 01 සහ 02 යන දින වල දී පවත්වන ලද පුහුණුවට සහභාගී විය.

එන්. සී. ඒකනායක මහත්මිය - අභ්‍යන්තර විගණන නිලධාරිණී, ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් 2011 පෙබරවාරි 10 සහ 11 යන දින වල දී පවත්වන ලද මූල්‍ය ආයතන සඳහා අභ්‍යන්තර පාලනය සහ විගණනය පුහුණුවට සහභාගී විය.

ආර්.එල්.එන්. ජයතිස්ස මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි මහත්මිය, කේ.පී.අයි. ප්‍රියදර්ශනී මහත්මිය, එම්.ඩබ්.ඒ.සී.එස්. විජේතුංග මහත්මිය, ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා, එම්.ඩී.එස්. ලූර්දු මහත්මිය, ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා, එන්.පී.ජී. සමන්ත මහතා - පර්යේෂණ නිලධාරී මහත්ම මහත්මීන් ඵලදායී ව්‍යාපෘති ලිවීම පිළිබඳ ජාතික විද්‍යා පදනම හි 2011 පෙබරවාරි 25 දින පවත්වන ලද වැඩසටහනට සහභාගී වූහ.

පී.ජී.එස්.පී. නානායක්කාර මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිණී සහ එන්.ඩබ්.එච්.ඩබ්.ජේ.පී. නානායක්කාර මහත්මිය - සහකාර ගණකාධිකාරිණී, 2011 ජූනි 23 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයෙ හි රැකියාවේ ආතති කළමනාකරණය පිළිබඳ පැවති වැඩසටහනට සහභාගි වූහ.

සී. දහනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිණී සහ ඒ.අයි. පතිරණ මහත්මිය - අධ්‍යක්ෂ පෞද්ගලික සහයක නිලධාරිණී, වෘත්තීය ඵලදායීතාවය සඳහා නවීන කාර්යාල

කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව හි 2011 සැප්තැම්බර් 01 සහ 02 යන දින වල පැවති වැඩසටහනට සහභාගී වූහ.

කේ.ටී.යූ. කඹුරුගොඩ මහතා - ගණකාධිකාරී සහ එන්.සී. ඒකනායක මහත්මිය - අභ්‍යන්තර විගණන නිලධාරිණී, ශ්‍රී ලංකා පදනම් ආයතනයෙ හි 2011 සැප්තැම්බර් 26 සිට ඔක්තෝබර් 07 දක්වා පැවති ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ පුහුණුවට සහභාගි විය.

එන්.සී. ඒකනායක මහත්මිය - අභ්‍යන්තර විගණන නිලධාරී සහ ජේ.ජේ.එස්. ජයමාන්න මහතා - සහකාර ලේඛකාධිකාරී (පාලන), 2011 ඔක්තෝබර් 17 සිට 21 දින දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනය හි පැවැත් වූ විනය පටිපාටි ක්‍රමවේදය පිළිබඳ වැඩසටහනට සහභාගී වූහ.

ලිපිකරු ශ්‍රේණි

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ තුන් මසක පුහුණු පාඨමාලාවක් කොළඹ විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි අංශය මඟින් මෙහෙයවනු ලැබීය. කාර්ය මණ්ඩල සාමාජිකයින් 70ක් සඳහා සැලසුම් කරන ලද මෙම පාඨමාලාව 44 දෙනෙකු විසින් සාර්ථකව අවසන් කල අතර ඊට අදාළව සහතික පත්‍රයක් ද පිරිනමන ලදී. මේ සඳහා වැය වු මුළු මුදල රු. 350,000/- කි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2011.12.31 දිනට ශේෂය

වත්කම්	සටහන	2011.12.31		2010.12.31	
		රු.	රු.	රු.	රු.
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත හා උපකරණ	2	54,070,094.43		41,351,215.85	
ආයෝජන - ස්ථාවර තැන්පතු	3	4,651,817.36		6,122,285.65	
භාණ්ඩාගාර බිල්පත්		-		8,699,757.00	
කාර්ය මණ්ඩල සංවර්ධනය	4	21,618,550.52		20,691,565.02	
			80,340,462.31		76,864,823.52
ජංගම වත්කම්					
අවසන් තොගය	5	4,178,865.66		2,950,800.48	
ණය ගැතියෝ	6	21,852,636.01		28,385,521.67	
තැන්පතු	7	662,070.00		662,070.00	
ඉදිරිගෙවීම්/ලැබිය යුතු ගිණුම්	8	452,187.52		278,091.96	
අත්තිකාරම්	9	607,441.12		660,757.95	
බැංකු ශේෂය	10	3,695,075.29		4,411,904.99	
අ'තැති මුදල්		10,000.00		10,000.00	
			31,458,275.60		37,359,147.05
මුළු වත්කම්			111,798,737.91		114,223,970.57
හිමිකම් හා වගකීම්					
ප්‍රාග්ධන හා සංචිත					
රජයේ මූලධන ප්‍රධානය	11	135,377,986.00		126,207,761.00	
ඉතිරිකිරීම් වල දායකත්වය		1,102,372.79		1,102,372.79	
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දීමනා		2,342,835.00		2,342,835.00	
ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල	12	15,177,206.09		15,177,206.09	
ප්‍රාග්ධන සංචිත		3,242,284.40		3,242,284.40	
ව්‍යාපෘති පොදු සංචිත	13	16,301,977.47		16,301,977.47	
දිරි දීමනා අරමුදල		137,061.91		137,061.91	
පුහුණු අරමුදල - ව්‍යාපෘති		396,261.91		396,261.91	
දිරි දීමනා අරමුදල - ආයතනයේ කොටස		2,161,902.03		2,161,902.03	
ශුද්ධ ඌනතාවය ඉදිරියට ගෙන ගියා	14	(108,139,177.13)		(95,129,440.49)	
			68,100,710.47		71,940,222.11
වගකීම්					
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික වෙන්කිරීම්		28,134,437.50		27,907,195.00	
			28,134,437.50		27,907,195.00
ජංගම වගකීම්					
ණය හිමියෝ	15	7,886,183.79		7,327,661.63	
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - නිවාස ණය	16	-		1,629,394.41	
උපචිත වියදම්		7,677,406.15		5,419,497.42	
			15,563,589.94		14,376,553.46
මුළු හිමිකම් හා වගකීම්			111,798,737.91		114,223,970.57

……………………… ……………………… ………………………

සභාපති   අධ්‍යක්ෂ   ගණකාධිකාරී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

	සටහන්	31.12.2011 රු.	31.12.2010 රු.
ආදායම			
මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්		106,302,500.00	84,930,000.00
නේවාසිකාගාර හා සම්මන්ත්‍රන ශාලා ගාස්තු	17	15,163,667.57	9,430,441.53
ප්‍රකාශන අලෙවිය		109,431.00	138,774.00
ආයෝජන පොලිය		1,162,906.47	1,384,011.22
කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම		941,653.02	1,006,250.33
ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ		1,435,594.52	1,399,273.81
ව්‍යාපෘති පුනරාවර්ථන දායකත්වය	18	2,574,126.23	1,826,528.85
විවිධ ආදායම්	19	412,747.27	395,291.70
		128,102,626.08	**100,510,571.44**
වියදම්			
පරිපාලන හා ආයතනික වියදම්	20	(110,204,925.49)	(100,110,184.75)
ක්ෂයවීම්		(7,170,854.53)	(4,423,637.86)
පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම්		(23,985,536.27)	(9,167,130.35)
බොල්ණය (අඩි) /ඌන වෙන්කිරීම්		272,203.57	(70,547.93)
මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම්වලින් ලත් ශුද්ධ අලාභය		**(12,986,486.64)**	**(13,260,929.45)**
මූල්‍ය පිරිවැය		(23,250.00)	(38,034.43)
බදු පෙර ශුද්ධ අලාභය		(13,009,736.64)	(13,298,963.88)
බදු		-	-
ආදායම ඉක්මවූ වියදම		**(13,009,736.64)**	**(13,298,963.88)**

....

සභාපති   අධ්‍යක්ෂ   ගණකාධිකාරී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

	සටහන්		රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය			
වර්ෂය සඳහා ශුද්ධ හිඟය			(13,009,736.64)
ගැලපීම්			
ක්ෂයවීම්		7,170,854.53	
ආයෝජන ආදායම		(1,162,906.47)	
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - නිවාස ණය		(1,629,394.41)	
පාරිතෝෂක සඳහා වෙන්කිරීම		3,049,565.36	
			7,428,119.01
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/අලාභය			(5,581,617.63)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
අවසන් තොගය		(1,228,065.18)	
ණය ගැතියෝ		6,532,885.66	
ඉදිරි ගෙවීම		(174,095.56)	
අත්තිකාරම්		53,316.83	
ණය හිමියෝ		558,522.16	
උපචිත වියදම්		2,257,908.73	8,000,472.64
මෙහෙයුම් ක්‍රියාකාරකම් ශුද්ධ මුදල් භාවිතය			**2,418,855.01**
පාරිතෝෂික ගෙවීම්			**(2,822,322.86)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් භාවිතය			**(403,467.85)**
ආයෝජන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රවාහය			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(19,889,733.11)	
ආයෝජන ආදායම්		1,162,906.47	
සේවක සංවර්ධන පිරිවැය		(926,985.50)	
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලත් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය			**(19,653,812.14)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම්		9,170,225.00	
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල්			**9,170,225.00**
මුදල් හා මුදල් සමාන අනෙකුත් අයිතමයන්ගේ ශුද්ධ අඩුවීම			**(10,887,054.99)**
කාලච්ඡේදය ආරම්භයේ මුදල් හා සමාන අයිතමයන්	I		**19,243,947.64**
කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන අයිතමයන්	II		**8,356,892.65**
සටහන්:			
මුදල් හා මුදල් සමාන අයිතමයන්		1	11
		01.01.2011	**31.12.2011**
ආයෝජන - ස්ථාවර තැන්පතු		6,122,285.65	4,651,817.36
භාන්ඩාගාර බිල්පත්		8,699,757.00	-
බැංකු ශේෂය		4,411,904.99	3,695,075.29
අතැති මුදල්		10,000.00	10,000.00
එකතුව		**19,243,947.64**	**8,356,892.65**

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

	රජයේ ප්‍රාග්ධන ප්‍රතිලාභ	ඉතුරුම්වල මූලධන දායකත්වය	අමාත්‍යාංශයේ මූලධන දායකත්වය	ව්‍යාපෘති මූලධන අරමුදල්	මූලධන සංචිත	ව්‍යාපෘති පොදු සංචිත	දිරි දීමනා හා අරමුදල්	පුහුණු අරමුදල ව්‍යාපෘති	දිරිදීමනා අරමුදල ආයතනයේ කොටස	සමුච්ත ආදායම	එකතුව
2011.01.01 දිනට ශේෂය	126,207,761.00	1,102,372.79	2,342,835.00	15,177,206.09	3,242,284.40	16,301,977.47	137,061.91	396,261.91	2,161,902.03	(95,129,440.49)	71,940,222.11
මහා භාණ්ඩාගාර-යෙන් ලැබුණු මුදල්	9,170,225.00										9,170,225.00
අදායම සහ වියදම										(13,009,736.64)	(13,009,736.64)
එකතුව	**135,377,986.00**	**1,102,372.79**	**2,342,835.00**	**15,177,206.09**	**3,242,284.40**	**16,301,977.47**	**137,061.91**	**396,261.91**	**2,161,902.03**	**(108,139,177.13)**	**68,100,710.47**

2011 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සටහන්

1. ගිණුම් ප්‍රතිපත්ති

1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට අනුකූලව හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අදාලව ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඇත.

1.2. වත්කම් තක්සේරුව

(i). දේපල, පිරියත හා උපකරණ

ශේෂ පත්‍රයෙහි දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත. පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කර තිබේ.

ගොඩනැගිලි	වාර්ෂිකව	2 ½ %
උපකරණ/ගෘහභාණ්ඩ	”	10%
පරිගණක	”	20%
සුඛසාධක උපකරණ	”	10%
පොත්	”	10%
වාහන	”	20%

මිලදී ගත් වර්ෂයේදී සමස්ථ වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

(ii). ණය ගැතියෝ

උපලබ්ධි වේ යයි අපේක්ෂිත අගයන්වන ණය ගැතියන්ගේ වටිනාකම සඳහන් කොට ඇත. වාර්තා කරන දිනය වන විට ශුද්ධ ණයවලින් 4% ක් අඩමාන ණය වෙනුවෙන් වූ ප්‍රතිපාදන සඳහා වෙන්කොට ඇත.

(iii). තොගය

පාරිභෝගික තොග පිරිවැයට ගණනය කොට ඇත. අනෙකුත් තොග පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය හා ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුත් කිරීම් ය. අගයන්ගෙන් අඩුඅගයට ගණනය කොට ඇත. (FIFO ක්‍රමය)

1.3. පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව, පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත.

1.4. ආදායම් හා වියදම් ගිණුම

වියදම ඉක්මවූ ආදායම හෝ ආදායම ඉක්මවූ වියදම පහත ගැලපීම සිදු කිරීමෙන් පසු ගණනය කොට ඇත.

I. අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් බොල් ණය හා අඩමාන ණය වෙන් කිරීම් සිදු කොට තිබේ. ආයතනයේ දේපොළ, පිරියත සහ උපකරණ ඵලදායී ලෙස නඩත්තු කෙරෙයි.

II. වසර තුළ සිදු කරන ලද සියලු වියදම් සැලකිල්ලට ගෙන ඇත.

සටහන 2

2011 දෙසැම්බර් 31 න් අවසන්වන වර්ෂය සඳහා වත්කම් ක්ෂයවීම් පිළිබඳ ප්‍රකාශය

අයිතම	2011.01.01 දිනට පිරිවැය රු.	2011 වසර තුල මිලදී ගැනීම / ඉවත් කිරීම රු.	2011.01.01 දිනට මුලු පිරිවැය රු.	2011.01.01 දිනට සමුච්චිත ක්ෂය රු.	2011 වසර තුල ක්ෂය වීම රු.	2011.12.31 න් අවසන් දිනට සමුච්චිත ක්ෂය රු.	2011.12.31 ට ශුද්ධ වටිනාකම රු.
ඉඩම්	1,716,667.00	-	1,716,667.00	-	-	-	1,716,667.00
ගොඩනැගිලි	31,328,314.99	3,048,664.29	34,376,979.28	10,580,670.11	859,424.48	11,440,094.59	22,936,884.69
ලිබඩු උපකරණ	32,818,723.93	2,250,026.33	35,068,750.26	21,344,329.62	1,227,850.65	22,572,180.27	12,496,569.99
පරිගණක උපාංග	18,368,677.58	1,902,735.00	20,271,412.58	15,796,870.99	800,747.14	16,597,618.13	3,673,794.45
මෝටර් රථ	12,308,988.06	12,145,460.00	24,454,448.06	9,675,539.06	3,772,492.00	13,448,031.06	11,006,417.00
පොත්	10,125,512.22	542,847.49	10,668,359.71	7,918,259.15	510,340.26	8,428,599.41	2,239,760.30
සුබසාධන උපකරණ	3,734.55	-	3,734.55	3,733.55	-	3,733.55	1.00
	106,670,618.33	19,889,733.11	126,560,351.44	65,319,402.48	7,170,854.53	72,490,257.01	54,070,094.43

		2011	2010
3	හෙ.කො.ගො.ප.පු. ආයතනය ආයෝජන - ස්ථාවර තැන්පතු	රු.	රු.
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පත්	4,385,031.71	5,855,500.00
	කෙටි කාලීන තැන්පතු	266,785.65	266,785.65
		4,651,817.36	**6,122,285.65**
4	කාර්ය මණ්ඩල සංවර්ධන		
	2011.01.01 දිනට ශේෂය	20,691,565.02	20,445,068.72
	වර්ෂය තුලදී සිදු කරන ලද ගැලපීම්	926,985.50	246,496.30
		21,618,550.52	**20,691,565.02**
5	තොග		
	ප්‍රකාශන සහ සඟරා	1,825,682.00	1,456,482.00
	පරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය සැපයීම	1,967,087.66	1,161,989.48
	අලෙවි සැල	386,096.00	332,329.00
		4,178,865.66	**2,950,800.48**
6	ණය ගැතියෝ		
	කාර්ය මණ්ඩල ණය ගැතියෝ		
	නිවාස ණය	2,361,943.59	3,991,338.00
	ඒකාබද්ධ ණය	19,070,701.42	23,277,802.91
	විශේෂ අත්තිකාරම්	2,550.00	900.00
	උත්සව අත්තිකාරම්	134,627.50	136,860.00
	අස්ථානගත වූ පුද්ගලයන්ගෙන් අය	6,723.32	6,723.32
	වැටුප් අත්තිකාරම්	265,931.81	613,496.04
	ශිෂ්‍යත්වලාභීන්ගේ ණය ගැතියෝ	20,895,859.97	22,331,454.49
		42,738,337.61	**50,358,574.76**
	වෙනත් ණය ගැතියෝ		
	ලැබිය යුතු ආයෝජන ආදායම්	175,533.12	355,500.00
	සේවස්ථ පුහුණු ආයතනය ලැබිය යුතු	6,806.38	6,806.38
	කේ.එන්.යූ. ගුණසේකර	12,100.00	12,100.00
	කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	109,738.31	85,527.16
	ඉවත් වූ සේවකයන්ගෙන් අය කරගත යුතු	389,677.10	234,731.72
	සරසවි පොත් සැල	4,272.25	21,832.25
	රක්ෂණ අයවීම්	173,700.00	173,700.00
	ණයගැති - සුභසාධක සංගමය	99.00	-
	R - 405 කෝණකුඹුක්වැව නව ගම්මානය	163,731.31	-
	සර්ඩැප් ආයතනයෙන් ලැබිය යුතු	-	124,450.00
	උපතිස්ස පරණමාන - භෝජනකරු	-	12,434.43
	කෘෂිකර්ම අමාත්‍යාංශය - පුහුණු ක්‍රියාකාරකම්	-	589,022.12
	ආසියානු ඵලදායිතා සංවිධානය	-	40,000.00
		1,035,657.47	**1,656,104.06**
		43,773,995.08	52,014,678.82
	අඩු කළා:		
	බොල් සහ අවමාන ණය සඳහා වෙන් කිරීම්	(915,125.41)	(1,187,328.97)
	ණය හිමියන් (බැඳුම්කාර) සඳහා වෙන් කිරීම්	(110,373.69)	(110,373.69)
	ශිෂ්‍යත්වලාභීන් සඳහා වෙන් කිරීම්	(20,895,859.97)	(22,331,454.49)
		21,852,636.01	28,385,521.67

7	තැන්පතු		
	ස්ථාවර - භෝජනාගාර හිමිකරු	70,000.00	70,000.00
	ස්ථාවර - මුදල් අයකැමි	1,500.00	1,500.00
	විවිධ - ෆීලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ	147,500.00	147,500.00
	විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්)	3,125.00	3,125.00
	විවිධ - තැපැල්පති	24,945.00	24,945.00
	විවිධ - කොළඹ ගෑස් හා ජල සමාගම	4,750.00	4,750.00
	විවිධ - ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය	500.00	500.00
	විවිධ - සී/ස සෙල්ටෙල් ලංකා සමාගම	3,500.00	3,500.00
	විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය	406,250.00	406,250.00
		662,070.00	**662,070.00**
8	ඉදිරි ගෙවීම්		
	මෝටර් රථ රක්ෂණය	452,187.52	278,091.96
		452,187.52	**278,091.96**
9	අත්තිකරම්		
	මිලදී ගැනීම් අත්තිකාරම්	49,904.40	197,712.95
	අනෙකුත් අත්තිකාරම්	557,536.72	463,045.00
		607,441.12	**660,757.95**
10	බැංකුවේ ඇති මුදල්		
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323293	690,848.92	524,881.84
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323292	756,139.72	666,965.08
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323317	38,863.07	3,204,702.20
	ලංකා බැංකුව - ගිණුම් අංක - 2323315	2,209,223.58	15,355.87
		3,695,075.29	**4,411,904.99**
11	රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන		
	2011.01.01 දිනට ශේෂය	126,207,761.00	122,382,500.00
	වසර තුළ ප්‍රාග්ධන දායකත්වය	9,170,225.00	3,825,261.00
		135,377,986.00	**126,207,761.00**
12	ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල		
	2011.01.01 දිනට ශේෂය	15,177,206.09	14,886,206.09
	වසර තුළදී එකතු කිරීම්	-	291,000.00
		15,177,206.09	**15,177,206.09**
13	ව්‍යාපෘති පොදු සංචිත		
	2011.01.01 දිනට ශේෂය	16,301,977.47	16,301,977.47
	වසර තුළදී එකතු කිරීම්	-	-
		16,301,977.47	**16,301,977.47**
14	ශුද්ධ හිඟය		
	2011.01.01 දිනට ශේෂය	95,129,440.49	81,830,476.61
	2011.01.01 දිනට අදායම ඉක්ම වූ වියදම	13,009,736.64	13,298,963.88
		108,139,177.13	**95,129,440.49**
15	ණය හිමියෝ		
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	133,462.20	118,462.20
	ආපසු ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු - උපතිස්ස පරණමාන	50,000.00	50,000.00
	උපතිස්ස පරණමාන	827.15	-

	නොගෙවූ වියදම්	139,170.21	63,088.39
	ඉවත් වූ සේවකයන් සඳහා ගෙවිය යුතු	154,320.08	150,015.00
	සේවක සහ ආපනශාලා තැන්පතු	13,084.50	13,084.50
	ගෙවිය යුතු මුද්දර ගාස්තු	7,175.00	5,600.00
	රඳවා ගත් මුදල	85,087.41	85,087.41
	පන්සිළු ඕෆ්සෙට් මුද්‍රණකරුවෝ	642,539.27	54,531.25
	ව්‍යාපෘතිවලට එරෙහි ණය හිමියෝ		
	සහල් නිෂ්පාදනය පිළිබඳ ග්‍රන්ථය	501,269.66	644,767.68
	ආර් - 300 - සමෘද්ධි හා සමෘද්ධි නොවන්නන් තුලනාත්මක විශ්ලේෂණය	234,996.50	234,996.50
	ආර් - 322 - වාරියපොල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සම්බන්ධ යෝජනාව	26,119.08	26,119.08
	ආර්-324 - ගෘහස්ථ මට්ටමෙන් සහල් නිෂ්පාදනයේ ආර්ථිකමය ශක්‍යතාවය	-	42,568.10
	ආර් - 332 - බස්නාහිර පොළ වෙළඳාම ප්‍රවර්ධනය සඳහාවන අධ්‍යයනය	1,535,452.72	1,535,452.72
	ටී - 294 - ෆිවිම්ස් (FIVIMS)	217,946.87	217,946.87
	ආර් -318 - ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතභාවය සහ තොරතුරු සිතියම් ගතකිරීම	22,450.07	22,450.07
	ආර් - 334 - ශක්‍යතා අධ්‍යයනය - යෝජිත බලංගොඩ ආර්ථික මධ්‍යස්ථානය	24,048.32	24,048.32
	ටී - 228 - ගැටුම්වලට මුහුණ දුන් ප්‍රදේශයන්හි සංවර්ධනාත්මක ක්‍රියාමාර්ග අරභයා වූ ක්‍රමෝපායයන් පිළිබඳ වැඩමුළුව	613,680.24	613,680.24
	ආර් - 330- ශක්‍යතා අධ්‍යයනය -යෝජිත කුරුදුවත්ත ආර්ථික මධ්‍යස්ථානය	163,057.26	163,057.26
	ආර් - 356 - පූර්ව ශක්‍යතා අධ්‍යයනය -යෝජිත මොණරාගල සියඹලාණ්ඩුව උක් වගා ව්‍යාපෘතිය	163,945.94	163,945.94
	ටී - 226 - ප්‍රජා මට්ටමේ නායකයන්ට උපදේශනාත්මක තොරතුරු පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන	387,068.94	387,068.94
	ටී - 239 - කෘෂි අලෙවිකරණ ව්‍යාපෘතිය පිළිබඳ දේශීය පුහුණු වැඩසටහන	461,285.95	461,285.95
	ටී - 236 - ශ්‍රී ලංකා ජල සංවර්ධන වාර්තාව පිළිබඳ උපදේශනාත්මක වැඩමුළුව	41,749.05	41,749.05
	ටී - 232 -පුහුණු වැඩසටහන	443,078.38	443,078.38
	ටී - 245 -දිළිඳුකම පිටුදැකීම අරමුණු කොට ගත් ග්‍රාමීය සංවර්ධනයේ නව සහ මතු වී ඇති අභියෝගයන් පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන	889,205.68	889,205.68
	ආර් - 371 - අනුරාධපුරය හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි සීනි ව්‍යාපෘතිය නිදහස් ශක්‍යතා අධ්‍යයනය	691,562.20	691,562.20
	ටී - 281 - පුහුණු වැඩසටහන - ආහාර සුරක්ෂණ හා ආවේක්ෂණ පිළිබඳ ආහාර වැඩසටහන	-	148,500.00
	ටී - 274 - ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන	-	36,309.90
	ටී - 329 - ගොවි උපහාර උළෙල 2011	62,443.22	-
	ටී - 338 - පුහුණු වැඩසටහන	181,157.89	-
		7,886,183.79	**7,327,661.63**
16	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - නිවාස ණය		
	2011.01.01 දිනට ශේෂය	1,629,394.41	1,629,394.41
	නිවාස ණය ගිණුමට එරෙහිව හිලව්කිරීම	(1,629,394.41)	-
	2011.12.31 දිනට ශේෂය	-	**1,629,394.41**

	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - 2010 නිවාස ණය වන රු. 1,629,394.41 ක මුදල 2011 වසරේ නිවාස ණය ශේෂයට එරෙහිව හිලව්කිරීම		
17	ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලාව සහ නේවාසිකාගාර අයකිරීම්		
	ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණශාලා අයකිරීම්	6,683,607.34	4,193,620.80
	නේවාසිකාගාර අයකිරීම්	8,480,060.23	5,236,820.73
		15,163,667.57	**9,430,441.53**
18	ව්‍යාපෘති ආදායම		
	පරිපාලන වියදම් සහ ව්‍යාපෘති ආදායම	**2,574,126.23**	**1,826,528.85**
19	විවිධ ආදායම්		
	බංගලා ගාස්තු සහ කාමර කුලී	72,414.00	143,531.57
	පැල්වෙහෙර කාමර කුලී	15,700.00	22,800.00
	පරිගණක ආදායම	4,206.85	2,749.68
	ටෙන්ඩර් ගාස්තු	2,500.00	7,250.00
	අනෙකුත් ආදායම්	317,926.42	218,960.45
		412,747.27	**395,291.70**
20	පරිපාලන හා ආයතනික වියදම්		
	වැටුප් - ස්ථිර කාර්ය මණ්ඩලය	42,688,999.42	43,032,164.74
	වැටුප් - අනියම් කාර්ය මණ්ඩලය	8,677,301.16	7,290,227.08
	සේවක අර්ථසාධක අරමුදල	7,589,918.83	7,408,602.23
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	1,518,557.27	1,481,720.38
	අතිකාල	2,436,268.72	2,046,021.34
	නිවාඩු දින ගෙවීම්	26,363.04	21,177.29
	ජීවන වියදම් හා වෙනත් දීමනා	19,329,236.56	14,802,169.32
	පාරිතෝෂික	3,049,565.36	2,613,736.50
	ගමන් වියදම් හා යැපීම් දීමනා	1,947,182.15	550,051.71
	විදේශීය ගමන් වියදම්	374,760.07	618,853.97
	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	2,941,739.28	909,505.85
	වෙනත් පරිභෝජන ද්‍රව්‍ය	127,900.00	1,418,384.95
	ඉන්ධන සහ ලිහිසි තෙල්	2,480,455.49	1,076,383.28
	නිල ඇඳුම්	313,208.40	273,346.20
	වාහන අළුත්වැඩියා	4,320,325.31	2,001,965.27
	ගොඩනැගිලි නඩත්තු කටයුතු	1,174,449.65	607,848.12
	යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා	864,323.49	1,174,546.66
	දුරකථන ගාස්තු	1,379,382.27	993,300.60
	විදුලිය	4,430,650.23	3,219,684.11
	ජල බිල්පත්	974,249.53	945,755.52
	බදු සහ වරිපනම්	274,888.80	274,888.80
	තැපැල් ගාස්තු	530,573.00	405,000.00
	ප්‍රවාහන	358,440.00	355,370.00
	නීති උපදෙස්	120,000.00	120,000.00
	පරිගණක උපදේශක	-	72,000.00

	පුවත්පත්	281,558.40	234,238.00
	බලපත්‍ර සහ රක්ෂණය	674,425.82	579,755.90
	ආරක්ෂක ගාස්තු	1,796,395.54	1,555,793.06
	පිරිසිදු කිරීමේ ගාස්තු	542,293.91	482,384.60
	රෙදි සේදීම	328,470.00	331,790.00
	විගණන ගාස්තු	300,000.00	300,000.00
	වෛද්‍ය ගාස්තු	292,352.93	14,741.93
	ආපනශාලා ගාස්තු	110,304.00	103,175.00
	විවිධ වියදම්	604,917.16	602,929.77
	නීති ගාස්තු	2,680.00	361,375.00
	සුබ සාධක	456,063.00	369,440.00
	දැන්වීම	155,447.20	167,014.40
	සම්මුඛ පරීක්ෂණ ගාස්තු	7,000.00	2,000.00
	පාලක මණ්ඩලය	157,000.00	40,000.00
	මුද්‍රණ හා ප්‍රකාශන	2,272,128.55	223,977.42
	විනෝදාත්මක	5,119.00	4,769.00
	වාර්ෂික දායකත්ව මුදල්	-	89,187.00
	38 වැනි සංවත්සර වියදම්	-	144,383.00
	තොරතුරු බෙදාහැරීම	377,910.00	154,800.00
	බොල් ණය කපා හැරීම	-	386,901.75
	අලෙවි වියදම් - ප්‍රකාශන	101,623.00	123,930.00
	හානි වූ තොග කපා හැරීම	-	124,895.00
	වාහන සඳහා කාර්මික උපදෙස්	90,000.00	-
		110,204,925.49	**100,110,184.75**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No : එච්ක්/බී/එච්ඒආර්ටීඅයි/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date : 2012 අගෝස්තු 24 දින

සභාපති

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 05 දරන හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනතේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2012 මැයි 31 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail. : oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03

i. පසුගිය වර්ෂය දක්වා වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරීන් සඳහා පමණක් සේවක පාර්තෝෂිත වෙන්කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේ සිට වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන්ද අදාල කර ගැනීමට ගෙන තිබූ ප්‍රතිපත්තිමය තීරණය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

ii. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් භාර ගන්නා බවට ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

iii. ආයතනය විසින් ශිෂ්‍යත්වලාභී ගිවිසුම් කඩකරන්නන්ට එරෙහිව නඩු 10 ක් සහ සේවයෙන් පහකරනු ලැබූ නිලධාරිනියක් සම්බන්ධව හා වාහන අනතුරක් සම්බන්ධව තවත් නඩු දෙකක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18

i. ආයතනය සතු පිරිවැය රු.4,990,324 ක් වූ තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන මෝටර් රථ 09 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී තිබුණද එම වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

ii. ආයතනයේ නිලධාරීන් වෙත ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය සඳහා ලබාදෙන පුහුණු වැඩසටහන්, ශිෂ්‍යත්ව සහ වැඩමුළු සඳහා වසර ගණනාවක සිට වැය කරන ලද එකතුව රු.21,618,551 ක්වූ වියදම් ආදායමට එරෙහිව ලියාහරිනු වෙනුවට ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24

ප්‍රාග්ධන හා සංචිත ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු. 40,861,902 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානයන් සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම් තබා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2008 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනා නොගත් ණයගැති බැර ශේෂයක් වූ රු.110,374 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන්ගෙන් අඩුකර ගිණුම් ගතකර තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වූ ශේෂයන් සහ ඒ සඳහා ඉදිරිපත් කර තිබූ උපලේඛනවල දැක්වුනු ශේෂයන් අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	උපලේඛනය අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
ප්‍රකාශන හා ජර්නල්	1,825,682	1,826,647	965
අලෙවි මධ්‍යස්ථානය	386,096	407,882	21,786
පාරිභෝගික ද්‍රව්‍ය	1,967,088	1,580,549	386,539
ලී බඩු හා උපකරණ	2,250,026	2,260,926	10,900
			420,190

2.2.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වසර 05කට පෙර සේවය හැර ගොස් සිටි සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය රු.234,732 ක් හිඟ ලෙස පැවතුණි.

(ආ) බාහිර ආයතන හා පුද්ගලයෙකුගෙන් ලැබිය යුතුව ඇති හිඟ හිටි වසර 05 ක් ඉක්මවා ඇති ණය ශේෂය රු.104,434 ක් විය.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් 13 ක් අවසන් වීමෙන් පසු ඉතිරි වී ඇති රු.5,061,028 ක් 2009 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දක්වා තිබූ අතර එම මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට ආයතනය විසින් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් 13 ක් අවසන් වීමෙන් පසු ඉතිරි වී ඇති රු.5,061,028 ක් 2009 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් යටතේ දක්වා තිබූ අතර එම මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට ආයතනය විසින් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

නිවාස ණය රු. 2,361,941 සඳහා ණය ලබාගත් පුද්ගලයන්ට අනුව ශේෂය සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2.6 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ)	2000 අංක 38 දරන දේශීය ආදායම් පනත	උපයන විට බදු ගෙවීමේදී නිලධාරීන් තිදෙනෙකුගේ සම්පත් දායක දීමනා රු. 138,950 ක් සැලකිල්ලට නොගැනීම නිසා අඩුවෙන් ප්‍රේෂණය කර තිබූ බදු මුදල රු. 17,126 ක් විය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 371(2)	අවස්ථා 05කදී රු. 20,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම උපරිම සීමාව ඉක්මවා රු. 506,537 ක අත්තිකාරම් සිදුකර තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VII පරිච්ඡේදයේ 12.2.6 ඡේදය	ලේඛකාධිකාරී හා දත්ත විශ්ලේෂක තනතුරෙහි වැඩබැලීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.145,279 ක් වැය කර තිබුණද මෙම වැටුප් ගෙවීම් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොතිබුණි.
(ඈ)	චක්‍රලේඛ I. අංක 22/99 හා 1999 ඔක්තොබර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ. 1.2 ඡේදය	රාජකාරී කටයුතු සඳහා කාර්යාලය හා නිවාසය අතර යාම් එම් සඳහා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් අංක 65 - 1280 දරන වාහනය යොදා ගෙන තිබුණි.

II.	අංක 22/99 හා 1999 ඔක්තෝබර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1(111) ජේදය	කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා හිමිකමක් නොමැති නිලධාරීන් 07 දෙනෙකු සඳහා 2011 ජනවාරි 10 දින සිට කාර්යාලය හා නිවස අතර යාම් ඒම් වෙනුවෙන් වාහන 02 ක් ධාවනයේ යොදවා තිබූ අතර ඒ වෙනුවෙන් දිනකට කි.මී. 168 ක් පමණ ධාවනය කර තිබුණි.

(ඉ) 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ. 2.14.1 ජේදය

(i) රු. 100,000 ට අඩු වටිනාකම් සහිත වැඩ හා සේවා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් මිල කැඳවීම් 03 ක් ලබා ගත යුතු වුවද මිල ගණන් ඉදිරිපත් නොකළ ආයතනයකින් රු. 1,434,513 ක් වියදම්කර වාහන 10 ක් අලුත්වැඩියා කර තිබුණි

(ii) වාහනයක අලුත්වැඩියා කටයුතු සඳහා රු. 200,000 ක් අත්තිකාරමක් ලෙස අලුත්වැඩියාව සිදුකල ආයතනයට ලබා දී තිබුණි.

(iii) පැල් වෙහෙර සංචාරක නිවාසයේ අදියර දෙකකදී සිදුකරන ලද රු.1,325,326ක් වටිනා අළුත්වැඩියාවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5.4.4 (i) ජේදය

වැඩ ආරම්භ කිරීමේදී ඉදි කිරීම් ඇස්තමේන්තුවෙන් 20% ක් පමණක් අත්තිකාරම් ලබා දිය යුතු වුවත් පැල් වෙහෙර සංචාරක නිවාසයේ අළුත්වැඩියා පළමු අදියරේදී ඒ සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් 55% ක් ද ඉක්මවා රු. 250,000 ක් දෙවාරයකදී අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි.

8.12.2 ජේදය

අළුත්වැඩියාවන් සිදු කිරීමෙන් පසු එම කාර්යය නියමිත පරිදි අවසන් කර ඇති බව ගෙවීම් කිරීමට පෙර සුදුසුකම් ලත් ඉංජිනේරුවරයකු විසින් හෝ තාක්ෂණ නිලධාරියෙකු විසින් පරීක්ෂා කර සහතික කල යුතු නමුත් පැල්වෙහෙර සංචාරක නිවාසයේ අලුත්වැඩියාවේදී එසේ කටයුතු කර නොතිබුණි.

1.2.8 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනය විසින් පරිගණක මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවා තිබුණු අතර එම අවස්ථා දෙකෙහිදීම මිල කැඳවීම් ඉදිරිපත් නොකල ආයතනයක් විසින් පසුව ඉදිරිපත් කර ඇති මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ඇගයීම් සිදුකර එම සමාගමෙන් රු. 706,000ක් වටිනා පරිගණක 12ක් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණි.

(ආ) ආයතනයේ ඉදිරිපස තාප්පය අලුත්වැඩියා කිරීමේදී ආයතන දෙකක් වෙතින් පිළිවෙලින් 2011 ජනවාරි 20 දින හා 2011 ජනවාරි 18 දින මිල ගණන් ඉදිරිපත් කර තිබුන අතර ආයතනයේ ලිපි ගොනු අනුව තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් එම මිල ගණන් 2011 ජනවාරි 14 දින අනුමත කර ඇති බව නිරීක්ෂණය වූ බැවින් එම වාර්තාවේ නිරවද්‍යතාවය අභියෝගයට ලක්වී තිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,009,737 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.13,298,964 කි. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 289,227 ක වර්ධනය සඳහා රු. 9,170,225 භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම ප්‍රධාන හේතුවක් වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ විචලනයන් පහත වගුවෙන් දැක්වේ.

විස්තරය	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2011	2010	විචලනය
	රු.	රු.	රු.
ආදායම	128,102,626	100,510,571	27,592,055
වියදම (මූල්‍ය වියදම හැර)	141,089,112	113,771,501	27,317,611
පොලී ගෙවීමට පෙර ශුද්ධ මෙහෙයුම් ලාභය	12,986,486	13,260,930	(274,444)
ජංගම වත්කම්	31,458,276	37,359,147	(5,900, 871)
ජංගම වගකීම්	15,563,590	14,376,553	1,187,037

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ආයතනය විසින් 2011 වර්ෂය තුල පර්යේෂණ ව්‍යාපෘති 17 ක් ආරම්භ කර තිබුණු අතර, 2010 වර්ෂයට අදාල ව්‍යාපෘති 05 ක්ද සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර අවසන් කර තිබුණි. 2011 වර්ෂය තුල ක්‍රියාත්මක මුළු පර්යේෂණ ව්‍යාපෘති වලින් අවසන් කරන ලද මුළු පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව 14 ක් වන අතර 2011 දෙසැම්බර් 31 දිනට නොනිම් පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව 08 කි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අනුව වාහන සේවා කිරීම සඳහා තෝරාගත් ආයතනයෙන් සේවා කටයුතු නොකර අධ්‍යක්ෂකගේ උපදෙස් මත වෙනත් ආයතනයකින් සේවා ලබාගෙන රු. 90,015 ක් ගෙවා තිබුණි.

(ආ) විදේශීය විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ ගිවිසුම් කඩකල ශිෂ්‍යත්වලාභීන් 06 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීමට මාස 20-51 දක්වා කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 11,900,868 ක් විය.

(ඇ) ආයතනයේ පුස්තකාලයාධිපතිනිය ලෙස සේවය කරන නිලධාරිනිය සඳහා කැළණිය විශ්ව විද්‍යාලයේ සාමාජ්‍ය විද්‍යාපති පුස්තකාල සහ විඥාපන විද්‍යා විශේෂ උපාධිය හැදෑරීමට 1998 - 2000 දක්වා වසර 2 ක කාල සීමාවක් ලබා දී ඇතත්, ඇය විසින් එම පාඨමාලාව සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආයතනය විසින් වැය කර ඇති රු. 207,830 ක මුදල 2011 දෙසැම්බර් 31 දින වන විටද එම නිලධාරිනියගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) "කෘෂිකාර්මික සන්නිවේදනයේදී මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය ආකල්පමය වෙනසකට ප්‍රවේශයක්" යන මැයෙන් නුවරඑළියේ පැවැත්වූ සම්මන්ත්‍රණය (T-302) සඳහා හෝටල් පහසුකම් කලින් වෙන්කරවා නොගැනීම, සහභාගී වන සංඛ්‍යාව හා එහි වැඩසටහන පිළිබඳව සැලැස්මක් සකස් කර නොතිබීම නිසා රු. 565,000 ක ඇස්තමේන්තු මුදලද ඉක්මවා රු. 917,882 ක් වැය කර තිබුණි. මෙවැනි සම්මන්ත්‍රණය ක් පිළිබඳ 2011 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුලත්ව නොතිබුණු අතර පාලක මණ්ඩලයේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

(ඊ) රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සහ මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨය සම්බන්ධ වී පවත්වනු ලැබූ කෘෂිකර්මය සඳහා තොරතුරු තාක්ෂණ සමුළුව (T-341) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු. 200,000 ක් වැය කර තිබුණි.

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති පැල්වෙහෙර සංචාරක බංගලාව ආයතනය වෙත භාර දී වර්ෂ 07 ක් ගත වී ඇතත්, එහි නීතිමය අයිතිය 2011 දෙසැම්බර් 31 දින වන විටද ලබාගෙන නොතිබුණි.

(ආ) ලෝක ආහාර වැඩ සටහන් ව්‍යාපෘතියට අයත් අංක ඩබ්පීසීආර් 0111 දරන කැබ් රථය 2011 ජූලි 25 දින ආයතනය වෙත ලබා දී තිබුණද, වාහනයේ නීත්‍යානුකූල අයිතිය මෙතෙක් පවරා ගෙන නොතිබුණි.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ කටයුතු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණයක් තිබුණද, රු. 796,840 ක් වූ ආයතනයේ ඉදිරිපස තාප්පය වැඩි දියුණු කිරීම, අධ්‍යක්ෂක නිල නිවසේ නාන කාමර අලුත්වැඩියාව හා ආපනශාලා අළුත්වැඩියාවන් ලේඛනගත සැපයුම්කරුවන් නොවන වෙනත් ආයතන හා පුද්ගලයින්ගෙන් එම සේවාවන් ලබාගෙන තිබුණි.

(ආ) ආයතනය විසින් ප්‍රසම්පාදන චක්‍රලේඛවලින් බැහැරව රු.237,000 කට ලැප්ටොප් පරිගනක 03 ක් මිලදී ගෙන තිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

වෙනත් ආයතන වලට අනුයුක්ත කර ඇති පර්යේෂණ නිලධාරි හා රියදුරන් දෙදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් වැටුප් වශයෙන් රු. 173,495 ක් වැය කර තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඊ/1/4/7/118/1 දරන හා 2011 ජූලි 13 දිනැති ලිපියේ 04 වැනි ඡේදයට පටහැනිව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පරිපාටිය අනුමත කර ගැනීමට පෙර තනතුරු 06 ක් සඳහා සේවකයින් 57 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් ලෙස රු. 4,704,592 ක් ගෙවා තිබුණි.

(ආ) (i). මාණ්ඩලික ශ්‍රේණි වලට අදාල තනතුරු පිරවීම සඳහා කාර්ය පටරා ඉටු කර ගැනීමේ පදනම මත නිලධාරීන් බඳවා ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii). ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු වෙනුවෙන් කාර්ය පවරා ඉටු කර ගැනීමේ පදනම මත බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුල ඔවුන් සඳහා වැටුප් දීමනා වශයෙන් රු. 578,200 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ආයතනය පිහිට වූ පනතට අනුව විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි අධ්‍යක්ෂවරුන් 21 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසානයට අධ්‍යක්ෂවරු 16 දෙනෙකු පමණක් පත්කර තිබුණු බැවින් ක්ෂේත්‍ර 5 ක් නියෝජනය වන අධ්‍යක්ෂකවරු 5 දෙනෙකු පත්කර නොතිබුණි.

5.2 අයවැය ලේඛන පාලනය

අයවැය දත්ත තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය 26% සිට 100% දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ආයතනය පිහිට වූ පනතට අනුව විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි අධ්‍යක්ෂවරුන් 21 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසානයට අධ්‍යක්ෂවරු 16 දෙනෙකු පමණක් පත්කර තිබුණු බැවින් ක්ෂේත්‍ර 5 ක් නියෝජනය වන අධ්‍යක්ෂකවරු 5 දෙනෙකු පත්කර නොතිබුණි.

5.2 අයවැය ලේඛන පාලනය

අයවැය දත්ත තථ්‍ය දත්ත අතර විචලනයේ ප්‍රතිශතය 26% සිට 100% දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ). සේවක කළමනාකරණය

(ආ). අත්තිකාරම් ගෙවීම

(ඇ). ණය අයකරගැනීම

(ඈ). ඉදිකිරීම්

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු වාර්තාව

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 03

i. ගණකාධිකරණ ප්‍රමිත අංක 3 අනුව පාරිතෝෂික දීමනා වෙන් කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කිරීම 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සටහන් කරගත්තා ලදී.

ii. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම බාරගත්තා බවට ප්‍රකාශයක් 2012 වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට සටහන් කරගත්තා ලදී

iii. ශිෂ්‍යත්වලාභී ණයගැතියන් වෙනුවෙන් ආයතනය විසින් පවරන ලද නඩු 10 සහ ආයතනයට එරෙහිව පවරන ලද නඩු සම්බන්ධයෙන් සහ සේවයෙන් පහ කරනු ලැබූ කේ.ජී. ශිරාණි වතිගසිංහ මෙනවිය සම්බන්ධව පවතින කම්කරු විනිශ්චය සභා නඩු අංක 2/1511/2008 සහ මහාධිකරණ නඩු අංක HCALT 96/2010 පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව්කිරීමක් 2012 ගිණුම් සැකසීමේදී මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීමට උපදෙස් දෙන ලදී.

53-3287 වාහනයෙන් ලැබිය යුතු රක්ෂණ වන්දිය රු.173,700 2012.04.18 දින රිසිට් අංක 2616 මඟින් ආයතනයට ලැබී ගිණුම් තිරවුල් වී ඇත.

53-3287 වාහනය මොණරාගලදී සිදුවූ අනතුර සම්බන්ධයෙන් මොණරාගල දිස්ත්‍රික් උසාවියේ නඩුවක් මේ වනවිට විභාග වෙමින් පවතී. මේ සම්බන්ධව 2012 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට උපදෙස් දෙන ලදී.

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 18

i. 2012 වර්ෂයේදී ගණකාධිකරණ ප්‍රමිත අංක 18 අනුව මෙම වාහන ප්‍රත්‍යාගණනය කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.

ii. 2011 වර්ෂය සඳහා සේවක සංවර්ධනය සඳහා අරමුදල් ලබාදී ඇත්තේ ප්‍රාග්ධන වැය ලෙසය. එනිසා 2011 වර්ෂය දක්වාම මෙම සේවක සංවර්ධනය සඳහා වැයකළ මුදල් ශේෂ පත්‍රයේ වත්කම් යටතේ දක්වන

ලදී. නමුත් 2012 වසරේ සිට සේවක සංවර්ධනය වෙනුවෙන් මුදල් අනුමත කරනුයේ පුනරාවර්තන වැය ලෙසය. එබැවින් මෙය 2012 වර්ෂයේ සිට වත්කම් යටතේ නොපෙන්වා වියදමක් ලෙස සළකා ගිණුම්ගත කරනු ලැබේ.

2011 වර්ෂය සඳහාම අවසන් ගිණුම් වල ජංගම නොවන වත්කම් යටතේ පෙන්වා තිබූ සේවක සංවර්ධන වියදම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24

මේ සම්බන්ධයෙන් ආයතනයේ පැරණි පොත්පත් පරීක්ෂා කර බලා මාස 03ක් ඇතුළත වාර්තාවක් සකසා 2012 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මෙම රු.110,374/- ක මුදල පරීක්ෂා කිරීමේදී වර්ෂ 2000 අවසන් ගිණුම්වල දී පැවත එන බව තිරීක්ෂණය කළ බැවින් 2011 වර්ෂයේ ගිණුම් ප්‍රකාශවල ණයගැතියන්ගේ අඩුකර දක්වා තිබීම 2012 වර්ෂයේදී නිවැරදි කරන ලෙසට උපදෙස් දෙන ලදී.

2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

පාරිභෝගික ද්‍රව්‍ය සඳහා රු.173,100 කින් නිවැරදි කිරීම් කර ඇත. ලී බඩු උපකරණවල දක්වා ඇති වෙනස රු.10,900 ජංගම දුරකථනයක වටිනාකම වන අතර මෙය වත්කම් ලේඛනයට 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත්කර ගැනීමට උපදෙස් දෙන ලදී.

ප්‍රකාශන හා ජර්නල් සහ අලෙවි මධ්‍යස්ථානය බාරව සිටින විෂයභාර නිලධාරීන්ට මෙම වෙනස සොයා බැලීමට උපදෙස් දෙන ලදී.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ)	ටී.ජී.එස්.වික්‍රමසිංහ	රු. 21,911.82
	එම්.ජී.එම්.රසාක්	රු.212,819.90
		රු.234,731.72

මෙම මුදල් අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇත. ඇපකරුවන්ගෙන් කපා ගැනීමට කටයුතු යොදා ඇත.

(ආ)	අමාත්‍යාංශ ණයගැතියෝ	රු.85,527.16
	කේ.එන්.යූ.ගුණසේකර	රු.12,100.00
	ඉන්සර්විස් පුහුණු ආයතනය	රු.6,806.38
		රු.104,433.54

ඉන්සර්විස් පුහුණු ආයතනය වෙත මෙම මුදල් අයකර ගැනීම සඳහා ලිපි යවා ඇත.

(ඇ) වෙනත් ආයතන මඟින් ලබාදුන් අරමුදල් වලින් පර්යේෂණ ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් කිරීමෙන් අනතුරුව ඉතිරි වූ මුදල් තැන්පතු, කාලීන තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම
නිවාස ණය - රු. 2,361,941.00 (ඇමුණුම 01)

2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) මෙම නිලධාරීන් තිදෙනාගෙන් අදාළ මුදල් අයකරගෙන මසක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කෙරේ.

මෙම අඩුපාඩු මගහරවා ගනිමින් 2012 වර්ෂයේ සිට දළ වැටුප් සහ අනෙකුත් සියලුම ලැබීම් පදනම් කරගෙන 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව උපයන විට බදු ගෙවීම සිදුකර ඇත.

(ආ) වර්තමානයේදී මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් වශයෙන් රු.20,000.00 ක් පමණක් ගෙවීමට කටයුතු කරනු ලැබේ. නමුත් පුහුණු කිරීමේ කටයුතු කරන අවස්ථාවේදී රු.20,000.00 ඉක්මවා කටයුතු කිරීමට අවශ්‍ය අවස්ථාවලදී රේඛීය අමාත්‍යාංශය මඟින් විශේෂ අනුමැතියක් භාණ්ඩාගාරයෙන් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇත.

(ඇ) ලේඛකාධිකාරි තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැටුප් ගෙවීම සඳහා ආයතන සංග්‍රහයට අනුව අමාත්‍යාංශ ලේකම්තුමාගේ පූර්ව අනුමැතියක් ලබා නොතිබුන බැවින් 2012.05.23 දිනෙන් පැවැති 320 වැනි පාලක මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. ආයතන සංග්‍රහයට අනුව වැඩ බැලීමේ වැටුපක් ගෙවා ඇත්තේ මාස තුනක කාලයක් සඳහා පමණි (රු.25,279). එතැන් සිට මේ දක්වා ඇය ස්වේච්ඡාවෙන් රාජකාරි ඉටුකරනු ලබයි (ඇමුණුම 02).

ලෝක ආහාර සංවිධානයට සම්බන්ධ ව්‍යාපෘතියක කාර්ය පවරා ඉටුකරගැනීමේ පදනම මත සේවය කළ විශ්‍රාම ලත් දත්ත විශ්ලේෂකවරයකු තෙමසක කාලයකින් පසු සේවය අවසන් කරන ලදී.

(ඈ)

i රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛන 22 /99 ට අනුව 1.1.6 වගන්තියේ 4 වෙනි උප වගන්තියට අනුව ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරයා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ගණයට වැටෙන බැවින් එවැනි අවස්ථාවකදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා අනුමත කර ඇති බැවින් ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරයාට නිල වාහනයක් අනුයුක්ත කිරීමට සුදුසුකම් ඇත.

ii. 22/99 1.3 (111) වගන්තිය යටතේ රාජ්‍ය සංස්ථාවල අනුමත කරන ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්හට ගමන් ස්ථාන 02ක උපරිම දුර ප්‍රමාණය කි.මී. 40 නොඉක්මවා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සපයා ඇත. කෙසේ නමුත් මෙම කි.මී.40 සීමාව ඉක්මවා ඇති අවස්ථාවන්හිදී ගමන්ගත් නිලධාරියාගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙම පහසුකම් දෙන නිලධාරීන් කාර්යාලය ආරම්භ වීමට පැය 1/2 කට පෙර සේවයට වාර්තා කළ යුතු අතර දිනක සේවා කාලයෙන් විනාඩි 45 කට පසු පිටව යා යුතුය.

2.14.1 (i) වාහන වල ඇතිවූ යම් යම් දෝෂයන් නිසා ධාවනය කළ නොහැකිව ආයතනයේ ගරාජය තුළ වාහන ගාල් කර තිබුණි. මෙහි සමහර දෝෂයන් සම්බන්ධව වාහන භාර රියදුරන් විසින් ලිඛිතව දන්වා තිබූ අතර වාහන කාර්මික නිලධාරී විසින් අදාළ දෝෂයන් පරීක්ෂා කර අළුත්වැඩියාවන් කරවා ගැනීමට නිර්දේශ කර ඇත

අප ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා නිතර නිතර වාහන ක්ෂේත්‍ර සංචාරයේ යෙදවීමට සිදුවේ. එහෙත් ධාවනය කිරීමට හැකි තත්වයේ පැවති වාහන කීපය මෙම රාජකාරි සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ඉක්මණින් අළුත්වැඩියා කර ගැනීමේ අවශ්‍යතාවය මත යූ.ආර්.පී. ඔටෝ මාර්ට් ආයතනයට දන්වා කාර්මිකයන් ගෙන්වා වාහන කීපයක් ආයතන භූමියේ අළුත්වැඩියා කරන ලදී.

මෙම අළුත්වැඩියාවන් සඳහා එම ආයතනය විසින් ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති අතර එ සඳහා වාහන කාර්මික නිලධාරී නිර්දේශය ලබා දී ඇත. මෙම වාහන ආයතන භූමියේ අළුත්වැඩියා කළ නිසා යූ.ආර්.පී. ආයතනය

විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු සළකා බලා අමතර කොටස් මිලදී ගැනීමට රු.75,000/- අත්තිකාරම් මුදලක් ලබා දීමට සිදුවිය.

ඉහත සඳහන් ආයතනයෙන් කාර්මිකයන් ගෙන්වා ආයතන භූමිය තුළ වාහන අළුත්වැඩියා කර ගැනීම නිසා කාලයත් ශ්‍රමයත් මෙන්ම නඩත්තු සඳහා යන වියදම අවම කර ගැනීමට හැකි විය.

ii. වවුචර් අංක 1433

CR-0111 දරන වාහනයේ හදිසි අළුත්වැඩියා කටයුතු සඳහා අමතර කොටස් ඇණවුම් කිරීමේදී URP ආයතනයට අදාළ නියෝජිත ආයතනය වෙත අත්තිකාරම් මුදල් ගෙවීමට සිදුවන බව සඳහන් කරමින් රු.200,000ක අත්තිකාරම් මුදලක් ඉල්ලුම් කර ඇති බැවින් සහ එම මුදල ගෙවීම අධ්‍යක්ෂතුමා විසින් අනුමත කර ගෙවීම් කර ඇත.

iii. මින් පෙර අප ආයතනයේ කටයුතුවලදී ඉතා හොඳින් කලට වේලාවට එම කාර්යයන් ඉටු කරන ලද අයවලුන්ගෙන්ද මිල ගණන් ලබාගත් අතර ඔවුන් අප මීට ඉහතදී පවරන ලද කාර්යයන් හොඳින් ඉටු කරනු ලැබූ ආයතන නිසා ඔවුන්ගෙන්ද මිල ගණන් ලබා ගන්නා ලදී

මෙම කාර්යයේදී එකවර මෙම රු.250,000/- මුදල කොන්ත්‍රාත්කරුට ලබා නොදුන් අතර කාර්යය අවසන් වන මට්ටම සළකා බලා ඉදිරියට එම කාර්යය නියමිත පරිදි ඉටුකර ගැනීම සඳහා මෙසේ අත්තිකාරම් මුදල් ලබා දෙන ලද අතර එක වරකට රු.150,000/- මුදලකුත් පසුව තවත් රු.100,000/- ක මුදලකුත් අත්තිකාරම් වශයෙන් දෙවරකදී ගෙවන ලදී. මෙම කාර්යය ඉටුකර ගැනීමේදී ප්‍රගතිය මත ගෙවීම් කිරීම් ඉටු කරනු ලැබ ඇත.

5.4.4 (i) මෙම කාර්යයේදී එකවර මෙම රු.250,000/- මුදල කොන්ත්‍රාත්කරුට ලබා නොදුන් අතර කාර්යය අවසන් වන මට්ටම සළකා බලා ඉදිරියට එම කාර්යය නියමිත පරිදි ඉටුකර ගැනීම සඳහා මෙසේ අත්තිකාරම් මුදල් ලබා දෙන ලද අතර එක වරකට රු.150,000/- මුදලකුත් පසුව තවත් රු.100,000/- ක මුදලකුත් අත්තිකාරම් වශයෙන් දෙවරකදී ගෙවන ලදී. මෙම කාර්යය ඉටුකර ගැනීමේ ප්‍රගතිය මත ගෙවීම් කිරීම් ඉටු කරනු ලැබ ඇත.

8.12.2 ඡේදය

ගොනුවේ අවසන් බිල් පත්‍රය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු වෙත අනුමැතියට යොමු කල ද දැනට වැඩ අවසන් වී ඇති කාර්යයන් සඳහා අනුමැතිය ලබා දීමට නොහැකි බැවි එම නිලධාරීන් දන්වා ඇත.

1.2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) 2010.04.19 දින පරිගණක 13ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලබන අතර ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහ අධ්‍යක්ෂ අනුමැතියට යටත්ව අවම මිල ඉදිරිපත් කර ඇති Are Tech Lanka (Pvt) Ltd වෙතින් එකක් රු.40,940/- බැගින් 532,220/-ක මුදලකට පරිගණක 13ක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

2010.11.04 දින ආයතන 06කින් පරිගණක 07ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇත. 2010.11.26 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මගින් අවම ඉදිරිපත් කර තිබූ E – W Information Technology වෙතින් USB මූසිකය සහ යතුරුපුවරුව හැර අනිකුත් සියළුම පිරිවිතරයන් අප විසින් ඉදිරිපත් කර ඇති පිරිවිතරයන්ට අනුකූලව ලබා දී ඇත.

2010.12.02 දිනැති තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව මගින් E – W Information Technology විසින් USB මූසිකය සහ යතුරුපුවරු ලබා දීමට යටත්ව එම ආයතනයෙන් පරිගණක මිලදී ගැනීමට නිර්දේශ කර ඇත.

ආයතනයේ පර්යේෂණ හා ව්‍යාපෘති කටයුතු සඳහා මෙම මිල ගණන් කැඳවනු ලැබූ Dual Core පරිගණක එම කාලසීමාව තුළදී අදාල තොග නොමැතිකම නිසා ලබා දීමට නොහැකි බවට E – W Information Technology දන්වන ලදී. මීට අමතරව Dual Core පරිගණක යන්ත්‍ර සඳහා වෙළෙඳපොළ ඉල්ලුම අඩුවන බැවින් සහ එහි එකක මිල රු.76,267/- ක් ඉහළ වටිනාකමක් ගන්නා බැවින්ද මෙම කැඳවනු ලැබූ මිල ගණන් නොසළකා හැර ඇත.

අධ්‍යක්ෂතුමාගේ උපදෙස් අනුව New Metro Computers වෙතින් Dual Core පරිගණක යන්ත්‍ර සඳහා මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර ඇත.

ආයතනයේ පැමිණීම සහ පිටවීම සටහන් කරනු ලබන වේලා සටහන් යන්ත්‍රයේ දෝෂ ඇති බැවින් ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමට කටයුතු කර ඇති අතර මේ සඳහා පරිගණක 02ක් මිලදී ගැනීමට අධ්‍යක්ෂතුමාගේ උපදෙස් පරිදි New Metro Computers වෙතින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර මීට පෙර කැඳවනු ලැබූ අවම මිල ඉදිරිපත් කර ඇති E – W Information Technology ට වඩා මෙම යන්ත්‍ර වටිනාකමින් අඩු බැවින් එකක් රු.48,000/- බැගින් පරිගණක යන්ත්‍ර 02ක් රු.96,000/- ක මුදලකට මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

Intel Core i3,i5 or i7 පරිගණක 07ක් සහ ලැප්ටොප් පරිගණක 01 ක් සඳහා 2010.12.22 ආයතන 09 කින් මිල ගණන් කැඳවන ලදී. එම මිල ගණන් අතුරින් අවම මිල ඉදිරිපත් කර ඇත්තේ Are Tech Lanka (Pvt) Ltd බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2011.01.17 දිනැති ලිපිය වාර්තාව මඟින් දක්වා ඇත.

2011.01.26 දිනැති තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා මඟින් Intel Core i3 සඳහා New Metro Computers විසින් දී ඇති මිල සහ පිරිවිතරයන් නිර්දේශ කර ඇත.

ප්‍රසම්පාදන කමිටු වාර්තාව සහ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සැලකිල්ලට ගෙන New Metro Computers වෙතින් අවස්ථා දෙකකදී පරිගණක යන්ත්‍ර 10 ක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

(ඇ) ආයතනයේ තාප්පය අළුත්වැඩියා කිරීම සඳහා කැඳවන ලද මිල ගණන් ඉදිරිපත් කර ඇති දින වල වෙනසක් ඇති බව පෙනී යයි. මෙම කාර්ය ඉටු කරනු ලැබුයේ එම වසරේ පැවති සාර්ක් සමුළුව සඳහා වන අතර එය ඉතාමත් කඩිනම් අවශ්‍යතාවයක් බවට පත්වී තිබුණි. මෙම කාර්යය දින කිහිපයකින් සම්පූර්ණ කළ යුතුව තිබූ බැවින් කඩිනමින් මිල ගණන් ගෙන කාර්ය ඉටු කිරීමට සිදුවීමත් මෙවන් අතපසුවීම් පිළිබඳව මින් ඉදිරියට තාක්ෂණික කමිටුව දැනුවත් කිරීමටත් කටයුතු සිදුකර ඇත.
(2012.03.01 විගණන රැස්වීම අනුව දැනුවත් කිරීම් කර ඇත).

3.0 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

භාණ්ඩාගාර ප්‍රදාන, ව්‍යාපෘතිවලින් දායකත්වය සහ ආයතනයේ ඉපයීම් ප්‍රධාන වශයෙන් මෙයට හේතුවී ඇත.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

	2011.12.31	2010.12.31
ආදායම	128,102,626	100,510,571
වියදම (මූල්‍ය වියදම හැර)	141,089,112	113,771,501
පොළී ගෙවීමට පෙර ශුද්ධ මෙහෙයුම් අලාභය	12,986,486	13,260,930
ජංගම වත්කම්	31,458,275.60	37359147.05
ජංගම වගකීම්	8,903,071.97	5,959,366.17

114

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

කාර්ය සාධනය

ආයතනය විසින් 2011 වර්ෂය සඳහා පර්යේෂණ අධ්‍යයන 17 ක් ආරම්භ කරන ලදී (ඇමුණුම 03). ඊට අමතරව අලෙවි තොරතුරු ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව 2010 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 05 න් 04 ක් සමාලෝචිත වර්ෂයේදී (2011) අවසන් කරන ලදී (ඇමුණුම 04). ඉතිරි අධ්‍යයනය 2012 මාර්තු මස අවසන් කර ඇත (ඇමුණුම 04 අංක 5). 2011 වර්ෂය තුල අවසන් කරන ලද මුළු පර්යේෂණ සංඛ්‍යාව 14 කි (ඇමුණුම 05).

නොනිමි පර්යේෂණ 08 න් දෙකක් අවසන් කිරීමට සැලසුම් කර ඇත්තේ 2012 වර්ෂයේදිය (ඇමුණුම 06 අංක 1 සහ 2). ඉතිරි පර්යේෂණ 06 සමාලෝචිත වර්ෂයේ (2011.12.31 වන විට) නිම කිරීමට නොහැකි වුයේ පර්යේෂණ නිලධාරින් ක්‍රියාකාරි සැලැස්මට අමතරව කරන ලද අධ්‍යයනයන්ට සම්බන්ධවීම හේතුවෙනි. නිම කිරීමට නොහැකි වු අධ්‍යයන 06 න් 03ක් 2012 වර්ෂයේ ජනවාරි මාසයේද 02 ක් මාර්තු මාසයේද අවසන් කර ඇති අතර අනෙක් අධ්‍යයනය 2012 ජුලි මස අවසන් කිරීමට නියමිතය (ඇමුණුම 06).

මීට අමතරව ජංගම දුරකථන මාර්ගයෙන් ප්‍රධාන එළවළු තොග වෙළෙඳපොළවල් 08 ක එළවළු වර්ග 23ක මිල ගණන් දෙමළ සහ සිංහල භාෂාවෙන් ප්‍රචාරණය කිරීමට සැලසුම් කර පරීක්ෂණ මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව දැයට කිරුළට සමගාමීව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ක්‍රමවේදය යටතේ අමාත්‍යංශය සහ වෙනත් ආයතනවල අනුග්‍රහය ඇතිව මිලි.08ක වියදමකින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝණකුඹුක්වැව ග්‍රාමීය අප ආයතනය විසින් වසර 40ක කාලය තුළ ලබාගත් අත්දැකීම් උපයෝගී කරගනිමින් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සියළු අංක දරණ වාහන අධ්‍යක්ෂතුමාගේ අධිකාරි බල සීමාව තුළ ක්‍රියා කොට ඇති බව කියා සිටි. තවද අදාල වාහන අධ්‍යක්ෂතුමා විසින් භාවිතා කරන ලද වාහන වන අතර රියදුරු සහ අධ්‍යක්ෂතුමා මාතර පදිංචිව සිටින බැවින් පහසුව සඳහා ආයතනය විසින් තෝරා ගන්නා ලද ආයතනයෙන් බැහැරව සේවා ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ආ) මේ වන විට 1988 සිට 2006 අතර පශ්චාත් උපාධි ශිෂ්‍යත්වලාභීන්ගෙන් මුදල් අයවිය යුතු ණයගැතියන් 12ක් සිටින අතර ඉන් 02 සම්මුතියන්ට අනුව ගෙවීම් සිදු කරන අතර ඉතිරි ණයගැතියන් 10 දෙනාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග මේ වනවිට ආරම්භ වී ක්‍රියාත්මක වේ. ඔබ ලිපියෙහි සඳහන් ණය ගැතියන් 06 දෙනාද ඊට අදාලය. ඊට අදාල සාරාංශ වාර්තාවක් ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කරමි (ඇමුණුම 07).

තවද ආයතනයේ කළමනාකාරිත්වය අදාල ශිෂ්‍යත්වලාභීන්ට එරෙහිව සියළු නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඇපකරුවන්ගෙන් අයවිය යුතු මුදල්ද අයකර ගනිමින් පවතී. තවද ලිපිනයන් සොයා ගැනීමට නොහැකි ණයගැතියන් සම්බන්ධයෙන් හැකි සෑම පියවරක්ම ගෙන ඇති අතර තවදුරටත් එහි නියලෙමින් සිටී. උදා: පදිංචි ස්ථාන සොයා ගැනීමට නොහැකි වූ ණයගැතියන් පිළිබඳ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට දන්වා යැවීම (නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත) නීතිපති දෙපාර්තමේන්තුව මෙම ණයගැතියන් සම්බන්ධයෙන් අප ආයතනය සමඟ කටයුතු කරමින් පවතී.

(ඇ) එස්.එල්.කටුගම්පල මෙනවිය පාඨමාලාව අවසන් නොකිරීමට හේතු ඇයගෙන් විමසන ලද අතර ඉන් ලැබූ තොරතුරු මත ඇය විසින් පාඨමාලාව අතහැර ගියා සේ සළකා ආයතනය දරා ඇති රු.207,830/- මුදල අයකර ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. මෙම මුදල මාසිකව රු.20,783.00 බැගින් කටුගම්පළ මියගේ වැටුපෙන් අඩුකර ගනු ලැබේ.

(ඈ) ඉහත පුහුණු වැඩමුළුව සඳහා ආරම්භයේදී ඇස්තමේන්තු කොට තිබූ රු.565,000/- මුදල සංශෝධනය කොට රු.885,000/- සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමටත්, එකී ඇස්තමේන්තුව ඉක්මවා වියදමක් දැරීමට පහත සඳහන් හේතු පාදක විය.

- ඉහත වැඩමුළුව සඳහා හෝටල් සහ නවාතැන් ගාස්තු සම්බන්ධයෙන් මිල ගණන් විමසා සිටි ස්ථානයන් හි වෙනත් පාර්ශවයන් විසින් වෙන් කිරීම් සිදු කිරීම හේතුවෙන් එකම ස්ථානයක පහසුකම් සපයා ගැනීමට අසීරු වීම – වැඩ සටහනෙහි අවශ්‍යතාවය සළකා මේ නිසා අවශ්‍ය පහසුකම් සහිත විකල්ප ස්ථාන (නවාතැන්/හෝටල්) වෙත යොමු වීමට සිදුවීම.

- ඉහත වැඩසටහනෙහි ගුණාත්මක බව සහ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම එනම් ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම සඳහා විකල්ප අදහස් අනුව අන්තර්ගතයට නවාංග එක් කිරීම සඳහා වියදමක් දැරීමට සිදුවීම. නිදා: මාධ්‍යවේදීන් සඳහා සමූහ ඡායාරූපය, සහතික පත්‍ර, සමරු තිළිණ, ඡායාරූප, ඡායා පිටපත් යනාදිය).

(ඒ) රුහුණු විශ්ව විද්‍යාලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන කෘෂිකර්ම තොරතුරු තාක්ෂණය, සැසිය සඳහා දායකත්වය ලබා ගැනීම වෙනුවෙන් ලිපියක් 2011 ඔක්තෝම්බර් 25 වන දින අධ්‍යක්ෂ වෙත ලැබී ඇත. (ඇමුණුම 08)

එලෙසම ඊට ප්‍රථම කෘෂිකර්ම විද්‍යාපීඨ පීඨාධිපති මහාචාර්ය මංගල ද සොයිසා විසින් වාචිකව මීට අවශ්‍ය සහය ලබා දෙන මෙන් අධ්‍යක්ෂතුමා වෙත ඉල්ලීමක් කර ඇත.

තවද 2010/2011 වසර තුළ රුහුණු විශ්ව විද්‍යාලය හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර පහත සඳහන් අධ්‍යයන සම්බන්ධතා ගොඩනැගී තිබුණි.

- පර්යේෂණ සඳහා උපදෙස් ලබාදීම
- පර්යේෂණ වාර්තා වැඩිදියුණු කිරීම
- පර්යේෂණ හා පුහුණු කමිටුව නියෝජනය කිරීම

ඉහත කරුණු අනුව අප ආයතනයේ අධ්‍යක්ෂතුමා විසින් උක්ත සහය ඔවුන්ගේ කෘෂිකර්ම තොරතුරු තාක්ෂණය පිළිබඳ වාර්ෂික සැසියට ලබා දීමට තීරණය විය. ඒ අනුව රු.200,000 මූල්‍යමය දායකත්වය හා වාර්ෂික සැසියට සහභාගී වීම සිදු විය (ඇමුණුම 09).

මේ සඳහා පර්යේෂණ නිලධාරීන් 07 දෙනෙකු සහභාගී වූ බවද මින් සඳහන් කරමි. (ඇමුණුම 10)

- ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මිල ගණන් විමසන ලද වායු සමීකරණය කරන ලද බස් රථය, මාධ්‍යවේදීන් නුවරඑළියේ වැඩසටහන පැවැත්වෙන ස්ථානය වෙත රැගෙන යාමටත් ආපසු කැටුව ඒමටත් එකඟ විය. පසුව වැඩසටහන තුළ පැවති ක්ෂේත්‍ර අධ්‍යයනය සහ ප්‍රසිද්ධ අර්තාපල් වගාකරුවන්ගේ සමූපකාර සමිතිය නැරඹීමට රැගෙන යාමේ අවස්ථාව නිසා එම මිල ගණන්වලට ප්‍රවාහන පහසුකම් සැපයීම ප්‍රතික්ෂේප කළේය. එබැවින්, වෙනත් විකල්පයක් වෙත යොමුවීමට සිදුවිය. (මෙම කාලවකවානුව තුළදී සාමාන්‍ය දින 05ක ගමනක් සඳහා කොළඹ සිට නුවරඑළිය දක්වා) රුපියල් ලක්ෂය ඉක්මවා ගිය මුදලක් අය කෙරේ). ඒ අනුව, මෙම මුදල පවා ඉතා වාසි සහගතය.

- ප්‍රාදේශීය ආරාධිත දේශපාලන අධිකාරිය, රාජ්‍ය නිලධාරීන් සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය වැඩ සටහනෙහි සාර්ථකත්වය හේතුවෙන් ඉහළ ගියේය. මේ අනුව, පහසුකම් වැඩි කිරීමට සිදු විය. (විද්‍යුත් උපකරණ/ආධාරක උපකරණ කුලී පදනම මත ලබා ගැනීම ආදිය).

- ආරම්භක සැළසුමට වඩා විද්වත් උපදෙස් මත වැඩසටහන පුළුල් වීමත් සමඟ සාර්ථක ලෙස වැඩ සටහන කළමනාකරණය සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය වැඩිකර ගැනීමට සිදුවීම.

- ප්‍රකාශන ඒකකයට පත්ව ආ ඒකක ප්‍රධාන පූජිත ද මැල් මහතා (දැනට ඒ මහතා ආයතනයෙන් ඉල්ලා අස්වී ඇත) පත්වී මාස 08 ක් වැනි සුළු කාලයකදී මෙම භාරධූර කාර්යය සැළසුම් කෙරිණි.

4.4. මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) පැල්වෙහෙර සංචාරක බංගලාව ආයතනය වෙත පවරා ගැනීමේ නීතිමය කටයුතු දැනට අවසන් වී ඇත. ඉඩම් අමාත්‍යාංශය විසින් අප වෙත පවරා දීමට අදාල ගැසට් පත්‍රය පලකිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යවා ඇත (මෙයට අදාල ලිපිය අමුණා ඇත). (ඇමුණුම 11)

(ආ) WPCR 0111 ජීප් රථය පවරා ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) සිදුකරන ලද අලුත්වැඩියාවන්
ආයතනයේ තාප්පය වැඩි දියුණු කිරීම සිදුකරනු ලැබුනේ ආරක්ෂ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයකට අනුවය. එම කාර්ය දින කිහිපයකින් සිදුකර ගත යුතු වූ අතර එය කඩිනම් කටයුත්තක් බැවින් මෙසේ මිල ගණන් ලබාගෙන සිදුකිරීම සිදුවිය. (මෙය දින කිහිපයකින් නිමා කිරීමට සිදුවූ කාර්යයකි)

* අනෙකුත් කාර්යයන් සඳහා මෙම ආයතන මගින්ද මිල ගණන් ලබා ගන්නා ලද්දේ මුලින් යෙදවූ තාප්පය අළුත්වැඩියා කටයුතු ඉතාමත් හොඳින් සහ පිළිවෙලට එම ආයතන මගින් ඉටුකරන ලද අතර නියමිත කාලය තුළ වැඩ අවසන් කර දීමට ඔවුන් සමත් වීමත් අප ආයතනයට අවශ්‍ය පරිදි කාර්යයන් ඉතා හොඳින් ඉටු කරදීම නිසා අනෙකුත් කාර්යයන් සඳහාද ඔවුන්ගෙන් සහ වෙනත් ආයතන වලින් මිල ගණන් ලබා ගන්නා ලදී.

(ආ) ලැප්ටොප් පරිගණක 03 ක් මිලදී ගැනීම

ආයතනයේ එවකට සිදුඅ කරනු ලැබුනු ව්‍යාපෘති සහ ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතුවල දැඩි අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන ලැප්ටොප් පරිගණක 03 ක්

ඉතා ඉක්මනින් මිලදී ගැනීමට අධ්‍යක්ෂතුමන්ගේ අනුමැතියට යටත්ව කටයුතු කරන ලදී.

මිල ගණන් විවෘත කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටු නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව සිදුකළ යුතු වුවත් එම නිලධාරීන්ගේ අධික කාර්යබහුලත්වය හේතුකොට ගෙන යම් අවස්ථාවන්හිදී අදාල මිල ගණන් විවෘත කිරීම සඳහා කමිටු නිලධාරීන්ට සහභාගී වීමට නොහැකි වේ. නමුත් එවන් අවස්ථාවන්හිදී සැපයුම් බාරව කටයුතු කරනු ලබන නිලධාරී ඉදිරියේ විෂය ලිපිකරු විසින් නියමිත වේලාවට අදාල විවෘත කිරීම් සිදු කිරීමට දැනුම් දී ඇත.

ලැප්ටොප් පරිගණක 03ක් මිලදී ගැනීම සඳහා කැඳවනු ලැබූ මිල ගණන් විවෘත කිරීමේදී එදින කිසිදු ලංසුකරුවකුගේ සහභාගීත්වයක් සිදු නොවුනු අතර අදාළ විවෘත කිරීම නියමිත දින දින මුද්‍රා සහිතව පරිපාලන නිලධාරීන්ගේ අනු දැනුම ඇතිව සිදු කිරීමට කටයුතු කරන ලදී.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

පර්යේෂණ නිලධාරිනී සාගරිකා හිටිහාමු මියට 2012.09.13 දින ආයතනයට වාර්තා කරන ලෙසට ලිඛිතව දන්වා ඇත. (ඇමුණුම 12).

2012.04.20 දින ආයතනයට වාර්තා කරන ලෙසට රියදුරු ඒ.එම්.ඩී.එම්.තෙන්නකෝන් මයාට දන්වා ඇත. (ඇමුණුම 13).

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2011 ජූලි 13 දිනැති අංක DMS/E/1/14/7/118/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අනුමත කිරීමේ ලිපිය අනුව කළමනාකරණ සහකාර තනතුර සඳහා පැරණි බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව 2011 ජූනි 30 දක්වා පැවති පුරප්පාඩු 21 පමණක් සම්පූර්ණ කර ඇත.

2011 වර්ෂයේ උතුරු නැගෙනහිර ප්‍රමුඛ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වූ ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් හේතුවෙන් එම කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා කාර්ය පවරා ඉටුකර ගැනීමේ පදනම මත රියදුරන් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඉන් සිව් දෙනෙකු වසරකට වැඩි කාලයක් ඉතා කාර්යක්ෂමව හා සතුටුදායක ලෙස ආයතනයට සේවය කිරීම හේතුවෙන් නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

119

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට කාර්ය පවරා ඉටුකර ගැනීමේ පදනම මත සේවකයින් දෙදෙනෙක් බඳවා ගෙන තිබුණි. ඔවුන්ගේ සේවා කාලය වසරකට අධික වීමත්, සතුටුදායක ලෙස සේවය ඉටු කිරීමත් නිසා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව බඳවා ගන්නා ලදී.

සංඛ්‍යාන නිලධාරී තනතුර සඳහා මෙතෙක් බඳවා ගැනීමේ කටයුතු සිදුකර නොමැත.

පර්යේෂණ නිලධාරී තනතුර සඳහා 2011 ජූනි 30 දක්වා පැවති පුරප්පාඩු සඳහා පැරණි බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාර විධිමත් කාර්ය පරිපාටියකට යටත්ව නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගෙන ඇත.

2011 අගෝස්තු 24 දිනැති අංක 2/1/3/2/35 දරණ ලිපිය ආයතනය වෙත ලැබෙන අවස්ථාව වන විට එදින පෙරවරුවේ ගරු අමාත්‍යතුමා අතින් ස්ථිර සේවා පත්වීම් ලබා දී අවසන් ව තිබිණි. තවද, ඒ වන විට අදාළ තොරතුරු 2011 අගෝස්තු 18,19 දිනැති ලිපිවලින් සහ 2011 අගෝස්තු 24 දිනැති ලිපියෙන් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කොට තිබුණි.

- පුරප්පාඩු පිරවීමේදී කළමනාකරණ සහකාර තනතුරු සඳහා පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීම ක්‍රමවේදය වුව ද, ඒ වන විට ආයතනයේ කාර්ය පවරා ඉටුකර ගැනීමේ පදනම මත සේවය කරමින් සිටි සේවකයින් ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් විමට සළකා බැලීම සඳහා පැරණි බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය අනුව විභාගයක් පැවැත්වීම සඳහා 2011 අගෝස්තු 17 දින පාලක මණ්ඩල අනුමැතියට සංදේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, සියළුම කාර්ය පවරා ඉටුකර ගැනීමේ පදනම මත බඳවා ගත් කළමනාකරණ සහකාරවරුන්ගේ සුදුසුකම් හා සියළු විස්තර අමාත්‍යාංශ ලේකම්තුමා වෙතට යොමු කරන ලෙස එහිදී තීරණය විය. 2011 අගෝස්තු 18 දින සහ 2011 අගෝස්තු 24 දිනැති ලිපි මගින් අදාළ තොරතුරු අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කරන ලදී. ඒ අනුව 2011.09.09 දිනැති අංක 2/1/15/2/17-(1) දරණ ලිපිය මගින් විධිමත් කාර්ය පරිපාටියකට යටත්ව බඳවා ගැනීම් අනුමත කරන බව දන්වා ඇත.

  පැරණි බඳවා ගැනීමේ පරිපාටියට අනුව ගබඩා භාරකරු තනතුර සඳහා මේ වන තෙක් බඳවා ගැනීම් සිදු කර නොමැත.

- බඳවා ගෙන ඇති සියළුම රියදුරන් අදාළ සුදුසුකම් සපුරා ඇති අතර, අදාළ තහවුරු කිරීමේ ලිපි, ගොනුවට ඇතුළත් කිරීම සඳහා විෂය භාර ලිපිකරුට උපදෙස් දී ඇත.

120

- කාර්යාල නඩත්තු සහායක තනතුර සඳහා අයදුම්කරුවන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත. අදාළ පැරණි බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම 8 වසර සමත් වීම වුවද, මොවුන් දෙදෙනාම අ.පො.ස. (උ.පෙළ)ට පෙනී සිට ඇති අතර ඉන් එක් අයදුම්කරුවකු විෂයයන් තුනම සමත් වී ඇති අතර අනෙක් අයදුම්කරු අ.පො.ස.(සා.පෙළ) ගණිතය හා ඉංග්‍රීසි සම්මාන සහිතව (උ.පෙළ) විෂයයන් දෙකක් සමත් වී ඇත. ඒ අනුව ඔවුන්ගේ වසරක සතුටුදායක සේවා කාලය සලකා බලා ස්ථිර සේවයට බඳවා ගන්නා ලදී.

- කාර්ය පවරා ඉටුකර ගැනීමේ පදනම මත බඳවා ගත් කාර්යාල වතු කම්කරුවන් ආයතනයේ අවශ්‍යතාවය මත සුදුසුකම් පරීක්ෂා කර ඉන් සුදුසු පුද්ගලයින් පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව බඳවා ගෙන ඇත.

එන්.එස්.වික්‍රමාරච්චි මයා හට ලබා දී ඇත්තේ කළමනාකරණ සහකාර (III) ශ්‍රේණිය තනතුරකි. ගබඩා භාරකරු තනතුරේ රාජකාරී කටයුතු ඉටු කිරීමට දැනට පවරා ඇත.

එච්.ආර්.කුමානායක මෙනවිය අ.පො.ස. (සා.පෙළ) 2008 වර්ෂයේ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ඇත. ඒ වන විට ඇයගේ පුද්ගලික ලිපි ගොනුවට අදාළ තහවුරු කිරීමේ සහතික පත්‍රය ඇතුළත් නොවී තිබුණු අතර එය දැනට ඇතුළත් කර ඇත.

බී.එම්.ටී. සමීර මයා අ.පො.ස.(උ.පෙළ) 2004 වර්ෂයේ විෂයයන් තුනම සමත් වී ඇත. අදාළ තහවුරු කිරීමේ සහතික පත්‍රය ඒ වන විට පුද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් වී තිබුණි.

(ආ) (i) කාර්ය පවරා ඉටු කර ගැනීමේ පදනම මත 2011.05.27 දින සිට සහකාර ලේඛකාධිකාරී (වැඩ සටහන්) තනතුරෙහි වැඩ බැලීම සඳහා චන්ද්‍රිකා දහනායක මහත්මිය පත්කර තිබූ අතර 2012.05.23 දිනෙන් පැවැති 320 වැනි පාලක මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. (ඇමුණුම 13)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩී.ඒ.බී.එන්. අමරසේකර මිය එම තනතුරට බඳවා ගැනීමේ කටයුතු සිදුකර ඇත්තේ පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිවය.

(ii) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සේවයේ නිරත වී සිටින අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2011 සැප්තැම්බර් සිට සේවයේ නිරත නොවේ.

05. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ආයතනය පිහිටවූ පනතට අනුව පුරප්පාඩු පවතින ක්ෂේත්‍රයන් නියෝජනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරදෙන ලෙසට 2011.06.30 න් ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති අතර, 26.04.2012 දින වන විට ආහාර හා කෘෂිකර්ම සංවිධානය නියෝජනය කිරීම සඳහා නිලධාරියෙකු නම් කර එවා ඇත. ඉතිරි පුරප්පාඩු පිරවීම ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් තබා ගන්නා ලදී.

5.2 අයවැය ලේඛන පාලනය

හැකි සෑමවිටම සත්‍ය වියදම අයවැයගත වියදම සමඟ පාලනය කිරීමට ආයතනය කටයුතු කරනු ලැබේ. නමුත් ඇතැම් අවස්ථාවලදී නොවැලැක්විය හැකි හේතු මත මෙසේ සත්‍ය වියදම අයවැයගත වියදම ඉක්මවීම සහ ඉක්මනොවීම නිසා වසර තුළදී නැවත වරක් පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. පද්ධති හා පාලනය

i. සේවක කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අනුමත කරගත් බඳවා ගැනීමේ පටිපාටියට අනුව, සේවකයින් බඳවා ගැනීමට උපදෙස් දී ඇති අතර සියළුම බඳවා ගැනීම් පාලක මණ්ඩලය වෙත යොමුකිරීමටද උපදෙස් දී ඇත.

ii. අත්තිකාරම් ගෙවීම

අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම් 2004 වර්ෂයේ සිට දැඩි සුපරීක්ෂණයට ලක් වී ඇති අතර එම වර්ෂයේ සිට නිරවුල් නොවූ අත්තිකාරම් නොමැත. 2004 වර්ෂයට පෙර වර්ෂවල තිබූ අත්තිකාරම් පාලක මණ්ඩලය අනුමැතිය සහිතව කපාහැර ඇත.එසේම කලින් ලබාගත් අත්තිකාරම් නිරවුල් කළ පසු නැවත අත්තිකාරමක් ලබා දෙන අතර දින 03ක් ඉක්මවූ අත්තිකාරම් සඳහා සාධාරණ හේතුවක් නොමැති නම් දඩ පොළී අය කිරීමක් සිදු කෙරේ.

iii. ණය අයකර ගැනීම

ණය ගොනු යාවත්කාලීන කරන ලෙසට උපදෙස් දී ඇත.

ණය ලබා දීමේදී ආයතන අංශය සහ ගිණුම් අංශය අතර නිවැරදි සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා දැනටමත් අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, ලබා දුන් නිවැරදි ණය මුදල් චෙක්පත් අංකය, දිනය අත්සන්

වැනි තොරතුරු ඇතුලත් වවුචරයේ අනු පිටපතක් ණය ගොනුමට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.

නිලධාරියෙකු සේවයෙන් ඉවත්ව යාමේ දී අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් ලබා දියහැකි සියලුම තොරතුරු විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී ද සම්පූර්ණ විස්තර ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

2009 වර්ෂයේ සිට ඉවත් වූ නිලධාරීන්ගෙන් නොගෙවූ ණය ශේෂ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, දැනටමත් සියලු ණය ශේෂ අයකර ගෙන ඇත.

2010-01-01 දින සිට ණය ලේඛනයෙහි නිවැරදි ණය ශේෂය වර්ගීකරණය කර ඇත.

ආයතනය සහ ණයකරු අතර ණය ලබා ගැනීම, සම්බන්ධයෙන් වූ ගිවිස්නාවේ ඇතුලත් වන එක් එක් කරුණු, වට්ටකම් දින සම්බන්ධයෙන් වූ එකගතාවයන් සඳහා වන සියලුම සම්පූර්ණ කරන ලද හිස්තැන් වෙනුවෙන් දෙපර්ශවයේ කෙටි අත්සන් යෙදීමට විෂයභාර නිලධාරියාට උපදෙස් දී ඇති අතර, වර්තමානයේ දී එය ක්‍රියාත්මක වේ.

iv. ඉදිකිරීම්

වර්තමානයේදී මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් වශයෙන් රු.20,000.00 ක් පමණක් ගෙවීමට කටයුතු කරනු ලැබේ. නමුත් පුහුණු කිරීමේ කටයුතු කරන අවස්ථාවේදී රු.20,000.00 ඉක්මවා කටයුතු කිරීමට අවශ්‍ය අවස්ථාවලදී රේඛීය අමාත්‍යාංශය මඟින් විශේෂ අනුමැතියක් භාණ්ඩාගාරයෙන් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇත.